



දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
தினமின

ශ්‍රී බුඩ වර්ෂ 2564ක් වූ බක් පුර විසේනිය ලත් කිවි දින | කාණ්ඩය 112 | පත්‍රය 102 | පිටු 20 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 16 සිකුරාදා

## අධිවේගවලින් කෝටි 3ක ආදායමක්

සුභාෂිණී සේනානායක සහ ක්‍රිසන්ති විතාරණ

අවුරුදු කාල සීමාවේ ඉකුත් දින 4කදී අධිවේගී මාර්ගවලින් රුපියල් මිලියන 135කට අධික ආදායමක් උපයාගෙන තිබේ.

අවරුදු දින සිට ඉදිරි දින දෙකක කාලය තුළ ඉහළ ආදායමක් ලැබෙනු ඇති බවත් අධිවේග මාර්ගවල මෙහෙයුම් සහ නඩත්තු අංශ පවසයි. පිට 06

# අලුත් අවුරුදු ට මහ මඟ අනතුරු 121යි

## 14ක් මරුට 74කට තුවාල

සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත

සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනයේදී (14) අධිවේගී මාර්ගයේ සහ අනෙකුත් මාර්ගවල රිය අනතුරු 121ක් පමණ සිදුව තිබෙන අතර, ඒ අනතුරුවලින් මේ වන විට 14 දෙනකු මිය ගොස් 74 දෙනකු තුවාල ලබා තිබේ.

මෙයින් මරණ 10ක්ම වාර්තා වන්නේ පෙරේදා (13) පැය විසි හතරක කාලය තුළ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

පිට 06



# පන්දහස දෙන්න රු. කෝටි 1,500ක්



## පවුල් ලක්ෂ 30කට සහන

සමන්මලී ප්‍රියශාන්ති

අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 30කට සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් රුපියල් 5000 දීමනාව ගෙවීම සඳහා රජය රුපියල් කෝටි 1,500ක් වැය කර තිබේ. ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාව තුරන් කිරීමේ ජනාධිපති කාර්යසාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතාගේ ඉල්ලීමක් අනුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ උපදෙස් මත මේ විශේෂ අලුත් අවුරුදු දීමනාව ගෙවීමේ කටයුතු අප්‍රේල් මස 11 වැනිදා ආරම්භ කෙරිණි.

පිට 06


# අන්තවාදී සංවිධාන 11ක් තහනම් කිරීමේ ගැසට්ටුව නිකුත් කෙරේ

පිට 6

නීතිය කැඩුවොත් වසර 20ක් හිරේ

පිට 6

### ගෙවුණු පැය 240 බීමත් රියැදුරන් 758ක් අත්අඩංගුවට



පිට 6

### රන්ජන්ගේ යුක්තිය උදෙසා සියලු දේ කරනවා



## අලුත් අවුරුදු රුක් රෝපණ නැකැත අදයි

### අගමැතිගෙන් පරිසර ඇමැතිට සඳුන් පැළයක්

බුද්ධිකා ඉඹුලාන




අලුත් අවුරුදු ජාතික රුක් රෝපණ නැකත අද (16) පෙරවරු 6.40ට (නැගෙනහිර බලා) යෙදී තිබේ. මේ දුර්ලභ නැකැත සිංහල හා දෙමළ අලුත් අවුරුදු නැකැත් සීට්ටුව සැකසීමේ විද්වත් කමිටුව විසින් අවුරුදු නැකැත් සීට්ටුවට ඇතුළත් කර ඇත.

අදට (16) යෙදෙන පැළ සිටුවීමේ නැකැතට රෝපණය කිරීමට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් පරිසර ඇමැති මහින්ද අමරවීර මහතාට සුදු සඳුන් පැළයක්, කාල්ටන් නිවෙසේදී ඊයේ (15) ප්‍රදානය කරන ලදි.

පිට 06

## අට හැවිරිදි අයියා පැදවූ යතුරුපැදියට යට වී අවු:1 1/2 නැගණිය මරුට

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

යාපනයේ මට්ටුවිල් ප්‍රදේශයේ අට හැවිරිදි දරුවකු සිය මවගේ යතුරු පැදිය මිදුලේ ධාවනය කරවීමේදී ඊට යට වූ අවුරුදු එකහමාරක ඔහුගේ නැගණිය පෙරේදා (14) සිද්ධිය වූ ස්ථානයේදීම මිය ගොස් තිබේ. පිට 06

### පෞද්ගලික බස් රියැදුරන් 80%ක් රිය පදවන්නේ මත් වෙලා



### ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය රනිල්ට

එජාපයෙන් ඒකමතික තීරණයක්



## වරාය නගර ආර්ථික කලාප කෙටුම්පතට එරෙහිව පෙත්සම් රැසක්

නෙල්කා මැදගෙදර

පාර්ලිමේන්තු අනුමැතිය ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති 'කොළඹ වරාය නගර ආර්ථික කලාප විශේෂ කොමිෂන් සභා පනත් කෙටුම්පත' ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි බවට තීන්දු කරන ලෙස ඉල්ලා එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, සිවිල් සංවිධාන ඇතුළු පාර්ශ්ව කිහිපයක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඊයේ (15) පෙත්සම් කිහිපයක් ඉදිරිපත් කර තිබේ. පිට 06

## පෙත්සම් සලකා බැලීමට විනිසුරු මඬුල්ලක්

නෙල්කා මැදගෙදර

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන 'කොළඹ වරාය නගර ආර්ථික කලාප විශේෂ කොමිසම් සභා පනත් කෙටුම්පතට' එරෙහිව ගොනු කර ඇති පෙත්සම් සලකා බැලීමට පංච පුද්ගල විනිසුරු මඬුල්ලක් නම් කර තිබේ. පිට 06

## මිනිස් ජාවාරම් මඬින්න ඕස්ට්‍රේලියාවෙන් ඩ්‍රෝන යානා 5ක්

පිට 06



## හදිසි අනතුරු නිසා 309 දෙනෙක් ජාතික රෝහලේ

සුභාෂිණී සේනානායක

අලුත් අවුරුදු දින (14) සහ පෙර දිනයේ (13) වූ හදිසි අනතුරුවලින් තුවාල ලැබූ 309 දෙනෙක් කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ඇත. පිට 06

## අවුරුදු ගනුදෙනුවලින් මැදවච්චිය ග්‍රාමීය බැංකුවලට කෝටි 27ක තැන්පතු ලැබිලා

හිඳෝගම සමූහ



මැදවච්චිය විවිධ සේවා සමුපකාර සමිතිය යටතේ ක්‍රියාත්මක කරන ග්‍රාමීය බැංකු 14ක් මගින් මෙවර අලුත් අවුරුද්දේ ගනුදෙනු කිරීමේ නැකතේදී රුපියල් කෝටි 27කට වඩා වැඩි තැන්පතු ප්‍රමාණයක් හිමි කර ගැනීමට සමත් වී තිබේ. පිට 06

## වේලි ඔයේ නාන්න ගිය පිය පුතු අතුරුදන්

බුද්ධි කරුණාරත්න

හල්ලුම්මුල්ල, කළුපහන පාලම් දෙක අතර වේලි ඔයේ දිය නෑමට ගිය එකම පවුලේ සිව් දෙනකුගෙන් දෙදෙනකු දියේ ගසා ගෙන ගොස් අතුරුදන්ව තිබේ.

මෙසේ අතුරුදන් වී ඇත්තේ එකම පවුලේ පියා සහ පුතකු බව හෙළිව තිබෙන අතර, ප්‍රදේශවාසීන් විසින් මේ අය අතරින් දෙදෙනකු මුදා ගෙන තිබේ.

මහරගම, පමුණුව ප්‍රදේශයේ පිරිසක් ඊයේ (15) දහවල් වේලි ඔයේ දිය නෑම සඳහා ගොස් සිටියදී මේ අනතුර සිදුව තිබේ.

පිට 06

## දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන ගේන්න ආණ්ඩුවේ අවධානය

සුභාෂිණී සේනානායක

පවතින දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන එක් කිරීමට රජයේ අවධානය යොමුව තිබේ. පිට 06

## අද සවස ප්‍රදේශ රැසකට ගිගුරුම් සහිත වැසි

බුද්ධි කරුණාරත්න

අද (16) සවස් භාගයේ හෝ රාත්‍රි කාලයේ දිවයිනේ බොහෝ ප්‍රදේශවල ස්ථාන රැසක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවසයි.

නැගෙනහිර සහ ඌව පළාත්වල හා පොළොන්නරුව සහ මුලතිව් දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශවල මිලිමීටර් 75ට වැඩි දැඩි වර්ෂාපතනයක් අපේක්ෂා කළ හැකිය.

පිට 06

## කාටවත් මේකට නම් ඉඩ දෙන්නේ නෑ:
# මේ රට චීන කොලනියක් කිරීමට එරෙහිව 15 වන නඩුවත් දැම්මා
### අභයාරාමාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

**සුභාෂිණී සේනානායක**

ශ්‍රී ලංකාව චීන කොලනියක් කිරීමට ඉඩ නොදෙන බවත් බස්නාහිර පළාතේ සිතියම පවා වෙනස් වන මේ කාර්යයට එරෙහිව 15 වන නඩුවත් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරූ බවත් නාරාහේන්පිට අභයාරාමාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියෝ ඊයේ (15) පැවැසූහ.

ආණ්ඩුව පෙරළන්න මේ දෙවල් සිදු නොකළ බව පෙන්වා දෙන උන්වහන්සේ රට ආරක්ෂා කිරීමත් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ සෞභාග්‍යයේ දැක්ම ඉදිරියට ගෙනයාමට අවශ්‍ය නම් රට රකින ජනහඩ වෙහෙසී ගෙනා ආණ්ඩුව සිදු කරන මේ දේවල් නවතා දමා සාකච්ඡා කළ යුතු බවත් පෙන්වා දුන්හ.

රට රකින ජනහඩ සංවිධානය දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා පාගමනින් නොයෙක් කටයුතු කරමින් මේ රජය බලයට පත් කරන්න වෙහෙසී කටයුතු කළ බවද අභයාරාමාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් කොළඹ වරාය නගරය සම්බන්ධයෙන් අභයාරාමයේදී පැවැති මාධ්‍ය හමුවට එක් වෙමින් ඊයේ (15) පැවැසූහ.

එම මාධ්‍ය හමුවට එක් වූ උන්වහන්සේ මෙසේද කීහ.

වත්මන් ආණ්ඩුව බලයට පත් කරන්න පැවිදි හඩ, මේ රටේ භික්ෂූන් වහන්සේ, මහජන සංවිධාන ඇතුළු පාර්ශ්ව රැසක් එක් වුණා. මේ ආණ්ඩුව බලයට පත් කරන්න මේ භික්ෂූන් වහන්සේ නොගිය තැනක් නෑ. පොහොට්ටුව කියන නම හැදුණෙත් අභයාරාමයෙන්. කවුරු කොහොම කතා කළත් අයිතිවාසිකම් ගන්න ආවත් ඒක කාටවත් ගන්න පුළුවන්කමක් නෑ. අභයාරාමයෙන් තමයි පොහොට්ටුව ගොඩ නැගුණේ. වර්තමාන පාලකයන් බිහි වුණේ. අද අපේ රටේ කෙළෙහිගුණ දක්වන්නේ නැහැ. යහපාලන ආණ්ඩුව මේ රටේ තිබූ දේශීය සම්පත් විකුණන්න හැදුව සෑම අවස්ථාවකම අපි විරුද්ධ වුණා. දේශීය සම්පත් සුරකීමේ සංවිධානයේ බෝඩ් එක තවමත් උඩ තිබෙනවා. රට වෙනත් මගක ගමන් කරන්න සූදානම් වන විට රටට ආදරේ අපි එක්ව කටයුතු කළා. මම නිජභූමිය කියා පත්තරයකුත් ගැහුවා. අපි කිසිම සම්පතක් විනාශ කරන්න දෙන්නේ නෑ. අද අලුත් මත අදහස් ඉදිරිපත් වෙනවා. අද චීන නගරය ගැන කතා කරනවා. අපේ මහ මුහුද ගොඩ කරමින් හදන ඒ නගරයට විරුද්ධ නෑ. එහෙත් අපේ ස්වාධීපත්‍යයට හානියක් වෙමින් චීන කොලනියක් කරන්න සූදානම් වෙනවා.

බස්නාහිර පළාතට ලොකුම අභියෝගයකට අපට මුහුණ දෙන්න සිදු වේවි. නාගරික සංවර්ධන අධිකාරි පනත, කොළඹ මහනාගර සභා ආඥා පනත, ශ්‍රී ලංකා වාණිජ සංවර්ධන ආඥා පනත, නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත ක්‍රමෝපාය සංවර්ධන ආංඥා පනත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත, කොන්ත්‍රාත් ගිවිසුම් පනත, දේශීය ආදායම් පනත ඇතුළු පනත් 14ක් එය මුදා හැරීම චීන කොළනියක් වීමට මාර්ගයක් බව පෙනී යනවා. අපි කිසිම දවසක රට විකුණන්න බදු දෙන්න අහිතකර ප්‍රතිපත්ති හදන්න පාලකයන්ට බලය දුන්නේ නෑ. හොර රහසේ ගිවිසුම් නොගහ සාකච්ඡා කරන්න පාලකයන්ට හැකියාවක් තිබ්බි. අපි මේවා කතා කරන විට ආණ්ඩුවට විරුද්ධයි කියනවා. අපි විරුද්ධ වුණොත් නැවත එන්නේ හිටපු අයම තමයි විරුද්ධ වෙන්න අපි විකල්පයක් හදන්න ඕනෑ. එහෙම කරලා අපි විරුද්ධ වෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ඉදිරියට ගෙනයන්න නම් මේ කරන දේවල් නවතා දමා සාකච්ඡා කළ යුතුයි. මෙවැනි කටයුතු කරනවා නම් රට රකින ජනහඩ නිහඩව ඉන්නේ නෑ. මේ විනාශකාරි දේවල් සිදු වුණොත් බලය ගන්න සහාය දුන්නා සේම කටයුතු සිදුවන බව පාලකයන් තේරුම් ගත යුතුයි.

## තුරු-මිතුරු රුක් රෝපණ ව්‍යාපෘතිය ඇරඹේ





ජාතික රුක් රෝපණ වැඩසටහනට සමගාමීව, 'විංග්ස් ලංකා පදනම (Wings Lanka Foundation)' මාතර, වැලිගමදී විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පිරිසක් සහභාගි කරවා ගෙන 'තුරු-මිතුරු' නමින් රුක් රෝපණ ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවා ඇත.

මෙම ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය, පසුගිය දා (10)මාතර, වැලිගම සුදර්ශනාරාම විහාරස්ථානයේදී, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පිරිසක් සහ ඔවුන්ගේ මව්පියන්ගේ සහභාගිත්වයෙන් පැවැති අවස්ථාවයි මේ.

ප්‍රථම වරට ජාතික රුක් රෝපණ වැඩසටහනට විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සහභාගි කරවා ගැනීම, ලාංකික ජන සමාජයට සුවිශේෂ මෙන්ම නවමු අත්දැකීමක් බව සංවිධායකයෝ පවසති.

# අවුරුද්දේ රැඳවූවකුට ගෙනා කලිසමේ පටියේ කුඩු සඟවාගෙන ඇවිත්
### බුද්ධි අංශ නිලධාරීන්ට අසු වෙයි

**බුද්ධිකා ඉඹුලාන**

අලුත් අවුරුද්ද වෙනුවෙන් පසුගිය 13-14 දෙදිනයන්හි රැඳවූවන්ට අමුත්තන් හමුවීමට දුන් අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් බන්ධනාගාරවලට තහනම් ද්‍රව්‍ය රැගෙන ඒමට දැරූ ප්‍රයත්න කීපයක් ව්‍යර්ථ කිරීමට බන්ධනාගාර බුද්ධි අංශ නිලධාරිහු සමත් වෙති.

නව මැගසින් බන්ධනාගාරයේ රඳවා සිටින සැකකරුවකු බැලීමට පසුගිය 13දා පැමිණි කාන්තාවක්, එම සැකකරුට දීමට ගෙනා කොට කලිසමක ඉණ වාටියේ සූක්ෂ්ම ලෙස සඟවාගෙන ආ හෙරොයින් ග්‍රෑම් 2 යි මිලිග්‍රෑම් 32ක ප්‍රමාණයක් බන්ධනාගාර බුද්ධි අංශයේ නිලධාරීන් විසින් වෙස්ලි මුරපොළේදී අත්අඩංගුවට ගෙන ඇත.අත්අඩංගුවට ගත් මේ තහනම් ද්‍රව්‍ය හා අදාළ සැකකාරිය වැඩිදුර පරීක්ෂණවලට බොරැල්ල පොලිසිය වෙත භාර දී තිබේ.

මෙදිනම ප.ව 4.00ට පමණ කළුතර බන්ධනාගාරයේ රක්ෂණ භාරයේ පසුවන බැරගමආරච්චිගේ අමිල නිරාද් ලාල් නොහොත් 'කරල්ලා' නැමැති රැඳවූවකු බැලීමට පිටතින් පැමිණි ජබුරලිය පාර මඩපාත යන ලිපිනයේ පදිංචි සාරංග ඩිල්සාන් නමැත්තකු ,'කරල්ලාට ' දීමට ගෙනා කමිසයක ඉතා සූක්ෂම අයුරින් සඟවා තිබූ හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම්1ක පමණ ප්‍රමාණයක් අමුත්තන් බලන ස්ථානයේ රාජකාරියේ යොදවා සිටි නිලධාරින් විසින් සෝදිසි කර අත්අඩංගුවට ගෙන තිබේ. එම මත්ද්‍රව්‍ය ගෙනා පුද්ගලයා සහ අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය ඉදිරි විමර්ශන කටයුතුවලට කළුතර උතුර පොලිස් ස්ථානයට භාරදීමට කටයුතු කර ඇති බව බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා කියයි.

එමෙන්ම වනාතමුල්ල ප්‍රදේශයේ සීමා තාප්පයට ඉහළින් විසිකළ තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සල් 03ක් හා සබන් කැබැල්ලක් වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා අංශයට ඉහළින් යොදා ඇති දැල් ආවරණය මතට වැටී තිබියදී බන්ධනාගාර නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර එහි ජංගම දුරකථන 06 ක් ජංගම දුරකථන බැටරි 06ක්,ජංගම දුරකථන චාජර් 04ක්, අයිස් මත් ද්‍රව්‍ය යැයි සැකකල හැකි පැකට් 01ක්,හෙරොයින් යැයි සැක කළ හැකි පැකට් 02ක් ,ගංජා පැකට් 02ක් ,බෙහෙත් කරල් 10ක් ද, සබන් කැබැල්ල තුළ දමා අසුරා තිබූ හෙරොයින් යැයි සැක කළහැකි පැකට් 05ක්ද තිබී ඇත.වැලිකඩ බන්ධනාගාර රෝහලටද වනාතමුල්ල ප්‍රදේශයෙන් ඇති සීමා තාප්පයට ඉහළින් විසිකරන ලද තහනම් ද්‍රව්‍ය පාර්සලයක්ද සොයා ගැනීමට මේ නිලධාරින් සමත් වී තිබේ. මේ පාර්සලයේ ගංජා යැයි සැක කළ හැකි පැකට් 10ක්,දුම්කොළ ඉරු 10ක් ,ගිනිපෙට්ටියක් ,මෙසේ අත්අඩංගුවට ගන්නා ලද පාර්සල් සියල්ලම හා සබන් කැබැල්ල වැඩිදුර විමර්ශන කටයුතුවලට බොරැල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇති බවද ඒකනායක මහතා පවසයි..



### මුල්ලේරියාව රෝහලේ නිරෝධායනය වන රෝගීන්ට අවුරුදු රස කැවිලි....

කොළඹ මුල්ලේරියාව රෝහලේ නිරෝධායනය වන රෝගීන්ට වෛද්‍ය අධ්‍යක්ෂ, වෛද්‍ය හෙද සියලුම කාර්ය මණ්ඩල එකතු වී පෙරේදා(14) අලුත් අවුරුදු උදාවත් සමග රෝගීන්ට කැවුම් කිරිබත් ඇතුළු කැවිලි වර්ග ඇතුළත් ආහාර පාර්සලයක් ලබාදීමට සූදානම් කළ අයුරු.

**ඡායාරූපය - සුලෝචන ගමගේ**

## මත්ද්‍රව්‍ය අපරාධ දැනුම් දීමට අලුතින් අංක කීපයක්

**සුභාෂිණී සේනානායක**

මහජනතාවට සුරා අපරාධ, මත්ද්‍රව්‍ය අපරාධ හා දුම්කොළ අපරාධ දැනුම්දීම පිණිස පැය 24 පුරා විවෘතව තබන ලද 1913 දුරකතන අංකය සහිත සුරාබදු මෙහෙයුම් මැදිරිය ලබන 23 වැනි දින දක්වා වසා තැබෙන බව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව කියා සිටියි.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අයත් රාජගිරිය, කෝට්ටේ පාර, අංක 353 ලිපිනයේ පිහිටි සුරාබදු මුලස්ථානයෙහි නිලධාරීන් කිහිප දෙනෙකුට කොවිඩ් 19 රෝගය වැළඳීම නිසාවෙන් සහ සුරාබදු මෙහෙයුම් මැදිරියෙහි කාර්යමණ්ඩලය එම ආසාදිත රෝගීන්ගේ පළමු පෙළ ආශ්‍රිතයන් වීම නිසාවෙන් එකී මෙහෙයුම් මැදිරිය දින 14ක් දක්වා වසා තැබෙන බව එම දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ප්‍රකාශක සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්) කපිල කුමාරසිංහ මහතා පැවැසීය. කාර්ය මණ්ඩලය ස්වයං නිරෝධායනය කිරීමට සෞඛ්‍ය අංශ විසින් දෙන ලද උපදෙස් අනුව සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් නියෝග කර ඇති බවත් ඒ අනුව මහජනතාවට සුරා අපරාධ, මත්ද්‍රව්‍ය අපරාධ හා දුම්කොළ අපරාධ දැනුම්දීම පිණිස පැය 24 පුරා විවෘතව තබන ලද 1913 දුරකතන අංකය සහිත සුරාබදු මෙහෙයුම් මැදිරිය වෙනුවට 071 6345291, 071 3108507, 071 8122333 දුරකථන මාර්ග විවෘතව තැබෙන බව ඒ මහතා දන්වා සිටියි.

## ආපනශාලා හිමියන්ගේ සංගමයේ ජාතික සංවිධායක 19 දා තෙක් රිමාන්ඩ්

**සුභාෂිණී සේනානායක**

පාරිභෝගික සේවා අධිකාරියේ සේවකයන්ගේ රාජකාරියට බාධා කිරීමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ආපනශාලා හිමියන්ගේ සංගමයේ ජාතික සංවිධායක අසේල සම්පත් මේ මස 19 වැනි දින දක්වා රිමාන්ඩ් භාරයට නියම කෙරිණි. කොම්පඤ්ඤවීදිය පොලිසිය විසින් අසේල සම්පත් පෙරේදා අත්අඩංගුවට ගෙන දහවල් කොළඹ අලුත්කඩේ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ නියෝගය සිදු කෙරිණි.

2019 වර්ෂයේ සිදු වූ මේ සිද්ධිය සම්බන්ධයෙන් කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් නිකුත් කර තිබූ විවෘත වරෙන්තුවකට අනුව අසේල සම්පත් ඔහුගේ නිවෙසේ දී අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට කොම්පඤ්ඤවීදිය පොලිසිය පියවර ගෙන තිබේ.

## චීන සංවර්ධන බැංකුවෙන් රුපියල් කෝටි 50ක ණය මුදලක් මෙරටට

**සුභාෂිණී සේනානායක**

චීන සංවර්ධන බැංකුවෙන් මෙරට රජය ඉල්ලා තිබූ රුපියල් මිලියන 500ක මුදල ඊයේ (15) මෙරටට ලැබී තිබේ. මෙය පසුගිය වසරේ මාර්තු මස 18 වැනි දින අත්සන් කරන ලද 2020 වසරට අදාළ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමේ කොටසක් වන අතර චීනය විසින් අදාළ ණය පහසුකම ලබා දී ඇත්තේ මෙරට සංවර්ධන අවශ්‍යතා සපුරාලීමට බව මුදල් අමාත්‍යාංශය පැවැසීය.

ශ්‍රී ලංකාව චීන සංවර්ධන බැංකුව සමඟ අමෙරිකානු ඩොලර් මිලියන 500ක ණය ගිවිසුමට ඉකුත්දා (12) අත්සන් කළ අතර කොළඹ පිහිටි චීන තනාපති කර්යාලයේ දී අදාළ ගිවිසුමට අත්සන් තබනු ලැබුවේ ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් චීනයේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය පාලිත කොහොන මහතාය.

බීජිං හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේදී අත්සන් තැබූ මේ ගිවිසුමට අනුව ලැබෙන අමෙරිකානු ඩොලර් මිලියන 500ක මුදල චීනය විසින් පසුගිය වසරේ දුන් අමෙරිකානු ඩොලර් බිලියනයේ ණය මුදලේ දෙවන වාරිකය වේ. මේ ණය ගිවිසුම මගින් රටට ගලා එන විදේශ විනිමය කොරෝනා වසංගතය හමුවේ මෙරට ආර්ථිකය සවිමත් කිරීමට රජය ගන්නා උත්සාහයට පිටිවහලක් විය හැකි බව ගිවිසුමට අත්සන් තැබීමෙන් පසුව බීජිංහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය නිකුත් කළ නිවේදනයේ සඳහන් කර තිබේ.

AROUND THE WORLD
ලොව වටා

## අමෙරිකානු හමුදා ඇෆ්ගනිස්තානයෙන් ඉවත් කිරීමේ තීරණයක්



අමෙරිකාවේ සදාකාලික යුද්ධය ලෙස හඳුන්වනු ලැබූ අල් කයිඩා ත්‍රස්තවාදීන් සහ අමෙරිකාව අතර දශක දෙකක යුද ගැටුම් නිමාවට පත් කරමින් ඇෆ්ගනිස්තානයෙන් අමෙරිකානු හමුදා ඉවත් කරගැනීමට ජනාධිපති ජෝ බයිඩන් තීරණය කර ඇත. වසර 2001 සැප්තැම්බර් 11 වැනිදා නිව්යෝර්ක් නුවරට අල් කයිඩා ත්‍රස්ත ප්‍රහාරය එල්ල වීමෙන් පසු මේ දක්වා අමෙරිකානු ජන ජීවිත 2,400ක් සහ මුදලින් ඩොලර් ට්‍රිලියනයකට වැඩි ප්‍රමාණයක් මේ යුද ගැටුමට වැය වී තිබිණි.

"අමෙරිකාවේ දීර්ඝතම යුද්ධය අවසන් කිරීමට කාලය මෙයයි" යැයි ධවල මන්දිරයේ පැවති දේශනයකදී බයිඩන් පැවසීය.

"මම දැන් ඇෆ්ගනිස්තානයේ අමෙරිකානු හමුදා හටයන්ගේ මුලසුන හොබවන සිව්වන අමෙරිකානු ජනාධිපතිවරයා වෙමි. රිපබ්ලිකානුවෝ දෙදෙනෙක්, ඩිමොක්‍රටිකයෝ දෙදෙනෙක් මීට පෙර මේ වගකීම දැරුවා. මම මේ වගකීම පස්වැන්නකුට පවරන්නේ නැහැ.' ඔහු වැඩිදුරටත් එසේ කීය.

2009 සිට ඇෆ්ගනිස්තාන සිවිල් වැසියන් 38,500කට වැඩි පිරිසක් මියගොස් ඇති අතර, අවම වශයෙන් පුද්ගලයන් 72,300ක් වත් තුවාල ලබා ඇත. ඇෆ්ගනිස්තාන ජනාධිපති අෂ්රෆ් ඝානි පවසා ඇත්තේ 2014 සිට 2020 දක්වා කාලය තුළ අවම වශයෙන් ඇෆ්ගනිස්තාන ආරක්ෂක හටයන් 48,000 ක් මිය ගොස් ඇති බවය. අමෙරිකානු හමුදා ඉවත් කිරීමේ ක්‍රියාවලිය මැයි 1 වැනිදා ආරම්භ කිරීමට බයිඩන් තීරණය කර ඇත.

## බහුපාර්ශ්වික ගුවන් අභ්‍යාස මාලාවක් ලබන මස එමිරේට්ස්හිදී



එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඉන්දියාව අතර ආරක්ෂක කටයුතු සම්බන්ධතා පුළුල් කිරීමේ අරමුණින් මැයි මස 4 වැනිදා සිට 27 දක්වා කාලයේ එරට අල් ධෆ්රා ගුවන් හමුදා කඳවුරේදී ගුවන් අභ්‍යාසමාලාවක් සිදු කිරීමට නියමිතය.

හය වැනි වරටත් සිදු කෙරෙන මේ බහුපාර්ශ්වික ගුවන් අභ්‍යාසමාලාව Desert Flag-VI නමින් හඳුන්වන අතර, ඊට අමෙරිකාව සහ ප්‍රංසය ද, ගල්ෆ් රටවල් වන සවුදි අරාබිය සහ බහරේනය ද එක්වනු ඇත. එම කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ජෝර්දානය, ග්‍රීසිය, කටාර් රාජ්‍යය, ඊජිප්තුව සහ දකුණු කොරියාව රටවල් නියෝජනය කරමින් බලධාරිහු සහභාගි වෙති.

සාම්ප්‍රදායික හැකියාවන් මුවහත් කරගැනීම හා එම රටවල් අතර සම්බන්ධතා වර්ධනය කරමින් අන්තර් ක්‍රියාකාරීත්වය ඉහළ දැමීම මේ අභ්‍යාසමාලාවේ අරමුණ වී තිබේ.

## කෘෂිකාර්මික නවීකරණයට එක් වන්නැයි ඉන්දීය අගමැති ජනතාවගෙන් ඉල්ලයි



ගොවීන් තම ආදායම ඉහළ නංවාලීම උදෙසා සම්ප්‍රදායික ගොවිතැන සමඟ නව විකල්ප අනුගමනය කළ යුතු බව කෘෂිකාර්මික ක්ෂේත්‍රය නවීකරණය කිරීමට වන තම රජයේ ඉල්ලීම යළි අවධාරණය කරමින් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි ප්‍රකාශ කළේය. එමෙන්ම කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වාගැනීම වෙනුවෙන් සෞඛ්‍ය අංශ නිකුත් කර ඇති මාර්ගෝපදේශ අනුගමනය කරමින් කොවිඩ් එන්නත ලබා ගන්නැයි ඔහු ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

එරට ගුවන් විදුලියෙන් සිය ජනතාව ඇමැතීමේ 'මාන් කී බාත්' වැඩසටහනේ 75 වැනි මාසික කතාව සිදු කරමින් ඉන්දීය අගමැතිවරයා මේ ඉල්ලීම කරනු ලැබුවේ පසුගිය වසරේ මධ්‍යම රජය විසින් ඉදිරිපත් කරනු ලැබූ නව කෘෂිකාර්මික නීති ත්‍රිත්වයකට එරෙහිව එරට ගොවීන් මාස ගණනාවක් පුරා සිදු කරමින් සිටින උද්ඝෝෂණයට මාස 4ක් පිරීම සැමරීමට 'භාරත් බැන්ඩ්' නමින් උත්සවයක් පවත්වා දින දෙකක් ගතවී තිබියදීය.

කෘෂිකාර්මාන්තයේ නවීකරණය කාලීන අවශ්‍යතාවක් බව පෙන්වා දුන් අගමැතිවරයා නව්‍යකරණය යනු ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකටම අත්‍යවශ්‍ය බවත්, කෘෂිකාර්මික අංශයේ රැකියා සඳහා නව අවස්ථා නිර්මාණය කිරීමට නව විකල්ප අනුගමනය කිරීමත්, සම්ප්‍රදායික ගොවිතැන සමඟ නව සොයා ගැනීමත් එක හා සමානව වැදගත් වන බව අවධාරණය කළේය.

## සීයාගේ මළගමට හැරී කුමරු එයි



රජ සම්පත් අතහැර සිය අමෙරිකානු බිරිය සමඟ කැලිෆෝනියාවට ගිය හැරී කුමරු පිලිප් කුමරුගේ අවමංගල උත්සවයට සහභාගිවීමට පළමුවරට යළි එංගලන්තයට පැමිණ සිටී. පෙරේදා කැලිෆෝනියාවෙන් ගුවන්ගත වූයේ හැරී කුමරු පමණි. සිය දෙවන දරු ප්‍රසූතිය සඳහා සූදානමින් සිටින මේගන් වෛද්‍ය උපදෙස් මත මේ අවමංගල උත්සවයට සහභාගි නොවේ.

පසුගිය වසරේ එක්තරා රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකදී මේගන් හා හැරී කුමරු රජ පවුලේ වරප්‍රසාද ප්‍රසිද්ධියේ දිග හැර දැමීමෙන් පසු යළි රජ පවුලේ සාමාජිකයන් මුහුණට මුහුණ මුණ ගැසෙන පළමු අවස්ථාව වන පිලිප් කුමරුගේ අවමංගල උත්සවයට එම සිදුවීම හේතුවෙන් දැඩි අවධානයක් යොමුවී තිබේ.

මේ තත්ත්වය මත අවමංගල උත්සවයේදී සිය පියා වන චාල්ස් කුමරු සහ වැඩිමල් සොහොයුරු විලියම් කුමරු මුණ ගැසීමෙන් වැළකී සිටීමට හැරී කුමරුට සිදු වනු ඇතැයි එංගලන්ත පුවත්පත් වාර්තා කර තිබිණි. එසේ වුවත් විලියම් සහ හැරී සොහොයුරන් අතර යළි සමඟිය වර්ධනය කිරීමට විලියම් කුමරුගේ බිරිය කේට් කුමරිය කටයුතු කරනු ඇතැයි ද වාර්තා වේ.



# නිරෝගිමත් අනාගතයක්

මුරුංගා ගුණය රටේ සැමටම

මුරුංගා ශාකයේ ඖෂධීය ගුණය සහ ආර්ථික වටිනාකම ජනගත කිරීමේ **ජීව තුරු උදනය**
ජාතික වැඩසටහනෙහි පළමු අදියර ලෙස මුරුංගා පැළ දස ලක්ෂයක් සිටුවීමේ දැවැන්ත ව්‍යාපෘතියෙහි
ප්‍රධාන උත්සවය ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ
මැති ඇමතිවරුන්ගේ, අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ, රාජ්‍ය නිලධාරීන්ගේ සහ ගම්වාසීන්ගේ
සහභාගීත්වයෙන් මොණරාගල මාලිගාවිල රාජමහ විහාරස්ථානයේදී

## අප්‍රේල් 17වන දින හිසතෙල් ගෑමේ නැකතට සමගාමීව පැවැත්වේ.

එයට සමගාමීව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් තෝරාගත් ප්‍රදේශවල
පන්සල් දෙදහස් පන්සියයක මෙම මුරුංගා පැළ නොමිලේ ලබාදීම එදිනම සිදු වේ.
නිරෝගිමත් අනාගතයක් වෙනුවෙන්, ආර්ථික අභිවෘද්ධිය වෙනුවෙන් අපිත් මුරුංගා සිටුවමු.

ව්‍යාපෘති සංකල්පය

**ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා**

උපදේශකත්වය

**ගරු කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා**

ව්‍යාපෘති ප්‍රධානත්වය

**කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් එල්. එල්. අනිල් විජේසිරි මහතා**

ව්‍යාපෘතියේ පාර්ශවකරුවන්

**කෘෂිකර්ම අමාත්‍යාංශය | කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය**
**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමයේ
අලුත් අවුරුදු දායකත්වය

AGRO·S
කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය
கமத்தொழில் இராஜாங்க அமைச்சு
State Ministry of Agriculture

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
Department of Agrarian Development

MANUSATH DERANA
මනුසත් දෙරණ

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 අප්‍රේල් 16 සිකුරාදා

# අලුත් අවුරුද්දේ - මහා පින්කම!

අලුත් අවුරුදු සමය තුළ රටේ සිදු වූ මහා පින්කම කුමක්දැ'යි කෙනකු විමසුවහොත්, ඊට ඍජු පිළිතුරක් තිබේ. එනම්, අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ තිහක් වෙත රුපියල් පන්දහසක දීමනාවක් දීමය. ශ්‍රී ලංකාව පාලනය කළ කිසිදු ආණ්ඩුවක් අවුරුදු සමයක් තුළ මෙබඳු තීරණයක් ගෙන මහජනයාට අස්වැසිල්ලක් සලසා දී නැත. මේ යෝජනාව රජයට ඉදිරිපත් කර ඇත්තේ දරිද්‍රතාව පිටුදැකීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බළකායේ සභාපතිවරයා වන බැසිල් රාජපක්ෂ මහතාය. ජනාධිපතිවරයා මෙන්ම අගමැතිවරයා ද එම යෝජනාව අනුමත කොට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ඇත. පසුගිය එකොළොස්වන දා මුදල් දීම ආරම්භ කළ අතර, ඊයේ වන විට පවුල් ලක්ෂ දොළහකට පන්දහසේ දීමනාව ලැබී තිබිණි.

අලුත් අවුරුද්ද යනු ඕනෑම පවුලක ප්‍රීතිමත් අවස්ථාවකි. අනාගතය සැලැසුම් කිරීම, පුද්ගල චර්යාවන් දියුණු කර ගැනීම, සමාජ සහයෝගිතාව ගොඩනැංවීම යන සාධක අලුත් අවුරුද්දේ අර්ථය ලෙස පවතී. ආසියානු රටවල සමාජයට අත්හැරිය නොහැකි අවස්ථාවක් ලෙස ද අලුත් අවුරුදු උත්සවය පවතී.

ගිය වසරේ අලුත් අවුරුද්ද කොවිඩ් වසංගතය නිසා කුටුම්භයට පමණක් සීමා විය. ඊට පෙර වසරේ පාස්කු ප්‍රහාරය නිසා අලුත් අවුරුදු ප්‍රීතිය ශෝකයක් බවට පෙරළිණි. මේ වසරේ අලුත් අවුරුද්ද සුවිශේෂ වන්නේ වසර දෙකකට පසු එහි සාංස්කෘතිමය හර පද්ධතිය සමඟ එක් වීමට ජනතාවට අවකාශ ලැබී තිබීමය. ඒ අනුව රට පුරා ජනතාව අවුරුද්ද සැමරීමට පෙළ ගැසී බලා උන්හ.

අපේ ජනතාව අතර පවතින කියමනක් වන්නේ සල්ලි ඇතොත් හැමදාම අවුරුදු යන්නය. බැලූ බැල්මට සරල කියමනක් සේ පෙනුණ ද එහි ගැඹුරු අර්ථයක් තිබේ. එනම්, මිල දී ගැනීමේ හැකියාව නැතිව අවුරුදු සමරන්නට බැරි බවය. අටුකොටු පිරී අත-මිට සරු වූ පිරිසක් අපට සිටිති. එලෙසම අමාරුවෙන් ජීවිතය ගැට ගසා ගන්නා පිරිසක් ද අපට සිටිති. දිළිඳුකම පිටුදැකීම සඳහා කුමන වැඩසටහන් ක්‍රියාත්මක වුව ද රටේ දිළිඳුභාවය ප්‍රමාණවත් අයුරින් අඩු වී නැත. කොවිඩ් වසංගත තත්ත්වය තුළ සැලැකිය යුතු පිරිසකගේ ආදායම් මාර්ග අවහිර වී ඇත. සුළු ව්‍යාපාරිකයන්, ස්වයං රැකියාලාභීන්, කුලී වැඩ කරන්නන් මේ තත්ත්වය මත වඩාත් අපහසුවට පත්ව සිටිති. එය මඟහැරී යන්නට තවත් කාලයක් ගත වනු ඇත.

රටේ දිළිඳුම පවුල් හඳුනාගත හැකි විද්‍යාත්මක ක්‍රමවේදයක් අපට තිබේ. සමෘද්ධිලාභීන්, වැඩිහිටි දීමනාව ලබන පවුල්, පින්පඩි ලබන අය, ආබාධිත දීමනා ලබන අය මෙන්ම කොවිඩ් සමය තුළ අභියාචනා ඉදිරිපත්කොට සහන දීමනා ලබාගත් කණ්ඩායම් ද මේ ගණයට වැටෙති. ඒ සියලු කණ්ඩායම් වෙත රුපියල් පන්දහසේ දීමනාව හිමිකරදෙන බව රජය කියයි. ඒ වෙනුවෙන් වෙන් කර ඇති මුදල රුපියල් කෝටි එක්දහස් පන්සියයක් බව ද කියති. ඇතැම් විට මේ සඳහා තවත් ප්‍රතිපාදන වෙන් කිරීමටත් සිදු වනු ඇත. කොවිඩ් තත්ත්වය තුළ මෙබඳු විශාල මුදලක් වැය කිරීම රජයට බරක් වුව ජනතාව වෙනුවෙන් සැලැකිල්ල යොමුකොට ඉහත වැඩසටහන ක්‍රියාත්මක කර තිබේ. ජනතාවාදී ආණ්ඩුවක් එබඳු දේවල් කළ යුතුය.

බොහෝ ප්‍රදේශවල ජනතාව ආණ්ඩුවට පින් දෙමින් රුපියල් පන්දහසේ දීමනාව රැගෙන යති. ඇතැමෙක් පන් දහසත් රැගෙන කෙළින්ම වෙළෙඳපොළට යති. සමහරු දරුවන්ට අලුත් ඇඳුම් මිලට ගනිති. අලුත් අවුරුද්ද බොහෝ අපේක්ෂාවන්ගෙන් පිරී පවතී. එය සැම පවුලකම ඇති පොදු තත්ත්වයකි. කමින් බොමින් අසල්වැසියා සමඟ සාමයෙන් කල් යැවීම අලුත් අවුරුද්දේ ඉලක්කය වෙයි. එහෙත් මීට අවශ්‍ය පසුබිම සකස් කරන්නේ මුදල්ය. නැතහොත් මිල දී ගැනීමේ හැකියාවය. රුපියල් පන්දහසකින් සියල්ල සම්පූර්ණ වන්නේ නැති බව සැබෑවකි. එහෙත් එය පවුලක අවුරුදු ප්‍රීතියට විශාල පිටුබලයක් සපයයි. අවම ලෙස අවුරුදු කෑමට අවශ්‍ය අඩුවැඩිය එම මුදලින් මිලට ගත හැකිය. එය දිළිඳු පවුලකට සහනයකි.

ආණ්ඩුව කොවිඩ් සමය තුළ දිළිඳුම පවුල් සඳහා රුපියල් පන්දහසේ දීමනාවක් දුන්නේය. එය වට කිහිපයක්ම ක්‍රියාත්මක විය. ලොව දියුණුම රටවල් පවා එබඳු සහන වැඩසටහන් කොවිඩ් සමයේ ක්‍රියාත්මක කර නැත. මේ වන විට ශ්‍රී ලංකාවේ කොවිඩ් තත්ත්වය කෙමෙන් අඩු වී යන අතර, ජන ජීවිතය සාමාන්‍ය තත්ත්වයට හැරී ඇත. බොහෝ පළාත්වල සෞඛ්‍ය නීති - රීති පිළිපදිමින් අවුරුදු උත්සව පැවැත්වෙයි. මේ සහනදායී තත්ත්වය උදා කිරීම සඳහා ආණ්ඩුව බලවත් පරිශ්‍රමයක් දරා ඇත. එය ජගත් සංවිධානවල ඇගයීමට ද ලක් වී ඇත. දකුණු ආසියාවේ හොඳම කොවිඩ් මර්දන වැඩසටහන ඇත්තේ ශ්‍රී ලංකාවේ යැයි කිවහොත් එය පුරාජේරුවක් නොවේ. මේ අතර ජනතාවට සහන සැපයීම අතින් ද ශ්‍රී ලංකාව පෙරමුණ ගෙන ඇත.

රට පාලනය කරන ඇත්තන්ගේ යුතුකම විය යුත්තේ ජනතාවගේ පැත්ත ගැන සැලකිල්ල යොමුකොට තීන්දු - තීරණ ගැනීමය. ආර්ථික ලාභ - පාඩු දෙකම මේ අනුව රජයක් දරා ගත යුතුය. පින් පඩි ලබාදීම, සහන සැලැසීම, දීමනා දීම රජයකට පාඩු ඇති කරන දේවල්ය. පන්දහසේ දීමනාව පවුල් ලක්ෂ තිහක් වෙත දීම සුළුපටු කාරණයක් නොවේ. බෙදා දෙන මුදල් රජයට ආපසු ලැබෙන්නේ නැත. ඒවා ආර්ථික ක්‍රියාවලියක් සඳහා යෙදෙවුවේ නම් ප්‍රතිලාභයක් අපේක්ෂා කළ හැකිය. එහෙත් ජනතාවාදී ආණ්ඩුවක් පොදු මහජනයාගේ සතුට හා සැනසීම ගැන අවධානය යොමු කළ යුතුය. ජනතාවාදී ආණ්ඩුවක් පවතින විට ජනතාවට තෘප්තිමත් ජීවිත ගත කළ හැකිය. රටේ නායකයා පත් වී ඇත්තේ වාර්තාගත ඡන්ද ප්‍රමාණයක් මතය. ජනතාවගේ එම තීන්දුව නිවැරැදි බව ලැබෙන සහනවලින් පෙනී යයි.

පන්දහසේ දීමනාව පමණක් නොව, අලුත් අවුරුද්දට තවත් සහන ගණනාවක් ලැබී තිබේ. සතොස ආයතනය දෙන සහන මල්ල ඒ අතර ප්‍රධාන වෙයි. එම සහන බඩු මල්ල මේ මාසය පුරාවටම දීමට වෙළෙඳ අමාත්‍යවරයා තීරණය කර තිබේ. මේ අලුත් අවුරුද්ද කාටවත් නරක නැත.

**දිල්රුගෙ සිව්පද**

| | |
|---|---|
| මහ පොලොවේ රැඳෙන දිය බිඳු | සුරකින්න |
| ගහ කොළකට පමණි හැකි පිහිටක් | වෙන්න |
| හෙටටත් සුවැති පරිසරයක් රැක | දෙන්න |
| නැකතක් ඇතත් නැතුවත් පැල | හිටවන්න |

# අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන ලෝක දැක්ම හා අප ගත යුතු මඟ



කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය ඒකකයේ හිටපු මහාචාර්ය
**අජන්තා හපුආරච්චි**

කොවිඩ් වසංගතයත් සමඟ ලෝකයේ ප්‍රධාන අවධානයට ලක් වී ඇත්තේ සෞඛ්‍ය පිළිබඳව වන අතර, දෙවන තැන ගෙන ඇත්තේ අධ්‍යාපනයයි. යුනෙස්කෝව විසින් හා අනෙකුත් රටවල් රැසක් මෙවැනි වසංගත හා එළඹිය හැකි උවදුරුවලින් ආරක්ෂාවීමට අධ්‍යාපනය නව මාවත්වලට ගෙනයාමට සැරසී ඇත. ඒ අතර, ඉන්දියාව වසර 34කට පසුව අධ්‍යාපනයේ මහා වෙනසක් ඇති කිරීමට කරුණු පෙළගස්වමින් සිටින අතර, පොදුවේ දැක ගත හැකි කරුණු රැසක් ද වේ. ඒවා අපේ අධ්‍යාපනයට එසේම ඇදා ගත යුතු නැති අතර, අපට ගැළපෙන අංශවලින් පෝෂණය වී අපේ අධ්‍යාපන ක්‍රමයේ ද ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව දැන් මතු වී ඇති අතර, රජය ද ඒ පිළිබඳව විශේෂ උනන්දුවක් දක්වන බව පෙනේ.

මෙතෙක් කලා, විද්‍යා, වාණිජ වශයෙන් පැවති විෂයයන් මිශ්‍ර ක්‍රමයක් ලෙස භාවිත කරන්නේ කෙසේදැයි යන්න ලෝකයේ බොහෝ රටවල් සොයා බලමින් ඒවා ඒ ඒ රටවලට අදාළ කරගන්නේ කෙසේදැයි යන්න දැඩි කතාබහකට ලක් වී ඇත. බොහෝ විට එකිනෙක සම්බන්ධවන විෂයන් සමීප කරමින් හැදෑරිය යුතු ආකාරය සාකච්ඡා වෙමින් පවතී. කොවිඩ් වසංගතයත් සමඟ යුනෙස්කෝව එක් එක් රටවල පවතින අවශ්‍යතා මත පාඨමාලා සකස්කර ගැනීමේ හැකියාව පෙන්වා දී තිබේ.

දැනට පවතින විශ්වවිද්‍යාල ප්‍රවේශය හා පාඨමාලා අවසන් කිරීමේ වෙනසක් ලෙස දැනට ඉන්දියාව සොයා බලන්නේ බහු ප්‍රවේශ ක්‍රමයන් හා බහු අවසන් ක්‍රමයනට අවතීර්ණ වීමේ ඇති හැකියාව කෙරෙහිය. විශේෂයෙන් උසස් අධ්‍යාපනයේ වෙනස්කම් ඒ අතර ප්‍රධාන වේ. විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ පොදු විභාගයක් කෙරෙහි අවධානය යොමුකර ඇති අතර, එය කෙතරම් ඵලදායකදැයි කිව නොහැක්කේ විෂයන් හා පාඨමාලා පවත්වාගෙන යන ක්‍රමයන් සමඟ ඒවා ගළපා ගැනීම කෙසේ කළ යුතු දැයි ප්‍රශ්නයක් ද පවතින බව පෙනේ. එසේම විශ්වවිද්‍යාලවල පැවැතියහැකි කාලීන ප්‍රශ්න හමුවේ ඒවා ඒකාකාරීව පවත්වාගෙන යාම පිළිබඳව උසස් අධ්‍යාපනයේ වෙනස්කම් මෙන්ම ලෝකයේ බොහෝ රටවල විවිධ යෝජනා හා ඒවා ක්‍රියාත්මක වන අන්දමත් කෙරෙහි එකම කාලයක අවශ්‍යතාවක් වී ඇත්තේ කොවිඩ් වසංගතය නිසා ලෝකයේ වඩාත්ම පහර වැදුණේ අධ්‍යාපන ක්‍රමයට බැවිණි.

## ■ ඔන්ලයින් භාවිතය

අධ්‍යාපනයේ වෙනස්කම්වලදී පරිගණක හා අන්තර්ජාල සේවා පිළිබඳ හැදෑරීම නව මාවතකට පැමිණ තිබේ. දැනට ගණන් බලා ඇති ආකාරයට මිලියන 70ක් පමණ ප්‍රමාණයක් බ්ලොග් අඩවි පවත්වාගෙන යාම අධ්‍යාපනයේ කොටසක් ලෙස social networking නමින් ඇතැම් රටවල පාඨමාලා තුළට පිවිස ඇත. එසේම ඕස්ට්‍රේලියාවේ දරුවන්ට Problem based learning යනුවෙන් අධ්‍යාපනයේ කොටසක් ලෙස හැදෑරීමට පටන්ගෙන ඇති අතර, එහිදී දරුවන්ට ගෝලීය ප්‍රශ්න හඳුන්වාදී ඒ පිළිබඳව පිළිතුරු සෙවීමට සැලැස්වීම මේ පාඨමාලාවේ අරමුණයි. එහිදී දරුවන්ට කුඩා කල පටන්ම ලෝකය පිළිබඳවත් ලෝක ප්‍රශ්න පිළිබඳවත් උගන්වනු ලැබේ. කොවිඩ් ප්‍රශ්නය ලෝකයට බලපෑමේදී වඩාත් අහිතකර තත්ත්වයක් ඇති වූයේ දරුවන්ට වීම එහි අරුතයි.

දරුවන්ට තරඟකාරී ලෙස තම දස්කම් පෙන්වීමට පවතින අධ්‍යාපන ක්‍රමවල ඇති ඌනතා මඟ හරිමින් competency learning යනුවෙන් ලෝකයේ බොහෝ රටවල විෂය නිර්දේශයන්ට ඇතුළත් කර ඇත්තේ හැකියා හැඳිනගැනීම කල්තියා හැඳිනගැනීමටත් ඒවා ඔස්සේ තවදුරටත් ගමන් කරවීමටත් හුරු කරවමිනි.

එසේම අධ්‍යාපන විෂයමාලාවල හැම දරුවෙකුටම ව්‍යාපෘති පිළිබඳ අවබෝධයක් ගැනීමට හැකියාවක් නොමැත. ඒ නිසා විෂයමාලාවන්ට අදාළව ලෝකයේ බොහෝ රටවල අද වන විට project based learning යනුවෙන් උගැන්වෙන්නට පටන්ගෙන ඇත. මෙය එක් එක් විෂය ගත හොත් ඉතාම වටිනා ඉගැන්වීම් ක්‍රමයකි. දරුවෙකුට නවතාවයෙන් සිතීමට මෙන්ම තම විෂයට අදාළව කිසියම් ව්‍යාපෘතියක් ඉදිරිපත් කිරීමෙන් දරුවන් ව්‍යවසායක මනසකින් යමක් දෙස බැලීමට හුරුවන බව අධ්‍යාපන විශාරදයින්ගේ මතයයි. ව්‍යාපෘතියක් යනු ඒකාකාරව හැම විෂයකටම එකසේ භාවිත කළ හැක්කක් නොවේ. මෙහි වඩාත්ම ප්‍රායෝගික වටිනාකම නම් කුඩා කාලයේ පටන්ම අධ්‍යාපනයට සමගාමීව ප්‍රායෝගිකත්වය අත්කරවීමයි.

ස්වයං සංවිධානය ලෙස self organized යනුවෙන් ද වෙනත් ආකාරයක ඉගැන්වීම් ක්‍රමයක් පිළිබඳව නව කියවීමක් ආරම්භ වී ඇත. එහි එක් අරුතක් නම් වත්මන් කොවිඩ් වසංගතය වැනි අවස්ථාවලදී අද දරුවන්ට ඉවසීම, විනය හා අවස්ථාවෝචිත හැඩගැස්ම මෙයින් එකතුකර ඇත. එසේම එහි තවත් පැත්තක් ලෙස එවැනි ප්‍රශ්නවලදී දරුවන්ගේ යෝජනා විශේෂ සොයාගැනීම් පිළිබඳව උනන්දු කරවීම මින් අදහස් කෙරේ.



මේ සැම අංශයක් කෙරෙහිම අවධානය යොමු වී ඇත්තේ ලෝකයේ අනාගතයට දරුවන් සූදානම් කරවීමයි. මෙය තවත් අතකට අනුගතවීමේ ක්‍රමයක් වශයෙන් Adaptive learning යනුවෙන් ද හැඳින්වේ. එසේම මේ ඉගැන්වීම් තවත් රටවල හඳුන්වන්නේ social status සමාජ තත්ත්වයක් වශයෙනි. දරුවකුගෙන් ගිලිහී ගිය කොටස් නැත හොත් ප්‍රායෝගික ජීවිතයට වඩාත් හිතකර පරිසරයක් සකස් කිරීම මෙයින් සිදු කෙරේ. මෙතෙක් අප ඉගැන්වීම් ක්‍රම අතර, ස්වයං සංකල්ප self concept යනුවෙන් සන්නිවේදන අධ්‍යයනයේ දී පමණක් ඉගැන්වේ.

## ■ අධ්‍යාපනයේ වෙනස්කම්

අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස්කම් අතර, ලෝකයම දැඩි අවධානයට යොමුකර ඇති මූලික කරුණක් වන්නේ ගුරුවරු වෙනස් කරවිය යුතු බවයි. දැනට ලෝකයේම ගුරුවරුන්ට මුහුණ දීමට ඇති මූලික ප්‍රශ්නයක් වනුයේ තාක්ෂණික දැනුම ලබා ගැනීමය. තාක්ෂණික මෙවලම් ගුරුවරුන්ට හිමිකරදීම පමණක් නොව, ඒ පිළිබඳ ගැඹුරු අවබෝධයක අවශ්‍යතාවයි. ශ්‍රී ලංකාවේ පසුගිය සමයේ ජාලගත ඉගැන්වීම් බොහෝසේ භාවිත විය. නමුත් එහිදී ඇති නැති පරතරය හා සිග්නල් ලබාගැනීම යන ප්‍රශ්න රටපුරාම අසන්නට ලැබිණි. ඇතැම් විභාගවලට විෂයමාලා සම්පූර්ණ නොකළ ද දරුවන්ට ඊට සහභාගිවිය යුතුව තිබිණි. මතුවට එවැනි ප්‍රශ්න ඇති නොවීමට සැම රජයකම ප්‍රධාන කරුණක් විය යුත්තේ ගුරුවරුන් කෙරෙහි පෙරට වඩා වෙනස් ආකාරයට ඔවුන් සකස් කළ යුතු වීමයි.

පසුගිය කාලයේ ඉතාම ජනප්‍රිය ඉගැන්වීම් ක්‍රමයක් වූයේ ජංගම දුරකතන මඟින් ඉගැන්වීමයි. එය තවදුරටත් පවත්වාගෙන යා යුතු බව ලෝකයේ බොහෝ රටවල් පිළිගෙන ඇති අතර, බටහිර රටවල බොහෝ පහසුකම් ඇති අතර, අනෙකුත් රටවල් ඒ පිළිබඳව වැඩි කැමැත්තක් නොදක්වයි. ඊට තවත් හේතුවක් වන්නේ වසංගත වැනි අවස්ථාවලදී භාවිත කළ ද දරුවන් හා ගුරුවරුන්ගේ සමීප සහභාගිත්වය වඩාත් ඇවැසි බව පෙන්වා දෙමිනි. මුහුණට මුහුණ හමුවී කෙරෙන ප්‍රතිචාර මෙන් නොව කෘත්‍රිම ප්‍රතිචාර ක්‍රමයක් ලෙස ගුරුවරු පෙන්වා දී ඇත. මෙතෙක් ඇතැම් රටවල ආගමික ඉගැන්වීම් අනිවාර්ය කර නැත. එසේම ඇතැම් රටවල ආගමික උගැන්වීම් වන්නේ උසස් අධ්‍යාපනයේ දී තෝරාගන්නා විෂයක් ලෙස උපාධියකට හෝ වෙනත් ඩිප්ලෝමාවකට හැදෑරීම සඳහා භාවිත වන විෂයක් වශයෙනි. නමුත් මානව පැවැත්ම තීරණාත්මක මොහොතකට පැමිණ ඇති අවස්ථාවක් වශයෙන් ලෝකයේ බොහෝ රටවල ආගමික උගැන්වීම් මතුකරමින් පාඨමාලාවල මූලික විෂයක් වශයෙන් උගැන්වීමේ අවශ්‍යතාව පෙන්වා දී තිබේ. මානව ජීවිතවලට ආධ්‍යාත්මික වශයෙන් ලැබිය යුතු පෝෂණය දහම් පාසැල් අධ්‍යාපනයට එහා ගිය තැනෙක පැවතිය යුතු බව මතු වී ඇති කරුණයි. Religious Moral යනුවෙන් ඇතැම් රටවල් විෂයමාලාවනට ඇතුලත් කර ඇත.

චරිතවත් බව පිළිබඳ අප කිසිදිනෙක විෂයමාලාවකින් දැක්කේ නැත. එය විවිධ විෂයන් යටතේ වෙන වෙනම වක්‍රාකාර ඉගැන්වීම් ක්‍රමයක් වූ අතර, බොහෝ දුරට දහම් අධ්‍යාපනයේ කොටසක් ලෙස දරුවන්ට හඳුනා ගත හැකි විය. එය character education යනුවෙන් විෂයමාලාවල අද වන විට දැක ගත හැකි අතර, එය දෙආකාරයකින් ඉගැන් වේ. එකක් නම් දරුවන්ට විවිධ රටවල මෙන්ම තම රටේ ආදර්ශමත් චරිත හඳුන්වා දීම පමණක් නොව ඒ චරිත පූජනීය හෝ ආදර්ශයට පත් වූ හේතු ඉගැන්වීම මෙයින් ඉටු කෙරේ. දැනට සන්නිවේදන පාඨමාලාවලදී කථන සන්නිවේදනය හෝ ඉදිරිපත්කිරීම් presentation සඳහා චරිත හැඳින්වීමේ ක්‍රමය මෙසේ විවිධාකාරයෙන් උගන්වන්නට බලාපොරොත්තු වන්නේ අනාගත පරපුර පැමිණෙන ඕනෑම දුෂ්කර ප්‍රශ්නයකදී කෙසේ කවුරුන් ලෙස කටයුතු කළ යුතු දැයි හැඳිනගැනීම පිණිසය.

## ■ වෙනස්කම්

එසේම ලෝකයේ රටවල අධ්‍යාපනයේ වෙනස් කිරීම්වලදී මෙතෙක් බොහෝ දුරට උසස් අධ්‍යාපනය තෝරාගත යුත්තේ තම ප්‍රතිඵල මත තිබීම වෙනුවට දරුවන්ට තෝරාගැනීමේ ක්‍රම කෙසේ සකස් කළයුතුදැයි යන්න ද කතාබහට ලක් වී තිබේ. බොහෝ දුරට රට රටවල පවතින අධ්‍යාපන ප්‍රතිපත්තිවලදී ප්‍රතිපත්ති මත සිදු කෙරෙන මේ තෝරාගැනීම් දරුවන්ගේ අකමැත්තෙන් සිදු වන අවස්ථා බොහෝ දුරට මින් අවම කිරීම මුඛ්‍යාර්ථයයි. එය blended education ලෙස නම් කර ඇත.

ඉහත දැක්වූ කරුණුවලින් පෙන්වා දීමට උත්සාහගෙන ඇත්තේ දැනට යුනෙස්කෝව හා ලෝකයේ විවිධ රටවල් අධ්‍යාපනයේ නවමං සොයා යන ආකාරය පෙන්නා දීමට මිස ඒවා අප ඒ අයුරින්ම අනුගමනය කළ යුතුයැයි කීමට නොවේ. එසේම අප මේ රටේ අනාගතය හා තිරසාර සංවර්ධනයට සමපාත වන අපේ බොහෝ දේ විෂයමාලාවලට ඇතුළත් කර ගනිමින් විෂයමාලා සකස්කර ගත යුතු බැවිනි. දැනුම, කුසලතා හා ආකල්ප ලෙස අප වර්ගීකරණය කර ඇතත් කුසලතා හා ආකල්ප වලින් විෂයමාලා ඔස්සේ දරුවන්ට ලැබෙන ඵලය පිළිබඳව මේ මොහොතේ අප කල්පනා කළ යුතුව ඇත. කෙසේ නමුත් අධ්‍යාපනය සමාජ පරිණාමයට අනුව සකස්වීමේ දැඩි අවශ්‍යතාවක් ඇති බව අප පිළිගත යුතු වේ.



# රුපියල අවප්‍රමාණය වීම වෙනස් කරමින් අපට ඉදිරියට යා හැකියි



කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය **සුරංග සිල්වා**

**රුපියල අවප්‍රමාණය වීම, මේ දිනවල කතාබහට ලක් වන මාතෘකාවකි. ඩොලරයක් වෙනුවෙන් අප ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය දිගින් දිගටම වැඩි වෙමින් පවතී. එය රටට එතරම් සුබදායක තත්ත්වයක් නොවේ. මේ පිළිබඳව කතාබහ කිරීමට එක්වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය සුරංග සිල්වා මහතායි. මේ ඔහු හා කෙරුණු සංවාදයේ සංක්ෂිප්තයකි.**

**● රුපියල අවප්‍රමාණය වීම යනු කුමක් ද?**

අප විදෙස් රටක් සමඟ ගනුදෙනු කරන විට මුදල් වටිනාකමක් හුවමාරු කර ගැනීමට අපට සිදු වෙනවා. විදෙස් රටකින් භාණ්ඩ ආනයනය කරන විට ඒ භාණ්ඩ මිලදී ගැනීම සඳහා අපේ මුදල් දීමට අපට සිදු වෙනවා . අපි විනිමය අනුපාතිකය යනුවෙන් හඳුන්වන්නේ ඔවුන් අපේ මුදලට දෙන වටිනාකමයි. විනිමය අනුපාතිකය කියන්නේ, අපි ඔවුන්ගෙන් නිෂ්පාදන ලබා ගන්නා විට ඔවුන්ගේ භාණ්ඩය වෙනුවෙන් අපි කොපමණ ගෙවීමට කැමති ද යන්න ඔවුන්ගේ මුදල් ඒකකයෙන් කීමයි. භාණ්ඩ හා සේවා හුවමාරු ආර්ථිකයක හුවමාරුව පහසු කිරීම සඳහා විදෙස් විනිමය හුවමාරු වීමක් සිදු විය යුතුයි. ඒ හුවමාරුවේදී එම මුදලට අනුව අපේ රුපියලට ඇති වටිනාකම කොපමණ ද යන්න නිශ්චය කිරීම විනිමය අනුපාතිකය ලෙස හැඳින්වෙනවා. එහිදී අපේ රුපියලට ඇති වටිනාකම අවම වෙමින් යෑම රුපියල අවප්‍රමාණය වීම ලෙස පෙන්වා දිය හැකියි. මේ අනුව විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේදී අප විසින් විදෙස් මුදලක් සඳහා ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය වැඩි වීමක් සිදු වෙනවා. මේ වන විට ඉතා වේගයෙන් ඩොලරයකට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය වැඩි වී තිබෙනවා. කෙසේ වෙතත් මෙය හුදෙක් වත්මන් ආණ්ඩුවේ ක්‍රියා කලාපය හේතුවෙන් සිදු වූවක් නොවේ. සමස්ත පද්ධතියම ක්‍රියාත්මක වූ ආකාරය මත සිදු වූ දෙයක්. ඇතැම් රටවල මුදල් අවප්‍රමාණය සිදු කරන්නේ හිතාමතාමයි. ආර්ථික වාසි සමාන ලෙස බෙදීයෑමේ අවශ්‍යතාව වෙනුවෙන් ඇතැම් රටවලට මුදල අවප්‍රමාණය කිරීමට බලපෑම් ද එල්ල වෙනවා. ජපානයේ 'යෙන්' අවප්‍රමාණය කරන්නයැයි අමෙරිකාව විසින් ජපානයෙන් ඉල්ලීමක් කොට තිබෙනවා. එලෙස අවප්‍රමාණය කිරීමත් සමඟ ජපානයේ ආනයන වියදම් වැඩි වී අමෙරිකාව වැනි රටවලට ද අපනයන ආදායම වැඩි කරගත හැකියි. අප වැනි රටවල මුදල අවප්‍රමාණය කළ විට එහි වාසිය විදෙස් රටවලටයි. එවිට ඔවුන්ට වැඩිපුර මුදල් ප්‍රමාණයක් අපෙන් ගත හැකියි.

**● රුපියල අවප්‍රමාණය වන විට අපේ ආනයන සහ අපනයනවලට සිදු වන්නේ කුමක්ද ?**

රුපියල අවප්‍රමාණය වන විට අපේ ආනයන වියදම් රුපියල්වලින් වැඩි වෙනවා. එසේම අපනයන ආදායම ද වැඩි කර ගත හැකිව තිබෙනවා. ඒ, විදේශිකයන්ට අපේ භාණ්ඩවල මිල අඩු වී වැඩිපුර ඉල්ලුම් කරන බැවින්. අපේ මුදල අවප්‍රමාණය වන විට අපේ භාණ්ඩයක් සඳහා ඔවුන් ගෙවිය යුතු මිල අඩු වීමක් සිදු වනවා. මින් පෙර ඔවුන් ඩොලරයක් දී අපෙන් තේ කිලෝවක් මිල දී ගත්තා නම් රුපියල අවප්‍රමාණය වීමත් සමඟ මේ වන විට ඔවුන් තේ කිලෝවක් සඳහා ගෙවිය යුත්තේ ඩොලරයකට වඩා අඩු මුදලක්. එම නිසා වැඩිපුර ඉල්ලුමක් අපේ රටේ භාණ්වලට ලැබෙනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. එහෙත් සැබෑ ලෙසම එලෙස සිදු වන්නේ නෑ. නිදසුනක් ලෙස ගත හොත්, මිල තරමක් අඩු වූ පමණින් මිනිසුන් වැඩිපුර තේ පානය කරන්නේ නෑ. මෙරට තුළ නම්‍යශීලි අපනයනයන් නොමැති වීම විශාල ගැටලුවක්. එලෙසම අප ආනයනය කරන භාණ්ඩවල මිල වැඩි වීම හේතු කොට ගෙන අපට විශාල වශයෙන් ඉල්ලුම අඩු කිරීමටත් හැකියාවක් නෑ. මක්නිසාද යත්, අප බොහෝවිට ආනයනය කරන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩ. අත්‍යවශ්‍ය භාණ්ඩයක මිල වැඩිවුණ ද ඒ සමඟම විශාල වශයෙන් ඉල්ලුම අවම කරන්නේ නෑ. එබැවින් රුපියල අවප්‍රමාණය වීම අපට දෙආකාරයකින් අවාසිදායකයි. එකක් වන්නේ අපේ ආනයන වියදම වැඩි වීමයි. අනෙක අපේ සාම්ප්‍රදායික අපනයනවලින්, රටේ අපනයන ආදායම බලාපොරොත්තු වන අන්දමින් වර්ධනය නොවීමයි. අපනයන ආදායම වැඩි කර ගත හැකි හොඳම ක්‍රමය වන්නේ අපේ රටේ මිල අඩු වන විට වැඩිපුර ඉල්ලුම් කරන භාණ්ඩ විදෙස්වලට සැපයීමයි. නොඑසේ නම් නවතම නිෂ්පාදන ලෝක වෙළෙඳපොළට සැපයීම ද විකල්පයක්.

**● මේ තත්ත්වයෙන් ගොඩයෑමට ඇති මග කුමක් ද?**

රුපියල අවප්‍රමාණය වීමෙන් ගොඩයෑමට අපට ක්‍රම දෙක තුනක් තිබෙනවා. ඉන් පළමුවැන්න නම් දේශීය ආර්ථිකය හැකි උපරිමයෙන් ශක්තිමත් කර ගැනීමයි. හැකි සෑම අවස්ථාවකම ආනයනය වෙනුවට භාණ්ඩ හා සේවා දේශීයව නිපදවා ගත යුතුයි. ඒ සඳහා පොල් තෙල් කදිම නිදසුනක්. රටේ අවශ්‍යතාව සැපිරීමට සෑහෙන තරම් පොල් තෙල් දේශීයව නිෂ්පාදන කළේ නම්, පොල් තෙල් සම්බන්ධයෙන් මෙතරම් ගැටලු උද්ගත වන්නේ ද නැහැ.

දෙවැන්න නම් අප හැකි සෑම විටකම අපේ සාම්ප්‍රදායික අපනයනවලින් මිදී, නව අපනයන වෙත යමින් අන්තර්ජාතික වෙළෙඳපොළේ නමක් දිනා ගැනීමයි. කොවිඩ් -19 වසංගතය තුළ අප බොහෝ දේ අත්දුටුවා. මෙරට තුළ බොහෝ දෙනකු එම වසංගතයෙන් ආරක්ෂා වී සිටින්නේ කොත්තමල්ලි වැනි දේශීය ඖෂධ පානයන් භාවිතයෙන්. එම නිසා අපි අලෙවි කළ හැකි දේශීය ඖෂධ පාන වර්ග, ගුණදායක ආහාර අපේ අසල්වැසි ඉන්දියාව, බංග්ලාදේශය, චීනය වැනි රටවල හෝ ප්‍රචලිත කළ යුතුයි. එසේම මෙයින් ගැලවීමට නම් විචාරශීලි ණය ගැනීමක් සිදු කළ යුතුයි. මෙතෙක් ගත් ණය කොහොමටත් ගෙවිය යුතු වෙනවා. එහෙත් ඉදිරියේදී ණය ගැනීම සිදු කළ යුත්තේ ඉතාමත් විචාරශීලිව. හැකි තරම් දුරට විවිධාංගීකරණය කරමින් නිෂ්පාදන අපනයනය කළ යුතුයි. අපනයන වැඩි කිරීමේදී කෘෂිකාර්මික, කාර්මික අංශ පමණක් නොව සේවා අංශයත් හැකි තාක් බලගැන්විය යුතුයි. උපක්‍රමශීලි නොවුණහොත් අපට අනාගතයේදී දරුණු තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වනවා. අමෙරිකානුවන් නිදා සිටින අවස්ථාවේත් ඉන්දියානුවන්, අමෙරිකානුවන්ගේ විදුලි බිල් හදනවා. එවැනි සේවාවන් අපට ද රටරටවලට වැඩි මිලකට දිය හැකියි.

එසේම අපේ මානව සම්පත හැකි තරම් බලගන්වා විදෙස් වෘත්තීන් සඳහා යොමු කිරීමට උත්සාහ ගැනීම අත්‍යවශ්‍යයි. මන්ද නුපුහුණු ශ්‍රමිකයන් මැදපෙරදිග ගෘහ සේවයට යැවීමට වඩා ඉන් ලැබෙන ආදායම් ප්‍රමාණය වැඩියි. මැදපෙරදිග සේවය කරන අපේ ශ්‍රමිකයන්ට පවා පසුගිය කාලයේ යම් යම් ක්ෂේත්‍ර සඳහා විශේෂ පුහුණුවක් දී විදෙස් ගත කරවීමට රටට හැකියාව තිබුණා නම් එම ශ්‍රමිකයන්ගේ වැටුප්, තනතුරු සහ රැකියාවේ ස්වභාවය ඉහළ යෑමක් සිදු වනවා. අන්තර්ජාතික වෙළෙඳපොළේ නැගී එන අවශ්‍යතාවන්ට අනුව අපනයනය කිරීමට අප උත්සුක විය යුතු අතර එහිදී සේවා අංශය ඉතා වැදගත්. පුහුණු කළ හෙදියන්, ගුරුවරුන් විදෙස්ගත කිරීමෙන් රටට වැඩි ආදායමක් උපයා ගැනීමේ හැකියාවක් තිබෙනවා. චීනයට, මැදපෙරදිගට ඉංග්‍රීසි ගුරුවරුන් අවශ්‍යයි. අපේ අධ්‍යාපනය ශිෂ්‍යයන් ඇද ගන්නා ආකාරයෙන් රටරටවලට දිය හැකි අන්දමින් අප සකස් කළ යුතුයි. එය මාර්ගගත ක්‍රමයට ද (on line) සිදු කළ හැකි වීම විශාල පහසුවක්. රටක් ලෙස මෙය අප සියල්ලන් එක්ව කළ යුතු කාර්යයක්. රුපියල අවප්‍රමාණය වීමට ද ආණ්ඩුවට දෙස් දෙවොල් තැබීමෙන් එලක් නෑ. ගිය ආණ්ඩුව කාලෙත්, ඊට පෙර ආණ්ඩුවලදීත් රුපියල අවප්‍රමාණය වුණා. මේ අවස්ථාවේදී කොවිඩ් - 19 හේතුවෙන් රුපියල අවප්‍රමාණය වීමට වැඩි ඉඩක් තිබෙනවා.

අපේ අපනයනවලට වෙළෙඳපොළක් නෑ. සංචාරකයෝ එන්නෙ නෑ. විදෙස් ශ්‍රමිකයන්ගේ රැකියාවල සහ වැටුප්වල ගැටලු හේතුවෙන් ඔවුන් යළිත් මව් රටට ඇවිත්. මේ අවස්ථාව අර්බුදකාරී අවස්ථාවක් බැවින් රුපියල මේ මට්ටමින් හෝ පවත්වාගැනීමත් අභියෝගයක් බවට පත්ව තිබෙනවා.

**● රුපියලේ වටිනාකම වැඩි කරගැනීමට කළ යුත්තේ කුමක්ද?**

ආනයන පාලනය මෙහිදී වැදගත් කරුණක්. එහෙත් ආනයනය කිරීම නැවැත්විය යුත්තේ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ පමණයි. ඉන් අනතුරුව දේශීය ආර්ථිකය ශක්තිමත් කරමින්, හැකිතාක් දුරට රටේ ආනයන අවශ්‍යතාව අඩු කළ යුතුයි. අපනයනවලදී අප මෙතෙක් කළ අපනයනය කළ සාම්ප්‍රදායික අපනයනවලින් තරමක් ඔබ්බට යමින් විවිධාංගීකරණය කළ අපනයන සඳහා මුල්තැනක් දීම අවධානය යොමු විය යුතු කරුණක්. විශේෂයෙන්ම ලෝකය මුහුණ දී සිටින කොවිඩ්- 19 ව්‍යසනය හරහා මතු වන අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන බිහි කොට ඒවා අපනයනයට උත්සුක විය යුතුයි. ඒ සඳහා මෙරට කර්මාන්ත ශාලා භාවිත කිරීමේ හැකියාවක් තිබෙනවා. අප ලෝක වෙළෙඳපොළට යා යුත්තේ නව මුහුණුවරකින් සහ උපරිම ගුණාත්මක බවකින්. බංග්ලාදේශය මේ වන විට සෞඛ්‍යාරක්ෂාවට සම්බන්ධ නිෂ්පාදන විශාල වශයෙන් නිපදවීමට පියවර ගෙන තිබෙනවා. අප ද මෙතෙක් නොකළ ආකාරයේ නිෂ්පාදනයන් වෙත ප්‍රවිශ්ට විය යුතුයි. එසේ නොවුණ හොත් රටක් ලෙස ඉදිරියේදී දැඩි අසීරු තත්ත්වයකට මුහුණ පෑමට අපට සිදු වනවා.

**● රුපියල දිගින් දිගටම අවප්‍රමාණය වුණොත් ?**

අවප්‍රමාණය නිසා වෙන අවාසියක් විදිහට අප ගෙවිය යුතු විදේශීය ණය ප්‍රමාණය වැඩි වෙනවා. අවප්‍රමාණය අඩු කරගන්න තරමට ගෙවන්න ඕනෑ ණය ප්‍රමාණයේ නිරපේක්ෂ වටිනාකම, ගෙවිය යුතු පොලිය අඩු වෙනවා. රුපියල තව දුරටත් අවප්‍රමාණය වුණොත් රටේ ආර්ථිකය පිළිබඳ ඇති විශ්වාසය, ජනතාවට ආයෝජන පිළිබඳ ඇති විශ්වාසය අඩු වී යා හැකියි. එවැනි තත්ත්වයක් ඇතිවීම වළකා ගැනීමට රටක් වශයෙන් යම් යම් ක්‍රියාමාර්ගවලට එළඹිය යුතු වෙනවා. මේ අවස්ථාවේ රුපියලේ වටිනාකම වැඩි කර ගැනීමට යෑම නොව කළ යුත්තේ තව දුරටත් රුපියලේ වටිනාකම අවම වීම අඩු කර ගැනීමයි. රජය මෙහිදී ගෙන ඇති තීරණවලින්, අගය කළ යුතු තීරණයක් ලෙස ආනයන සීමාකරණය දැකිය හැකියි. එහෙත් රටක අත්‍යවශ්‍ය ආනයන ගෙන්වීමට අවස්ථාවක් දිය යුතුයි. ඒ වගේ අපනයන නිෂ්පාදන සඳහා අවශ්‍ය කරන ආනයන ඇත්නම් ඒවා ද දිරිමත් කළ යුතුයි.

**● තත්ත්වය යහපත් අතට හැරෙයි ද?**

මෙරට ව්‍යාපාරිකයන්, ව්‍යවසායකයින් ඇතුළු මානව සම්පත හොඳින් පුහුණු කොට ශක්තිමත් කරමින් මනා සැලැස්මක් යටතේයි කටයුතු කරන්නේ. අපට මේ විනිමය අවප්‍රමාණය වීමේ දුෂ්චක්‍රය වෙනස් කරමින් ඉදිරියට යා හැකි බවයි මගේ විශ්වාසය. කෙසේ වෙතත් මේ අප මුහුණ පා සිටින කොවිඩ් වසංගතයත් ඒ සඳහා ප්‍රබල බාධකයක් වී තිබෙනවා. ඉදිරියේදී මේ වසංගතය දුරු වී රටේ සංචාරක කර්මාන්තය ඇතුළු කර්මාන්ත ශක්තිමත් වන විට අපට මේ තත්ත්වයෙන් ගොඩයන්නට පසුබිමක් සකසා ගත හැකියි. එහෙත් ඒ සඳහා අප රටක් ලෙස භේද භින්නවලින් තොරව මේ තත්ත්වයට මුහුණ දිය යුතුයි. එබැවින් මේ අවස්ථාවේදී රටේ ආර්ථිකය ගොඩනැගීම වෙනුවෙන් වැඩ කිරීමට අප සැමට යුතුකමක් තිබෙනවා.

**කාංචනා සිරිවර්ධන**

**ඇතැම් රටවල මුදල් අවප්‍රමාණය සිදු කරන්නේ හිතාමතාමයි**

**රුපියල අවප්‍රමාණය වන විට අපේ ආනයන වියදම් රුපියල්වලින් වැඩිවෙනවා**

**රුපියල අවප්‍රමාණය වීම අපට දෙආකාරයකින් අවාසිදායකයි**

**හැකි සෑම අවස්ථාවකම ආනයනය වෙනුවට භාණ්ඩ හා සේවා දේශීයව නිපදවා ගත යුතුයි.**






## රත්රන් සෙල්ලම

රත්රන් ජාවාරම්කරුවන් නොයෙක් උපක්‍රම යොදමින් මෙරටට ඒවා ගෙන ඒමට දරනා උත්සාහයේ නිමක් නැත. ඒ, රත්රන් වෙළෙඳපොළ වටිනාකමින් 15%ක් පමණ වන බදු මුදලින් කර හරින්නටය. එය එසේ නොවන්නට ශ්‍රී ලංකා රේගුව සෝදිසියෙන් සිටියි. මේ දෙපාර්ශ්වයේ ක්‍රියාකාරකම් ජනමාධ්‍ය ඔස්සේ නිතර ඇසේ. ඒ, බොහෝ විට නීති විරෝධී අයුරින් පිටරටින් ගෙනා රත්රන් අත්අඩංගුවට ගැනීම්වලදීය. එහෙත් රේගුවට කොකා පෙන්වමින් ජාවාරම්කරුවන් ඒවා රේගුවෙන් පන්නා ගත හොත් ඒ පිළිබඳ සදහටම නැසෙන්නටත් ඉඩ ඇත.

එය එසේ වන්නට තිබූ ඉඩකඩ නූලෙන් වළක්වා ගැනුණු සිද්ධි ගුවන් සහ නැව් තොටවල් ඇසුරෙන් වාර්තා වෙයි. බොහෝ විට ඒ ඒ තැන්වල සේවයේ නිරත විවිධ පුද්ගලයන්ද සම්බන්ධ කර ගනිමින් සූක්ෂ්ම අයුරින් රත්රන් ජාවාරම්වල නිරත වීමට ජාවාරම්කරුවන් උත්සාහ දරනු පෙනේ.

ඉකුත්දා, කටුනායක ගුවන්තොටුපළේ සනීපාරක්ෂක කම්කරු අංශයේ සුපරීක්ෂකවරයෙක් ගුවන්තොටේ කැසිකිළියක් තුළදී පොළොව තළන යන්ත්‍රයක් තුළට ඔබ්බවා රත්රන් තොගයක් හොර රහසේ ගුවන්තොටුපොළෙන් පිට කිරීමට උත්සාහ දරා තිබිණ. ඒ එකකි. මෑතකදී ඇසුණු තවත් එවැනි ජාවාරමකදී බාල වයස්කාර පිරිමි දරුවකු ද ඉත්තකු කර ගනිමින් අමුතුම නාටකයක් රඟ දක්වන්නට ජාවාරම්කරුවන් උත්සාහ දැරීය. එය අන්තිම මොහොතේ කොටුකර නොගන්නට එයද සදහටම රහසක් වන්නට ඉඩ තිබිණ.

අහම්බෙන් මෙන් ගුවන්තොටුපොළේ එක් පවිත්‍රතා සේවිකාවකගේ ඇසට අසුවූ එම බාල වයස්කාරකරුගේ කලිසමේ තැවරුණු තද පැල්ලමක් නිසා රුපියල් කෝටි ගණනක් වටිනා රත්රන් කිලෝ 6කට ආසන්න ප්‍රමාණය රාජසන්තක කිරීමට මෙරටට හැකි විය. ඒ කතාව මෙසේය.

ගුවන්තොටේ එක් වැසිකිළියක් අසල කලිසමේ තද පැල්ලමක් සහිත පිරිමි දරුවෙකි. ඔහු සිටින්නේ තරමක් කලබල ගතියෙනි. ඒ මේ අත බලමින් සිටි ඒ දරුවා වැසිකිළියට ඇතුළු වන්නේද කරදරයකට පත්ව සිටින අයුරිනි.

මේ දර්ශනය නිසා ඇතිවූ කුතුහලය කම්කරු සේවිකාවගේ සිතේ නොමැකී පැවතිණ. ඈ අදාළ වැසිකිළියට කර පෙවූයේ මේ මොකකින් මොකක් හෝ තවත් හෝඩුවාවක් වැසිකිළිය තුළ තිබිය හැකිය යන සැකය සිත තුළ නලියමින් තිබියදීය. ඒ වන විටත් පිරිමි දරුවා කැසිකිළියෙන් පිටතට ගොසිනි. ඒ වටා වටයක් දැස් කරකවා බැලූ ඇය නැවතුණේ එහි එක් කොනකිනි. ඒ අමුත්තා මේ තුළ යමක් දමා ගොස් ඇති සැටියකි. නිකමට මෙන් සැකකටයුතු ඒ පාර්සලය ඒ මේ අත පෙරළා බැලූ ඈ මවිත වූයේ මේ නම් මොකක් හෝ යටිකූට්ටු වැඩක එක් කොනක් බව සිහියට නැඟීමෙනි.

එවන් සැකකටයුතු යමක් දුටු විගස ඒ පිළිබඳ ගුවන්තොටුපොළ නිලධාරීන් දැනුවත් කරන ලෙසට කල්තබාම පවිත්‍රතා අංශයේ සියලු සේවක සේවිකාවන්ට උපදෙස් ලැබී තිබේ. ඒ අනුව මේ කාන්තාව දිව ගියේ ආරක්ෂක අංශයේ කිසිවකු සොයාගෙනය. ඒ ගමන කෙළවර වන්නේ ගුවන්තොටුපොළට අනුබද්ධ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ පිරිසක් සැකකටයුතු පාර්සලය සොයා වැසිකිළියට කඩා වැදීමෙනි. ඒ අනුව හොරු නැතත් සැකකටයුතු රත්රන් පාර්සලයක් සොයා ගැනීමට එම නිලධාරීන්ට හැකිවිය.

මේ පොට දිගේ තවත් ඉදිරියට ගියවිට රත්රන් ජාවාරමේ අල ගිය මුල ගිය තැන් හෙළිවනු ඇතැයි රේගුව ඇතුළු ගුවන්තොටුපොළ ආරක්ෂක අංශ කල්පනා කළහ. ඉනික්බිතිව ඔවුහු මුලින්ම cctv කැමරා දෙසට කර පෙවූහ. එයින් කලින්ට වඩා තොරතුරු හෙළි විය. ඒ අදාළ පවිත්‍රතා සේවිකාව සැකකටයුතු පිරිමි දරුවාගේ කලිසමේ තැවරුණු මඩ පැල්ලමක් ලෙසින් දුටු පැල්ලම තේ හැළීමෙන් ඇතිවූවක් බව හෙළි කරමිනි. අත්වැරදීමකින් නොවේ. ජාවාරම්කරුවන් දෙදෙනකු විසින් ඕනෑකමින්ම මේ ළමයාගේ ඇගේ ඒවා හළා තිබුණේ කලින් ලියූ පිටපතකට අනුවය. එවිට ඒ පැල්ලම සෝදා ගැනීමට පිරිමි ළමයා කැසිකිළිය දෙසට ඇදෙයි. එවිට, කාටත් හොරෙන් රත්රන් ජාවාරමේ ප්‍රධාන ජවනිකාවක් වැසිකිළිය තුළ රඟන්නට ජාවාරම්කරුවෝ සූදානමින් සිටියහ.

ඒ දක්වා කිසිම හෙණයකින් තොරව කෙරුණු රත්රන් ජාවාරම දරුවාගේ කලිසමේ තේ පැල්ලමෙන් කණපිට හැරේයැයි ඔවුහු නොසිතන්නට ඇත. එහෙත් වාසනාවකට මෙන් මෙරටට බදු නොගෙවා පන්නන්නට හැදූ ඒ රත්රන් තොගය නීතියට කොටු විය. මේ ජාවාරමත් සමඟ ජාවාරම්කරුවන් තමන්ගේ වැඩේ කර ගැනීමට ඕනෑම දෙයක් කරනා වගත් කවරකු හෝ ඉත්තකු බවට පත් කර ගන්නා බවත් මේ අනුව නැවත වරක් හෙළි විය.

එසේම, මේ ජාවාරමේ මහ මොළකරුවන් විසින් මෙහෙයවූ මේ කුඩා පිරිමි ළමයා ජාත්‍යන්තර පාසලක ඉගෙනුම ලබන්නකු බවත් එහි ගාස්තු ගෙවා ගැනීමට පවතින ආර්ථික අපහසුකම නිසා මොහුගේ මවගේ ද අනුදැනුම මත සැකකටයුතු පිරිමි දරුවා රත්රන් ජාවාරමට සහාය දක්වා ඇති වගත් මේ පිළිබඳ රේගුව පැවත්වූ වැඩිදුර විමර්ශනවලදී හෙළි විය.

එමෙන්ම, රත්රන් ජාවාරමට සහාය දක්වන්නන්ට රජය මඟින් ත්‍යාග මුදල් පිරිනැමීම යටතේ මේ පිළිබඳ මුලින්ම සැක මතු වී ඒ සම්බන්ධයෙන් සොයා බැලූ පවිත්‍රතා සේවිකාවට මුදලින් තෑගි ලැබිණ. ඒ ඊට අදාළ විමර්ශන මෙහෙය වූ සියලු නිලධාරීන් ද රජය මඟින් ඇගයීමට ලක් කරමිනි.

සැබැවින්ම, ඇතැම් විට අපරාධ විමර්ශනය පිළිබඳ හසළ අත්දැකීම් ඇත්තන්ගේ ඇස්වලට අසු නොවූ ඉතා සුළු සුළු දෙයින් මහා ජාවාරම්වල සුල මුල හෙළි වන්නට ඉඩ තිබේ. ඒ, දෙනෝදාහක් ආරක්ෂක නිලධාරීන් සහ නවීනතම ආරක්ෂක උපකරණවලින් සමන්විත ගුවන්තොටුපොළේ එක් පවිත්‍රතා සේවිකාවකගේ සෙවිල්ල නිසා තවත් එක් රත්රන් ජාවාරමක් හෙළිකරගත්තාක් මෙනි.

තවද, විදෙස් රටක සිට මෙරටට පැමිණෙන පුරවැසියකුට යම් කනකර ආභරණ ප්‍රමාණයක් පැළඳ මෙරටට ඇතුළු වීමේ අවස්ථාව පවතී. එහෙත් කිසිවිටෙකත් අසීමිත අයුරින් රත්රන් සිරුරේ පැළඳගෙන ඒමට අවසරයක් නීතියෙන් නොවේ. එහෙත් ඇතැම් මුළු සිරුරම වැසෙනා ඇඳුම්වලට මුවා වී නීතිමය අවසරය පවතින ප්‍රමාණයට වඩා වැඩිපුර ඇතැමුන් ගුවන්තොටුපොළ හරහා නියමිත බදු නොගෙවා රට තුළට ගෙන ඒමට දරන උත්සාහ කිරීම් පිළිබඳ ද නිතර අසන්නට ලැබේ.

එවැනි ඇතැමුන් විකිරණ කිරණ ඇසුරෙන් මුළු සිරුරම විනිවිද පරීක්ෂා කෙරෙන යන්ත්‍ර පරීක්ෂාවෙන්ද විවිධ සෞඛ්‍ය හේතු රුවා දක්වමින් මග හරින්නට සුළු සුළු වශයෙන් නිතර දෙවේලේ රත්රන් ජාවාරමේ නිරත සමහරු උත්සාහ දරන බවත් ගුවන් තොටුපොළෙන් ඇසේ. එය එසේ වීමට ඉඩ නොදිය යුතු බවත් රජයට වැඩිම ආදායමක් උපයාදෙන රේගු බදු නොගෙවා රට තුළට බඩු භාණ්ඩ ගෙන ඒමට කිසිවකුට අනවශ්‍ය පරිදි ඉඩ නොදිය යුතු බවත් මේ සම්බන්ධයෙන් අදහස් දක්වන විද්වතුන්ගේ අදහසය.

**නුවන් මහේෂ් ජයවික්‍රම**

# මිනිස් ජාවාරම් මැඬින්න ඔස්ට්‍රේලියාවෙන් ඩ්‍රෝන යානා 5ක්

**සුභාෂිණී සේනානායක සහ මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාව සහ ඔස්ට්‍රේලියාව අතර කෙරෙන මිනිස් ජාවාරම මැඬ පැවැත්වීමට ඔස්ට්‍රේලියානු රජය මෙරට පොලිසියට ඩ්‍රෝන යානා 5ක් පරිත්‍යාග කර තිබේ.

නීතිවිරෝධී ලෙස කෙරෙන මිනිස් ජාවාරම නවතාලීම සඳහා කෙරෙන එම ජාවාරම් ගුවන් දර්ශන මගින් නිරීක්ෂණය කිරීමට එරට ස්වෛරී දේශ සීමා මෙහෙයුම් පිළිබඳ ඒකාබද්ධ නියෝජිතායතන කාර්යසාධක බළකාය මේ ඩ්‍රෝන යානා මෙරටට දීම කර තිබෙන බව ශ්‍රී ලංකාවේ ඔස්ට්‍රේලියා මහ කොමසාරිස් කාර්යාලය පවසයි.

මේ ඩ්‍රෝන යානා පහ අන්තර්ජාලය ඔස්සේ ශ්‍රී ලංකා පොලිසිය වෙත බාර දීමටද කටයුතු කර තිබෙන බව මහ කොමසාරිස් කාර්යාලය කියා සිටියේය.

ශ්‍රී ලංකාව සහ ඔස්ට්‍රේලියාව අතර කෙරෙන මිනිස් ජාවාරම නිරීක්ෂණය කිරීමට ඔස්ට්‍රේලියාව විසින් ආවේක්ෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබෙන බවත් ඒ යටතේ රටවල් රැසකට මෙලෙස ඩ්‍රෝන යානා දී තිබෙන බවත් කියා සිටි මහ කොමසාරිස් කාර්යාලය ඒ අනුව ශ්‍රී ලංකාවටද ඩ්‍රෝන යානා පහක් දුන් බව කියා සිටියේය.

# අන්තවාදී සංවිධාන 11ක් තහනම් කිරීමේ ගැසට්ටුව නිකුත් කෙරේ

**සුභාෂිණී සේනානායක**

ඉස්ලාම් අන්තවාදී සංවිධාන 11ක් තහනම් කිරීමට අදාළ ගැසට් නිවේදනය නිකුත් කර තිබේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අත්සනින් යුතුව එම ගැසට් නිවේදනය නිකුත් කර ඇති අතර, එක්සත් තව්හිද් ජමාත්, සිලෝන් තව්හිද් ජමාත්, ශ්‍රී ලංකා තව්හිද් ජමාත්, සමස්ත ලංකා තව්හිද් ජමාත්, ජමියතුල් අන්සාරි සුන්නතුල් මොහොමදියා, දාරුල් අදර්, ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය සංගමය, ඉස්ලාමික් ස්ටේට් ඔෆ් ඉරාක් ඇන්ඩ් සිරියා හෙවත් අයි.එස්.අයි.එස්, අල් කයිඩා, සේව් ද පර්ල්ස් සහ සුපර් මුස්ලිම් යන සංවිධාන මෙරට තහනම් සංවිධාන ලෙස නම් කර තිබේ.

රට තුළ සාමය අඛණ්ඩව පවත්වාගෙන යෑම තහවුරු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා රජය විසින් සද්භාවයෙන් දරන ලද ප්‍රයත්නයන් වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් සහ ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ නීතියේ අධිපත්‍යයේ හිත සුව පිණිස එම සංවිධාන තහනම් කර ඇති බව එම ගැසට් නිවේදනයේ සඳහන් වේ.

නිකුත් කළ ගැසට් නිවේදනය අනුව මෙරට තුළ හෝ මෙරටින් පිටත දී කිසිදු පුද්ගලයකු විසින් එම සංවිධානයක හෝ සංවිධානය නියෝජනය කරන හෝ සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරන පුද්ගලයන් ඒ හා සම්බන්ධ වීම ඒ කෙරෙහි සැලකිල්ලක් දක්වන වෙනත් යම් සංවිධානයක ක්‍රියාකාරකම්වලට සම්බන්ධ බවට හෝ ඒ කෙරෙහි සැලකිල්ලක් දක්වන බවට සාධාරණ සැකයක් පවතින වෙනත් යම් සංවිධානයකට සහාය නොදිය යුතු වේ. එමෙන්ම එම සංවිධානයක සාමාජිකයකු හෝ සමූහයක සාමාජිකයකුවීම, නායකත්වය සැපයීම, නිල ඇඳුම්, ඇඳුම්, සංකේත, ලාංඡන හෝ ධජ පැලඳීම, ප්‍රදර්ශනය කිරීම, රැස්වීම් කැඳවීම, රැස්වීම් පැවැත්වීම හෝ ඊට සහභාගිවීම, සාමාජිකත්වය ගැනීම හෝ බැඳීම, එහි සාමාජිකයකුට හෝ සමූහයකට රැකවරණය සැලසීම, මුදල් හෝ ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම තහනම් බව එම ගැසට් නිවේදනයේ සඳහන් වේ.

කිසියම් පුද්ගලයකු විසින් එම නියෝග උල්ලංඝනය කරන්නේ නම් ඔහුට විරුද්ධව මහාධිකරණයක් මගින් වසර 20ක් නොඉක්මවන සිර දඬුවම් නියම වන බව එම ගැසට් නිවේදනයේ වැඩි දුරටත් සඳහන් කර ඇත.

# ගෙවුණු පැය 24ට බීමත් රියැදුරන් 758ක් අත්අඩංගුවට

## මෙහෙයුම් දිගටම

**සුභාෂිණී සේනානායක, රක්ෂණ ශ්‍රියන්ත සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

අලුත් අවුරුදු දින ගත වූ පැය 24 තුළ දිවයින පුරා කළ මෙහෙයුම්වලින් බීමත්ව රථ ධාවනය කළ රියැදුරන් 758 දෙනකු අත්අඩංගුවට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පවසයි.

මෙලෙස අත්අඩංගුවට ගන්නා රියැදුරන් පොලිස් ඇප මත මුදා නොහරින බවත් ඔවුන් අධිකරණයට ඉදිරිපත් කරන බවද නියෝජ්‍ය පොලිස්පතිවරයා කියා සිටියේය. බීමත්ව රිය පදවන රියැදුරන් සොයා ඉදිරියටත් මෙහෙයුම් කරන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

ඉදිරි දින කිහිපය තුළ සැලකිලිමත් ලෙස රිය පදවන ලෙසටද ඒ මහතා ඉල්ලා සිටියේය.

# පෞද්ගලික බස් රියැදුරන් 80%ක් රිය පදවන්නේ මත් වෙලා

## රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම

**අසේල කුරුළුවංශ**

කොළඹ තදාසන්න ප්‍රදේශවලට අයත් ඇතැම් මාර්ගවල පෞද්ගලික බස් රථ රියැදුරන් 80%ක් පමණ බස් රථ ධාවනය කරනු ලබන්නේ මත්ද්‍රව්‍ය භාවිත කර බව ප්‍රවාහන රාජ්‍ය ඇමැති දිළුම් අමුණුගම මහතා පවසයි.

මගීන් විශාල සංඛ්‍යාවක් රැගෙන ධාවනය කරන බස් රථයක රියැදුරාගේ මානසිකත්වය හොඳ මට්ටමක තිබිය යුතු බවත් ඔහුට කොතරම් හොඳ රියැදුරු පුහුණුවක් දී තිබුණත් මනස නිරවුල් නොමැති නම් මගී ජීවිත අනතුරට පත්වීම වැළැක්විය නොහැකි බවත් ඒ මහතා කීය. මහනුවරදී පසුගියදා පැවති මාධ්‍ය හමුවකදී අමුණුගම මහතා මේ බව ප්‍රකාශ කළේය. රියැදුරන් මත්පැන් පානය කර බස් රථ ධාවනය කරන අවස්ථාවල ඔවුන්ට පොලිසිය මගින් පරීක්ෂණ කර අත්අඩංගුවට ගැනීම් කළත් වෙනත් අන්තරායකර මත්ද්‍රව්‍ය භාවිත කරන රියැදුරන් අත්අඩංගුවට ගැනීමේ හැකියාවක් නොමැති බවත් මේ තත්ත්වය වළක්වා ගැනීමට පිළියමක් ලෙස රියැදුරු බලපත්‍රය අලුතින් ගන්නා හෝ අලුත් කරන අවස්ථාවේ සියලු රියැදුරන් මත්ද්‍රව්‍ය සම්බන්ධ පරීක්ෂණකට යොමු කිරීමට සැලසුම් කර තිබෙන බවත් කී රාජ්‍ය ඇමැතිවරයා ඒ සඳහා වන යෝජනාව කඩිනමින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන බවද අවධාරණය කළේය.

# රන්ජන්ගේ යුක්තිය උදෙසා සියලු දේ කරනවා

## විපක්ෂ නායක සජිත්

**අම්බලන්තොට සමූහ සහ හම්බන්තොට දිස්ත්‍රික් සමූහ**

රන්ජන් රාමනායක මහතාට යුක්තිය ඉටු කිරීම වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදීව, ව්‍යවස්ථානුකූලව හා විද්‍යාත්මකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නා බව රන්ජන් රාමනායක මහතා බැලීමට අගුණකොලපැලැස්ස බන්ධනාගාරයට පෙරේදා (13) පැමිණි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.

රන්ජන් රාමනායක මහතා මානව හිතවාදියකු බවත් ඔහු රටට සම්පතක් බවත් මේ රටට ජනතාවට ඉමහත් සේවාවක් නන් අයුරින් ඉටු කළ යුග පුරුෂයකු බවත් විපක්ෂ නායකවරයා මෙහිදී කියා සිටියේය.

# ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය රනිල්ට

## එජාපයෙන් ඒකමතික තීරණයක්

**ශිරෝමි අබයසිංහ**

එක්සත් ජාතික පක්ෂයට හිමි ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා පත්ව යා යුතු බවට පක්ෂය ඒකමතිකව තීරණය කර ඇතැයි පක්ෂ සභාපති හිටපු ඇමැති වජිර අබේවර්ධන මහතා පැවසීය.

ඒ මහතා මේ බව සඳහන් කළේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේදී පෙරේදා පැවති මාධ්‍ය හමුවකදීය.

සිය පක්ෂය ඇතැම් දේශපාලන උපක්‍රම නියමිත වේලාව ආවිට ක්‍රියාත්මක කරන බව කී ඒ මහතා තව මාසයක් දෙකක් යන විට රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තු අසුන නියෝජනය කරනු ඇතැයිද සඳහන් කළේය. එම පුරප්පාඩුවට නියම සුදුස්සා රනිල් වික්‍රමසිංහ මහතා බව වෙනත් පක්ෂවල අයත් කල්පනා කරන බවත් නුදුරේදීම රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පක්ෂ රජයක් යටතේ රටේ පවතින සෑම ප්‍රශ්නයකටම විසඳුම් දීමට සැලසුම් කරමින් සිටින බවත් හෙතෙම අවධාරණය කළේය.


## සංවේගයෙන් දැනුම් දීමයි

උපත 1951.02.10



සැපත 2021.04.14

**බී. රූපා පෙරේරා මහත්මිය**

ස්වර්ගස්ථ වූ බී. රූපා පෙරේරා මහත්මියගේ අවමංගල්‍ය කටයුතු

**බොරැල්ල සුසාන භූමියේ 2021 අප්‍රේල් මස 17 වන දින සවස 4.00 ට සිදුකරන බව දැනුම් දෙමි.**

(දේහය ජයරත්න මල්ශාලාවේ අප්‍රේල් 17 වන දින උදෑසන 10 සිට සවස 4.00 දක්වා තැන්පත් කරනු ලැබේ)

*නැවත නැගිටීමද, ජීවනයද මමය. මා කෙරෙහි අදහන්නා මළ නමුත් ජීවත් වන්නේය.*

(යොහාන් 11-25)


01 වැනි පිටුවෙන්...

### අද සවස ප්‍රදේශ ...

මධ්‍යම, සබරගමුව සහ බස්නාහිර පළාත්වල ඇතැම් ප්‍රදේශවල උදේ කාලයේ මීදුම් සහිත තත්ත්වයක් අපේක්ෂා කළ හැකි බවත්, ගිගුරුම් සහිත වැසි පවතින අවස්ථාවල දැඩි සුළඟෙන් සහ අකුණුවලින් පරිස්සම් වීමට නිසි ආරක්ෂක පියවර ගන්නා ලෙසත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

### පෙත්සම් සලකා බැලීමට ...

අගවිනිසුරු ජයන්ත ජයසූරිය, බුවනෙක අලුවිහාරේ, ප්‍රියන්ත ජයවර්ධන, මුර්දු ප්‍රනාන්දු, ජනක් ද සිල්වා මේ විනිසුරු මඩුල්ල ලෙස පත් කර ඇති අතර, එම මඩුල්ල හමුවේ මේ පෙත්සම් ලබන 19 වැනිදා කැඳවීමට නියමිතව ඇත.


අනිච්චාවත සංඛාරා !

උපත 1962.06.17



විපත 2021.04.14

තංගල්ල සහ තලවතුගොඩ සාරංගා එන්ටර්ප්‍රයිසස් වෙළඳ ව්‍යාපාරයේ අධිපති

**සිංහ අයි. කේ. කුමාර ජයසිංහ මහතා**

විශ්‍රාමලත් සමුපකාර සංවර්ධන උප කොමසාරිස් ටයිටස් ජයසිංහ මැතිතුමා හා
එම මැතිනියගේ දෙටු පුත්,
එච්. වයි. පුෂ්පමාලාගේ ආදරණීය ස්වාමි පුරුෂයා වූද,
තාරකා (සහකාර කළමනාකාරිනී, ලංකා බැංකුව, කෝට්ටේ)
තනුරි, මල්මි,
සාවින් (ශිෂ්‍ය - ගේට්වේ ජාත්‍යන්තර පාසල, රාජගිරිය)
යන අයගේ ආදරණීය පියාණන් වූද.
නිතිඥ සජුන අබේරත්න,
ප්‍රවීන් ගුරුගේ (ගුවන් නියමු - ඩියවී ජෙට් එයාර් ලයින්ස්)
යන අයගේ මාමණ්ඩිය වූද.
දීපානි,
සමන් ජයසිංහ (සදර්න් මෝටර්ස් , තංගල්ල)
යන අයගේ ආදරණීය සොහොයුරා වූ
තංගල්ල සහ තලවතුගොඩ සාරංගා එන්ටර්ප්‍රයිසස් වෙළඳ
ව්‍යාපාරයේ අධිපති
දේශ බන්දු , දේශ ශක්ති, දේශ කීර්ති සම්මාන ලාභී
සමස්ථ ලංකා සාම විනිසුරු, හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය,
තංගල්ල වෙළඳ සංගමය, රුහුණු කරලිය සහ
තංගල්ල සිංහ සමාජයේ සභාපති ධුරය හෙබවූ
සහ තංගල්ල රෝහල් කමිටුවේ භාණ්ඩාගාරික
සිංහ අයි. කේ. කුමාර ජයසිංහ මහතා අභාවප්‍රාප්ත වූයෙන්,
ඒ පිළිබඳ අදාහන කටයුතු 2021 අප්‍රේල් මස 17 වන සෙනසුරාදා
සවස 4.00 ට තංගල්ල දංකැටියේදී සිදු කෙරේ.
මෙයට ශෝකයට පත් පවුලේ ඥාතීන් හා හිතමිත්‍රාදීන්
(අංක 11, තිස්ස පාර, තංගල්ල )
0777 920 515 / 0773 465 095


01 වැනි පිටුවෙන්...

### අවුරුදු ගනුදෙනුවලින් ...

මේ බැංකු 14හි ගනුදෙනුකරුවන් 15,000ක් සිටින අතර, අලුත් අවුරුදු නැකතට 3,129 දෙනකු ගනුදෙනු කර තිබේ. මේ කෝටි 27ක මුදලින් රුපියල් කෝටි 19ක්ම ස්ථිර තැන්පත් වේ. ළමා ගිණුම්වල රුපියල් ලක්ෂ 18ක මුදලක්ද මෙදින තැන්පත් කර තිබේ. මැදවච්චිය ග්‍රාමීය බැංකුවේ පමණක් තැන්පත් කළ මුදල රුපියල් කෝටි 14ක් වේ. රජයේ ආයතනයක් ලෙස මෙවර අවුරුදු චාරිත්‍ර සහ ගනුදෙනු කිරීම් සමඟ අවුරුදු නැකතට එක් දිනක් තුළ රුපියල් කෝටි විසිහතකට අධික (කෝටි 27) ගනුදෙනුවක් ජනතාව විසින් කර ඇත්තේ මේ බැංකු පද්ධතිය කෙරෙහි ඇති විශ්වාසය මත යැයි මැදවච්චිය විවිධ සේවා සමුපකාර සමිති සාමාන්‍යාධිකාරි කමල් ඒකනායක මහතා දිනමිණට ඊයේ (15) පැවසීය.

### අට හැවිරිදි ...

මව ඇගේ යතුරු පැදිය මිදුලේ නවතා තිබියදී කුඩා දරුවා එය පණ ගන්වා ධාවනය කරවීමේදී මිදුලේ සෙල්ලම් කරමින් සිටි දැරියගේ උදරය මතින් යතුරු පැදිය ධාවනය වීම නිසා මේ අනතුර සිදුව තිබේ.

මේ සිද්ධියෙන් මියගොස් ඇත්තේ යාපනය තෙන්මරච්චි මට්ටුවිල් ගම්මානයේ ගජේන්ද්‍රන් සුවසිනී නැමති දැරියයි.

චාවාකච්චේරි පොලීසිය සිද්ධිය වූ ස්ථානයට පැමිණ පරීක්ෂණ ආරම්භ කොට ඇති අතර මියගිය දැරියගේ සිරුර පරීක්ෂණ කටයුතුවලට යාපනය ශික්ෂණ රෝහලට බාරදී තිබේ.

### අධිවේගවලින් ...

එම කාලය තුළ වාහන 515,000කට අධික ප්‍රමාණයක් දක්ෂිණ අධිවේග මාර්ගයේ ධාවනය කර ඇති බව එම අංශය සඳහන් කළේය.

පසුගිය වසරට සාපේක්ෂව මේ වසරේදී දක්ෂිණ අධිවේග මාර්ගයේ රථ වාහන විශාල සංඛ්‍යාවක් ධාවනය කර ඇති අතර, එහි ආදායම පසුගිය වසරට සාපේක්ෂව මිලියන 8කින් ඉහළ ගොස් ඇත.

### පන්දහස දෙන්න ...

ඊයේ (15) වන විට ලක්ෂ 18කට දීමනාව ගෙවා තිබුණු අතර අද (16) වන විට සියලුදෙනාට දීමනාව ගෙවා අවසන් කිරීමට කටයුතු යොදා ඇත.

සිංහල හා දෙමළ අලුත් අවුරුදු සමයේ මහජනතාව මුහුණ පා සිටින ආර්ථික දුෂ්කරතාවලට පිළියමක් ලෙසින් මේ දීමනාව ගෙවිය යුතු බව බැසිල් රාජපක්ෂ මහතා පෙන්වා දී තිබේ.

සමෘද්ධිලාභි පවුල්, අඩු ආදායම්ලාභින් ලෙස හඳුනා ගෙන ඇති පවුල්, වැඩිහිටි දීමනාව ලැබෙන පවුල්, ආබාධිත දීමනාව ලැබෙන පවුල්, වකුගඩු දීමනාව ලැබෙන පවුල්, සියවස් පූර්ණ වැඩිහිටි දීමනාව ලබන පුද්ගලයන් සිටින පවුල් සහ අභියාචනා ඉදිරිපත් කර සුදුසුකම් ලැබූ පවුල් යන කාණ්ඩ හතට අයත් පවුල් මේ දීමනාව ලැබීමට සුදුසුකම් ලබති.

කාණ්ඩ කිහිපයකට අයත් සාමාජිකයන් සිටිය හැකි නමුත් එක් පවුලකට රුපියල් පන්දහසේ එක් දීමනාවක් පමණක් හිමි වේ. කොවිඩ් වසංගතයෙන් පීඩාවට පත් ජනතාවට සහනයක් ලෙසින් මෙසේ රුපියල් 5,000 දීමනාව වාර කිහිපයක දීම ගෙවීමට රජය කටයුතු කළේය. මේ අතර රාමසාන් උපවාසයේ නිරතව සිටින අඩු ආදායම්ලාභීන් සඳහාද රුපියල් 5000 දීමනාව දෙන බව රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා පැවසීය. මේ දීමනා ගැනීමට අවසාන දිනයක් නෑ. ගම්බිම් බලා ගිහින් ඉන්න අයට ආපසු පැමිණි පසු සමෘද්ධි නිලධාරීන් හමුවී ඒ දීමනාව ගන්න පුළුවන්. රාමසාන් උත්සවයේ නිරතව සිටින අඩු ආදායම්ලාභීන් සඳහාත් ඒ දීමනාව දීම කරනවා. යැයිද හෙතෙම වැඩි දුරටත් කීවේය.

### මහ මඟ අනතුරු ...

අලුත් අවුරුදු දිනය තුළ අධිවේගී මාර්ගවල වූ රිය අනතුරු සංඛ්‍යාව 12ක් වන අතර, වෙනත් මාර්ගවලදී රිය අනතුරු 109ක් වාර්තා වී තිබේ.

එලෙස රිය අනතුරුවලට වැඩි වශයෙන් ලක්ව ඇත්තේ යතුරුපැදි වන අතර, එම සංඛ්‍යාව 53කි. අනතුරුවලට ලක් වූ ත්‍රිරෝද රථ සංඛ්‍යාව 30කි.

අලුත් අවුරුදු දින කිහිපය තුළද රිය අනතුරු තවත් ඉහළ යා හැකි බැවින් රියැදුරන් ප්‍රවේශමෙන් රිය ධාවනය කළ යුතු බවත් බීමත් රියැදුරන් අත්අඩංගුවට ගැනීම සඳහා තව දුරටත් අඛණ්ඩව මෙහෙයුම් කරන බවද නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා සඳහන් කරයි.

අලුත් අවුරුදු දිනයේ (14) තුළ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කිලෝ මීටර් 11ක් තුළ ස්ථාන තුනක වූ අනතුරු තුනකින් වාහන 12කට හානි වී එක් අයකු තුවාල ලබා ඇතැයි අධිවේගී මාර්ග පොලිසිය පැවසීය. කිලෝ මීටර් 19 සහ 30 අතර ස්ථානවල මේ අනතුරු තුනම සිදුව තිබෙන අතර, එක් ස්ථානයක වාහන 12ක්ද තවත් ස්ථානයක වාහන හතරක් හා තවත් ස්ථානයක වාහන තුනක් වශයෙන් ගැටී ඇතැයි පොලිසිය කියා සිටියි.

මේ හේතුවෙන් අධිවේගී මාර්ගයේ පැය ගණනක් දැඩි වාහන තදබදයක් පැවති අතර, පෙරේදා දින විශාල පිරිසක් කොළඹින් පිටව අධිවේගී මාර්ගය භාවිත කළ බව අතර, අධික වාහන තදබදය හේතුවෙන් මේ අනතුරු සිදුව ඇති බවත් කියා සිටියේය.

### අලුත් අවුරුදු රුක් රෝපණ ...

මේ දුර්ලභ නැකතට පැළ සිටුවීමට පරිසර අමාත්‍යාංශය 'නැකතට පැළයක්' නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර, එහි ප්‍රධාන රුක්රෝපණය පරිසර ඇමැති මහින්ද අමරවීර මහතාගේ අගුණකොළපැලැස්සේ නිවෙස පරිශ්‍රයේදී අද (16) පෙරවරු 6.40ට සිදු කෙරේ.

මෙයට සමගාමීව අද (16) පෙරවරු 6.40ට යෙදෙන නැකතට කොළඹදී පරිසර අමාත්‍යාංශ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන්ද, මහියංගණය, ත්‍රිකුණාමලය, තංගල්ල ප්‍රදේශයන්හිදී පරිසර අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන්ද රුක් රෝපණය කිරීමේ වැඩසටහන් පැවැත්වෙනු ඇත.

'නැකතට පැළයක්' පැළ රෝපණය කිරීමේ වැඩසටහන මගින් අපේ රටේ පවුල් මිලියන 5.2ක සංඛ්‍යාවෙන් අවම වශයෙන් මිලියන 03ක් හෝ 04ක් පැළයක් රෝපණය කිරීමට යොමු කිරීමත් ඒ අපේ රටේ වනගහනය ඉහළ නැංවීමත් තම අරමුණ බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා කියයි.

එබැවින් මේ දුර්ලභ රුක් රෝපණ නැකතට මුළු රටම එකම වේලාවක, සියලු දෙනා එක්වී තම ගෙවත්තේ පැළයක් රෝපණය කරන්නට කටයුතු කරන මෙන් පරිසර ඇමැතිවරයා ඉල්ලා සිටී.

### දණ්ඩ නීති සංග්‍රහයට ...

ජාතීන් අතර සංහිඳියාවට බලපාන, අන්තවාදයට, ත්‍රස්තවාදයට සහාය දෙන ප්‍රකාශ කරන අයට දඬුවම් කිරීම සඳහා මෙසේ සංශෝධන එක් කිරීමට අදහස් කරන බවත් මහජන ආරක්ෂක ඇමැති විශ්‍රාමික රියර් අද්මිරාල්, ආචාර්ය සරත් වීරසේකර මහතා දිනමිණට ඊයේ (15) පැවසුවේය. ව්‍යවස්ථාවේ ඇති කතා කිරීමේ නිදහසට කිසිසේත්ම අවහිර නොකරන බවත් පැවසූ ඒ මහතා, සමාජ ජාලාවල පළ කරන ඇතැම් අසත්‍ය ප්‍රකාශ හා ප්‍රවෘත්ති ජාතීන් අතර සංහිඳියාවට බලපාන බැවින් එවැනි දේ කරන අයට දඬුවම් කිරීම මෙහි අරමුණ බවත් කීවේය.

### හදිසි අනතුරු ...

මෙවර අනතුරු ප්‍රමාණය පසුගිය වසරට වඩා සියයට 47කින් වැඩි වී ඇතැයි කොළඹ ජාතික රෝහලේ උසස් නිලධාරියෙක් දිනමිණට පැවසීය.

පසුගිය වසරේ එම දින දෙකෙහි වාර්තා වී ඇති හදිසි අනතුරු සංඛාව 188කි. මහ මඟ වූ රිය අනතුරු හේතුවෙන් 77ක් වැටීම් හේතුවෙන් 73ක් හිංසක ක්‍රියා මෙන්ම පහර කෑම් 38ක් නිවෙසේදී වූ අනතුරු හේතුවෙන් 21ක් පහරදීම් හේතුවෙන් 19 දෙනෙක්, ගිනිකෙලි අනතුරුවලින් තුවාල ලැබූ 4 දෙනෙක් ඇතුළු අනතුරු හේතුවෙන් මේ පිරිස රෝහල්ගත වී ඇත.

### වරාය නගර ආර්ථික කලාප ...

එම පනත් කෙටුම්පත නීතියක් බවට පත්වීමට නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් සහ ජනතාව විසින් ජනමත විචාරණයකදී සම්මත කළ යුතු බවට තීන්දු කරන ලෙස පෙත්සම් මගින් ඉල්ලා ඇත.

එක්සත් ජාතික පක්ෂ සභාපති වජිර අබේවර්ධන සහ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර, ජනතා විමුක්ති පෙරමුණේ වසන්ත සමරසිංහ, තොරතුරු තාක්ෂණ වෘත්තීයවේදීන්ගේ සංගමයේ සභාපති ජී. කමල් රේණුක පෙරේරා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂ පාක්‍යසෝති සරවනමුත්තු විසින් මේ පෙත්සම් ගොනු කර තිබෙන අතර, නීතිපතිවරයා මෙහි වගඋත්තරකරු ලෙස නම් කර තිබේ.

### වේලි ඔයේ ...

ඔවුන් දිය නාමින් සිටියදී එකවර ජල මට්ටම වැඩි වී තිබෙන අතර, යුද හමුදාවේ සහ පොලිසියේ සහාය ඇතිව ඔවුන් සොයා මෙහෙයුම් ක්‍රියාත්මක කරන බව හල්දුම්මුල්ල පොලිසිය පවසයි.

# සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාව සමඟ එක්ව ජනපති අලුත් අවුරුදු උදාව සමරයි



සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාව සමඟ එක්ව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මිරිහානේ පිහිටි සිය නිවෙසේ සිට අලුත් අවුරුදු චාරිත්‍ර ඉටු කළේය. ජනාධිපතිවරයා, අයෝමා රාජපක්ෂ මහත්මිය සහ පවුලේ සාමාජිකයෝ චිරාගත සිරිතට අනුව චාරිත්‍ර ඉටු කරමින් අලුත් අවුරුදු උදාව සැමරූහ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අයෝමා රාජපක්ෂ මහත්මිය වැඩ ඇල්ලීමේ නැකතට සිය නිවෙස පරිශ්‍රයේ පැළයක් රෝපණය කළහ.



## රට වැසියන්ට සුබ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින්
# අගමැති ඇතුළු පවුලේ සාමාජිකයෝ
## කාල්ටන් නිවෙසේදී නැකතට කිරි උතුරවති





සමස්ත රට වැසියන්ට සුබ අලුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතා, අගමැති ආර්යා ශිරන්ති රාජපක්ෂ මහත්මිය ඇතුළු පවුලේ සාමාජිකයෝ තංගල්ල කාල්ටන් නිවෙසේදී පෙරේදා (14) නැකතට කිරි උතුරවමින් අලුත් අවුරුදු නැකත් චාරිත්‍රවල නිරත වූහ.

පලා පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා ආහාර පිසීම, වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය කිරීමේ චාරිත්‍ර මෙලෙස අගමැතිවරයා ඇතුළු පවුලේ සාමාජිකයෝ එක්ව ඉටු කළහ. ඇමැති නාමල් රාජපක්ෂ සහ අගමැති කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ පුතුන් මෙන්ම අගමැතිවරයාගේ මුනුපුරු කේෂර රාජපක්ෂ සහ ලේලිවරුන් වන ලිමිණි රාජපක්ෂ සහ නිතීෂා රාජපක්ෂ මහත්මීහු ද අවුරුදු නැකත් චාරිත්‍ර සඳහා එක් වූහ. සෞඛ්‍ය මාර්ගෝපදේශවලට යටත්ව එම මාර්ගෝපදේශයන්ට ගරු කරමින් අගමැති ඇතුළු පවුලේ සාමාජිකයන් මෙවර අලුත් අවුරුදු චාරිත්‍රවල නිරතවීම විශේෂත්වයකි.

සිංහල දෙමළ අලුත් අවුරුද්ද සාමය සතුට හා සහජීවනයේ සංකේතයක් යැයි කී අගමැති මහින්ද රාජපක්ෂ මහතා සමස්ත රට වැසියන්ටම නීරෝගිමත් සුබ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරන බව පැවසීය.

කාල්ටන් නිවෙසට වැඩම කළ මහා සංඝරත්නය රාජපක්ෂ මහතා ඇතුළු පවුලේ සාමාජිකයන්ට සහ සමස්ත රට වැසියන්ට සෙත් පිරිත් සජ්ඣායනා කරමින් ආශිර්වාද එක් කළහ. මෙම අවස්ථාවට අගමැතිවරයා ඇතුළු පවුලේ සාමාජිකයෝ සහ සමීපතයෝ පිරිසක් එක්ව සිටියහ.

## ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරු
# තංගල්ල කාල්ටන් නිවෙසට අවුරුදු නෑගම් යති





කැවිලි පෙවිලි රැගෙන තංගල්ල කාල්ටන් නිවෙසට අවුරුදු නෑගම් පැමිණි ආණ්ඩු පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන්ව අගමැති මහින්ද රාජපක්ෂ මහතා පසුගිය දා (13) උදෑසන ඉතා සුහදව පිළිගත්තේය.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු පවුලේ සැමට උදා වන සිංහල, දෙමළ අලුත් අවුරුද්දට සුබ පැතුම් එක්කිරීම සඳහා ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරු මෙලෙස කාල්ටන් නිවෙසට පැමිණ සිටියහ. සිංහල සිරිතට මුල්තැන දෙමින් අලුත් අවුරුදු උදාව පවුලේ ඥාති හිත මිත්‍රාදීන් හා ගම් වැසියන් සමඟ සිය නිවෙසේ සිට සැමරීම අගමැතිවරයා ඇතුළු පවුලේ සාමාජිකයන්ගේ සිරිතකි.

නෑගම් පැමිණි ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරුන් සමඟ සුහද කතා බහක නිරත වූ අගමැති මහින්ද රාජපක්ෂ මහතා මන්ත්‍රීවරුන්ට සහ ඔවුන්ගේ පවුලේ සමාජිකයන්ට මෙන්ම සමස්ත රට වැසියන්ටත් සුබ අලුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කෙළේය.

මේ අවස්ථාවට රාජ්‍ය ඇමැතිවරුන් වන සුසිල් ප්‍රේමජයන්ත, ලෝහාන් රත්වත්තේ, ජානක වක්කුඹුර මහත්වරු ද එක්ව සිටියහ.

## රුපියල් පන්දහසක දීමනාව රාමසාන් උපවාසය
# ආරම්භ කරන අඩු ආදායම්ලාභි මුස්ලිම් ජාතිකයන්ටත් පිරිනමනවා
## රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ

**අනුරාධපුර අතිරේක**

කොරෝනා ව්‍යසනය හේතුවෙන් දැඩි අසීරුතාවන්ට පත් පවුල් ඒකක සඳහා සිංහළ, දමිළ අලුත් අවුරුද්ද වෙනුවෙන් ලබා දෙන රුපියල් පන්දහසක දීමනාව රාමසාන් උපවාසය ආරම්භ කරන අඩු ආදායම් ලාභි මුස්ලිම් ජාතිකයන්ට ද ලබා දිම සිදු කරන බව සමෘද්ධි කටයුතු හා මුදල් රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා ප්‍රකාශ කෙළේය.

ආණ්ඩුව මඟින් ලබා දීමට පියවර ගෙන ඇති රුපියල් පන්දහසේ දීමනාව පිළිබඳ මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඊයේ (15) ඇමැතිවරයා මේ බව පැවසීය.

එහිදි තවදුරටත් ඇමැතිවරයා මෙසේද පැවසීය.

අපි රටක් හැටියට ආණ්ඩුවක් හැටියට සියලුම ආගම් සියලුම් ජාතින් නියෝජනයවන ලෙස අවශ්‍ය පසුබිම නිර්මාණය කර තිබෙනවා.අප්‍රේල් මස 12-13 දිනයන්හි රුපියල් පන්දහසේ දිමානාව සමෘද්ධි ලාභින් හා අඩු ආදායම් ලාභි පවුල් ඇතුළු කාණ්ඩ හතකට ලබා දිමක් සිදු කළා.ඒ අනුව දහතුන් වැනි දා වනවිට ලක්ෂ දහඅටකට අධික පවුල් ඒකක සංඛ්‍යාවකට රුපියල් මිලියන නව දහසක් ලබාදිමට කටයුතු කර තිබෙනවා. කොරෝනා ව්‍යසනය හේතුවෙන් දැඩි අසීරුතාවයන්ට පත් පවුල් ඒකක සඳහා රුපියල් 5,000ක දීමනාවක් පිරිනැමීමට ආණ්ඩුව පියවර ගත්තා. මෙහිදි සමෘද්ධි සහා අඩු ආදායම්ලාභීන්ට අමතරව වැඩිහිටි දිමානාව ලබන පුද්ගලයන්, වකුගඩු දිමනාව ලබන පුරවැසියන්, ආබාධිත දිමනාව ලබන පුරවැසියන්, සියවස් සම්පුර්ණ පුරවැසියන් ආදි සියලු දෙනා ද මෙම දිමනාව ලැබිමට සුදුසු පුද්ගලයන් ලෙස නම් කර තිබෙනවා. ඒ සමඟ ඊයේ දින සිට නැවත රුපියල් පන්දහසේ දිමනාව හිමිකම් තිබෙන ලබා ගැනිමට නොහැකි වු අයට ලබා ගැනිමට හැකියාව පවතිනවා. මෙය ලබා ගැනිමට අවසන් දිනයක් නැහැ. සමහර අය අවුරුද්දට ගම්බිම් බලා ගිහින් තිබෙනවා, ඥාති මිත්‍රාදින් නිවෙස් වලට ගිහින් තිබෙනවා. ඒ නිසා ඔවුන් පැමිණි පසුව ඔවුන්ට පුළුවන් සමෘද්ධි බැංකු වලට හා සමෘද්ධි නිලධාරින් හමුවි ඔවුන්ගේ හිමිකම අනුව ලබා එය ගැනිමට.

අපි හිතනවා මේ වැඩපිළිවෙළ අසාර්ථක කරන්න පටු දේශපාලන මතවාදවල සිටි කණ්ඩායම් බලාපොරොත්තු වුණා.හැබැයි මේ අය බලා පොරොත්තු වුණේ ආණ්ඩුව අපහසුතාවට පත්කිරීම හා තමන්ගේ තිබෙන දුෂ්ටකම ප්‍රදර්ශනය කිරීමයි. මේ මේ රටේ අහිංසක, දුප්පත් දිළිදු ජනතාවට මේ පන්දහස පිරිනැමීමට කටයුතු කරන අවස්ථාවක්.

# රාජ්‍ය ඇමැති විදුරගේ ප්‍රධානත්වයෙන් උතුරු - නැඟෙනහිර මන්ත්‍රීවරුන් පුරාවිද්‍යා නිලධාරීන් අතර සාකච්ඡාවක්



**උපාලි කරුණාරත්න**

උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන් නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතර සාකච්ඡාවක් ජාතික උරුම ප්‍රසංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියාදා අමාත්‍යාංශයේදී පැවැත් විණි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් මෑත කාලයේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල සිදුකරනු ලබන කැණීම් කටයුතු සම්බන්ධයෙන් දේශපාලනඥයන්ට මතුව ඇති ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම මෙම හමුවේ අරමුණ විය.

වර්තමානයේ සිදු කරනු ලබන කැණීම් කටයුතු සහ ඒවා සිදුකරන ආකාරය පිළිබඳ පුරාවිද්‍යා නිලධාරීන් විසින් මන්ත්‍රීවරුන්ට මෙහිදී පැහැදිලි කරන ලදී. මතුව තිබෙන ගැටලු පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය.

උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි ජීවත් වන ජනතාව සඳහා පුරා විද්‍යාත්මක ස්ථානයන් පිළිබඳ සහ එහි වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් කඩිනමින් ආරම්භ කරන බව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය අනුර මනතුංග මහතා මෙහිදී සඳහන් කෙළේය. ගැටලුකාරී තත්ත්වයන් මතුව ඇති කැණීම් සහ ගවේෂණ කටයුතු සිදු කරන ස්ථානයන් වෙත පැමිණෙන ලෙස මෙම අවස්ථාවට සහභාගි වූ මන්ත්‍රීවරුන් රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතාගෙන් ඉල්ලා සිටි අතර කඩිනමින් අදාළ ස්ථාන වෙත පැමිණෙන බව මෙහිදී ඇමැතිවරයා පැවැසීය. එමෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි සිටින පුරාවිද්‍යා උපාධිධාරීන් පිළිබඳව ද මෙහිදී අවධානය යොමු විය.

මන්ත්‍රීවරුන් වන අංගජන් රාමනාදන්, ශිවනාදන් සිරිදරන්, සෙල්වරාජා ගජේන්ද්‍රන්, සෙල්වම් අඩෛක්කලනාදන්, එස්. මනොරත්තලිංගම්, චාල්ර්ස් නිර්මලනාදන්, එස්.එම්.එම්. මුශාරෆ්, සුරේන් රාඝවන් මහත්වරු සහ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු නිලධාරීහු රැසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

sports.dinamina@lakehouse.lk

# ව්‍යවස්ථා සංශෝධනය නිසි පරිදි නොවීම හේතුවෙන් පාපන්දු නව නිලධාරි ආයු කාලය වසරකට සීමා වෙයි



ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ ව්‍යවස්ථාව අනුව එළඹෙන මැයි 30 වැනිදා පැවැත්වීමට නියමිත පාපන්දු නිලවරණයෙන් පත්වන නව නිලධාරී මණ්ඩලයේ ධුර කාලය වසරකට සීමා වන බව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ අමල් එදිරිසූරිය මහතා පවසයි. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ සභාපති අනුර ද සිල්වා මහතා වෙත ලිපියක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ පාපන්දු නිලවරණය පිළිබඳ සවිස්තර වාර්තාවක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට යොමු කරන ලෙසයි.

දැනට සිටින පාපන්දු ප්‍රධානීන් වසර 2017 සිට මේ දක්වා කටයුතු කරමින් සිටින අතර, ඒ සඳහා ද උපයෝගි කොට ඇත්තේ දැනට පවතින ව්‍යවස්ථාව බැවින් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මේ දැනුම්දීමත් සමඟ පාපන්දු ක්ෂේත්‍රයේ කැලඹීමක් හටගෙන ඇත. දැනට සිටින නිලධාරීන් වසර 4කට ආසන්න කාලයක් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ නිලතල දැරුවේ කෙසේද යන්න පාපන්දු ක්‍රීඩා සමාජ හා පාපන්දු ලීග ප්‍රශ්න කරමින් සිටින බව වාර්තා වේ. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලන ව්‍යවස්ථාව නිසි ක්‍රමවේද යටතේ සංශෝධනය නොවීම හේතුවෙන් මේ තත්ත්වය උදා වී ඇතැයි ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ අමල් එදිරිසූරිය මහතා 'දිනමිණ'ට පැවසීය.

"ක්‍රීඩා රෙගුලාසි අනුව වසර 4ක කාලයක් ඕනෑම ක්‍රීඩා සංගමයක ප්‍රධානියකුට ධුර කාලය හිමි වෙනවා. නමුත් ක්‍රීඩා සංගම් තම තමන්ගේ ව්‍යවස්ථාව ක්‍රීඩා පනත අනුව සංශෝධනය කර ගත යුතුයි. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලන ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ වසරක කාලයක් සඳහා නිලතල පත් වන බවයි. පාපන්දු සම්මේලනය ව්‍යවස්ථාව නිසි ක්‍රමවේද අනුව සංශෝධනය කරගෙන නෑ" එදිරිසූරිය මහතා සඳහන් කළේය.

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ නිලවරණය උදෙසා දැන් සිටම එහි මුල් පුටු සටනට පාර්ශ්ව කිහිපයක් කඳවුරු බැඳ ඇති අවස්ථාවක මේ ලිපිය නිකුත්වීම විශේෂත්වයකි. වත්මන් සභාපති අනුර ද සිල්වා මහතා හා ලේකම් යූ.එල්. ජස්වර් මහතා වෙන වෙනම පාර්ශ්ව දෙකකට බෙදී මෙවර නිලවරණය සඳහා සූදානම් වෙමින් සිටිති. අනුර ද සිල්වා මහතාගේ සහයෝගයෙන් පාපන්දු වෛද්‍ය කමිටු සභාපති වෛද්‍ය මනිල් ප්‍රනාන්දු මහතා තරගයට පිවිස සිටින අතර, යූ.එල්. ජස්වර් මහතා ද මුල්පුටු සටනට පිවිස සිටී.

පත්වන නව නිලධාරී මණ්ඩලය අන්තර්ජාතික පාපන්දු සම්මේලනයේ හා ආසියානු පාපන්දු සම්මේලනයේ නීති රෙගුලාසි අනුව ව්‍යවස්ථාව වෙනස් කර ගත යුතු අතර, එසේ නොහැකි වුවහොත් ලබන වසරේ යළිත් නිලවරණය පැවැත්විය යුතු වේ. අන්තර්ජාතික පාපන්දු සම්මේලනයේ හා ආසියානු පාපන්දු සම්මේලනයේ නීති රෙගුලාසි අනුව වෙනස් කරන පාපන්දු ව්‍යවස්ථාව ක්‍රීඩා පනත අනුව මෙරට නීතියට ගැළපෙන අයුරින් සකස් කළ බවට ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතිය ගැනීම ද අනිවාර්ය වේ.

අන්තර්ජාතික නීති රෙගුලාසි අනුව සකස් කර ගන්නා අවසන් ව්‍යවස්ථා කෙටුම්පත පාපන්දු විධායක සභාවට යොමු කොට විශේෂ මහා සභාවකින් අනුමත කොට ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු වේ. මෙයට වසර 4කට පමණ පෙර පැවැති පාපන්දු නිලවරණය ද නව ව්‍යවස්ථා කෙටුම්පත සම්මත කිරීමෙන් අනතුරුව සිදු කරන ලෙස අන්තර්ජාතික පාපන්දු සම්මේලනය දන්වා තිබූ අතර, එහිදී සාධාරණ කාලයක් ශ්‍රී ලංකාවෙන් ඉල්ලා තිබිණි. ඒ අනුව වසර 2017දී පැවැති නිලවරණයෙන් අනතුරුව පාපන්දු ව්‍යවස්ථාව සැකසීම ආරම්භ කෙරුණු අතර, පසුගිය නොවැම්බර් මාසයේ අවසන් ව්‍යවස්ථා කෙටුම්පත අන්තර්ජාතික පාපන්දු සම්මේලන වෙත ඉදිරිපත් කර ඇත.

පාපන්දු ව්‍යවස්ථාව සැකසීම උදෙසා අන්තර්ජාතික පාපන්දු සම්මේලනයේ හා ආසියානු පාපන්දු සම්මේලනයේ නීති දෙපාර්තමේන්තුවල නිලධාරීන් මෙරටට පැමිණ පාපන්දු සම්මේලනයේ විධායක සභිකයන් හා පාපන්දු ලීග් ප්‍රධානීන් හමු වී අදහස් හුවමාරු කර ගත්හ. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ ඉදිරි නිලවරණයේදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මහනුවර, කුරුණෑගල හා අක්කරපත්තු යන පාපන්දු ලීග් 4ක ඡන්ද අයිතිය අහෝසි කොට ඇති බැවින් ලියාපදිංචි පාපන්දු ලීග් ගණන 66ක් බවට පත් වෙයි. එක් පාපන්දු ලීගයකට ඡන්ද 3 බැගින් හිමි වන අතර, පාපන්දු සම්මේලන නිලවරණයේදී ඡන්ද 198ක් ප්‍රකාශයට පත්වීමට නියමිතය.

## ස්ටෝක්ස්ට දෙවැනි වරටත් විස්ඩන් ගෞරව



විස්ඩන් වසරේ ප්‍රමුඛතම ක්‍රිකට් ක්‍රීඩකයා බවට පත් වීමට එංගලන්තයේ තුන් ඉරියව් ක්‍රීඩක බෙන් ස්ටෝක්ස් පිට පිට දෙවැනි වතාවටත් සමත් විය. එවැනි ගෞරවයක් දිනූ පළමු එංගලන්ත ක්‍රීඩකයා ද ඔහුය. පසුගිය වසරේදී ඔහු ලකුණු 58.27ක සාමාන්‍යයක් රඳවා ගනිමින් ටෙස්ට් පිටියේ ලැබූ සමස්ත ලකුණු සංඛ්‍යාව 641කි. එමෙන්ම කඩුලු 19ක් දවාලීමට සමත් වී ඇත්තේ 18.73ක සාමාන්‍යයක් රඳවා ගනිමිනි.

විස්ඩන් වසරේ ක්‍රිකට් ක්‍රීඩකයා තේරීම සියවසකට අධික කාලයක් පුරා සිදු වූවත් වසරේ ප්‍රමුඛතම ක්‍රිකට් ක්‍රීඩකයා තේරීම ආරම්භ වූයේ 2003 වසරේදීය. මීට පෙර කිසිදු එංගලන්ත ක්‍රීඩකයකු විස්ඩන් වසරේ ප්‍රමුඛතම ක්‍රීඩකයා ලෙස දෙවරක් ගෞරව ලබා නැති අතර, 2005දී ඇන්ඩෘ ෆ්ලින්ටොෆ් එම ගෞරවයට පත් වූවාට පසු එම ලැයිස්තුවට එක්වූ පළමු එංගලන්ත ක්‍රීඩකයා ද වේ. ඒ අනුව ඔහු වසර 2019 සහ 2020 දෙවතාවෙහිම එම ගෞරවයට පාත්‍ර වූයේ ඊට පෙර 2016, 2017 සහ 2018 අඛණ්ඩව එම ගෞරවය දිනා ගනිමින් සිටි ඉන්දීය පිලේ නායක විරාට් කෝලිගේ වාර්තාගත ගමන් මඟ අහුරා දමමිනි.

## බංග්ලාදේශ ක්‍රිකට් පිල හෙට වැඩට බහී

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වී සිටින බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායම සිය පළමු සහ එකම පුහුණු තරගය සඳහා හෙට (17) පිටියට පිවිසෙයි.මේ තරගය කටුනායක හලාවත මේරියන්ස් ක්‍රීඩාංගණයේදී දෙදින තරගයක් ලෙස පැවැත්වේ. ලෝක ටෙස්ට් ශූරතාවලිය යටතේ පැවැත්වීමට නියමිත තරග 2 කින් සමන්විත ටෙස්ට් තරගාවලිය වෙනුවෙන් බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායම විශේෂ ගුවන් යානයකින් පසුගිය 12 වැනි දින මෙරටට පැමිණි අතර, දින කීපයක් නවාතැන් ගෙන සිටින හෝටලයේදී නිරෝධායනය වීමෙන් පසු මේ තරගයට එක් වේ.

බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායමේ සියලු ක්‍රීඩකයන් කටුනායක ගුවන්තොටුපොළේදී පීසීආර් පරීක්ෂණයකට ලක් කළ බවත් එම වාර්තා සියල්ල කිසිදු ගැටලුවකින් තොර බවත් ශ්‍රී ලංකා ක්‍රිකට් කළමනාකරණ කමිටු සභාපති මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා පැවසීය. විශේෂයෙන්ම බංග්ලාදේශ පිලේ සියලු ක්‍රීඩකයන් කොරෝනා මර්දන එන්නතේ මාත්‍රා දෙකම ලබාගෙන ඇති හෙයින් කොරෝනා සම්බන්ධ ගැටලුවක් මතු නොවනු ඇතැයි මහාචාර්යවරයා 'දිනමිණ'ට පැවසීය.

මේ දෙදින පුහුණු තරගයෙන් පසුව බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායම මහනුවර බලා පිටත්ව යෑමට නියමිතය. ටෙස්ට් තරග දෙකම මහනුවර පල්ලෙකැලේ අන්තර්ජාතික ක්‍රීඩාංගණයේදී ජෛව බුබුළක ආකාරයෙන් පැවැත්වෙන අතර, බාහිර පාර්ශ්ව සමඟ සම්බන්ධතා පැවැත්වීමට නොහැකි වනසේ විශේෂ ආරක්ෂාවක් ද දී ඇත. දෙරට අතර, පළමු ටෙස්ට් තරගය මේ මස 21 වැනිදා සිට 25 වැනිදා දක්වා පැවැත්වෙන අතර, දෙවැනි ටෙස්ට් තරගය 29 වැනිදා සිට මැයි 03 වැනිදා දක්වා පැවැත්වෙනු ඇත.

මොමිනුල් හක්ගේ නායකත්වයෙන් පැමිණ සිටින බංග්ලාදේශ කණ්ඩායමට ක්‍රීඩකයෝ 21ක් එක්ව සිටින අතර, එම කණ්ඩායමේ තවමත් ටෙස්ට් වරම් නොලැබූ ක්‍රීඩකයන් දෙදෙනකු ද සිටිති. මේ තරගාවලිය මීට පෙර ඉකුත් 2020 වසරේ ඔක්තෝම්බර් සහ නොවැම්බර් යන මාසවලදී පැවැත්වීමට කටයුතු යොදා තිබූ අතර, කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එය කල් දැමීමට සිදු විය.



බංග්ලාදේශ වේග පන්දු යවන ක්‍රීඩක තයිජුල් ඉස්ලාම් ඊයේ කටුනායක ක්‍රීඩාංගණයේ පන්දු යවමින් සිටි අයුරු.

## කෝලි පසු කර බාබර් ඉහළට

අයිසීසීය සිදු කළ ජගත් එක්දින ක්‍රිකට් පිටියේ පිතිකරුවන් ශ්‍රේණිගත කිරීම්වල පෙරමුණ ගැනීමට පාකිස්තාන ක්‍රිකට් නායක බාබර් අසාම් සමත් වෙයි.

අයිසීසීය විසින් පසුගියදා නිකුත් කළ මේ ශ්‍රේණිගත කිරීම් අනුව දීර්ඝ කාලයක් පෙරමුණෙ ගෙන සිටි ඉන්දීය නායක විරාට් කෝලිට දෙවැනි ස්ථානය දක්වා පහත වැටීමට සිදුව තිබේ.

දකුණු අප්‍රිකානු පිල සමඟ පැවැති එක්දින තරගාවලියේ දැක්වූ දස්කම් මත බාබර් පළමු ස්ථානයට පත් වූයේ ප්‍රසාද ලකුණු 865ක් සමගිනි. ඔහුගේ වෘත්තීය ක්‍රිකට් දිවියේ ලබාගත් ඉහළම ලකුණු සංඛ්‍යාව එය වෙයි. මේ හේතුවෙන් කෝලි දෙවැනි ස්ථානය දක්වා පහත වැටුණේ වසරේ 2017 ඔක්තෝබර් මාසයෙන් පසුවය.

පිතිකරුවන් ශ්‍රේණිගත කිරීම්වල පෙරමුණගත් සිව්වැනි පාකිස්තාන ක්‍රීඩකයා වන්නේ බාබර්ය. ඔහුට පෙර සහීර් අබ්බාස්, ජාවෙඩ් මියන්ඩාඩ් සහ මොහොමඩ් යුසුෆ් ද එම ස්ථානය අත් කර ගෙන තිබිණි.



බාබර් අසාම්

## පාකිස්තානයෙන් යළිත් ඉහළම හඹා යෑමක්

බාබර් අසාම්ගේ නායකත්වයේ ඉනිම හේතුවෙන් දකුණු අප්‍රිකානු පිල සමඟ සෙන්චූරියන්හිදී පැවැති තෙවැනි විස්සයි20 තරගයෙන් කඩුලු 9ක ජයක් අත් කර ගැනීමට සංචාරක පාකිස්තාන කණ්ඩායම සමත් වූයේ තරග 4කින් සමන්විත තරගාවලියත් 2-1ක් ලෙස පෙරමුණ ගනිමිනි.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් පාකිස්තානය කඩුලු 5ක් දැවී ලකුණු 203ක් රැස් කළ අතර, වාර්තාගත හඹා යෑමක නිරත වූ පාකිස්තානය පන්දු 12ක් ඉතිරිව තිබියදී ජය හිමි කර ගත්තේ කඩුල්ලක් පමණක් දැවී තිබියදීය. මේ හඹා යෑම වාර්තා අතරට එක් වූයේ පාකිස්තාන පිල විස්සයි20 තරගයකදී හඹා ගොස් ජයගත් ඉහළම ඉලක්කය ලෙසයි. විශිෂ්ට පිතිහරඹයක නිරත වූ බාබර් අසාම් මංගල විස්සයි20 ශතකය ලෙස ලකුණු 122ක් රැස් කළ අතර, පළමු කඩුල්ලට මොහොමඩ් රිස්වාස් සමඟ එක්ව ලකුණු 197ක විශිෂ්ට සබඳතාවක් ගොඩනැඟීමට ද ඔහුට හැකි විය. හතරේ පහර 15ක් සහ හයේ පහර 4කින් ඉනිම වර්ණවත් කර ගත් අසාම් පන්දු 59ක් පමණක් වැය කළ අතර, හතරේ පහර 5ක් සහ හයේ පහර 2ක් සමඟින් රිස්වාස් ලකුණු 73ක් රැස් කළේ පන්දු 47කිනි.

ජනෙමන් මාලන් (55) සහ ඒඩ්න් මාක්‍රම් (63) අර්ධ ශතක රැස් කරමින් පළමුව පන්දුවට පහර දුන් දකුණු අප්‍රිකානු පිලේ පළමු කඩුල්ලට ලකුණු 108ක සබඳතාවක් ගොඩනැඟූහ. පන්දු 40කට මුහුණ දුන් මාලන් පන්දු 40කදී හතරේ පහර 5ක් සහ හයේ පහර 2ක් එල්ල කළ අතර, හතරේ පහර 6ක් සහ හයේ පහර 4ක් එල්ල කළ මාක්‍රම් පන්දු 31කට මුහුණදී තිබිණි.

## හීත් ස්ට්‍රීක්ට වසර 8ක් ක්‍රිකට් තහනම්

අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයේ දූෂණ විරෝධී නීති සංග්‍රහය උල්ලංඝනය කරමින් ක්‍රීඩකයන්ගේ තොරතුරු හා දුරකතන අංක පිටස්තර පුද්ගලයකුට පිරිනමා අල්ලස් ගත් සිම්බාබ්වේ පිලේ හිටපු නායක හීත් ස්ට්‍රීක් වසර 8කට ක්‍රිකට් ක්‍රීඩාව තහනම් කිරීමට අයිසීසීය පියවර ගත්තේය.

47 හැවිරිදි හීත් ස්ට්‍රීක් සිම්බාබ්වේ පිලේ සහ ආසියානු කලාපයේ පැවැති විවිධ විස්සයි20 ලීග් තරග බිමේ පුහුණුකරුවකු ලෙස කටයුතු කළ කාලයේ ඉන්දීය ජාතික බුකීකරුවකු සමඟ සම්බන්ධතා පැවැත්වූ බවට වාර්තා වේ.

එම කාලයේදී ඔහු තරග තොරතුරු, ක්‍රීඩකයන්ගේ තොරතුරු හා දුරකතන අංක පිටස්තර පුද්ගලයාටදී ඇති අතර, ඒ වෙනුවෙන් ඔහුගේ බිරියට නවීන පන්නයේ iPhone ජංගම දුරකතනයක් සහ අන්තර්ජාල මුදල් ඒකකයක් වන බිට්කොයින් දෙකක් (එකක වටිනාකම ශ්‍රී ලංකා මුදලින් එක් කෝටි විසිපන්ලක්ෂයක්) ලැබී තිබේ.

## අන්තර් සමාජ එක්දින පිටියේ නවකයෝ වැඩ පෙන්වති

නිරෝෂාන් ප්‍රියංකර

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මෙහෙයවීමෙන් කණ්ඩායම් 26කගේ සහභාගිත්වයෙන් පැවැති අන්තර් සමාජ එක්දින ක්‍රිකට් තරගාවලිය පසුගියදා නිමාවට පත් වූයේ එන්සීසී කණ්ඩායම ශූරයන් බවට පත් කරමිනි.

මූලික වටයේ තරග 72ක් සමඟ සම්පූර්ණ තරග 79කින් සමන්විතව පැවැති මේ තරගාවලියේදී තවමත් ජාතික කණ්ඩායම නියෝජනය කර නැති නවක ක්‍රීඩකයන් රැසක් දස්කම් අතරට පිවිසීම කැපී පෙනෙන කරුණක් විය.



ජනිත් ලියනගේ

රාගම ක්‍රීඩා සමාජය නියෝජනය කළ 25 හැවිරිදි ජනිත් ලියනගේ තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස සම්මාන ලැබීය. ඔහු තරග 8කදී ශතකයක් සහ අර්ධ ශතක 3ක් සමඟින් ලකුණු 461ක් රැස් කිරීමට සමත් වූ අතර, එස්එස්සී ක්‍රීඩා සමාජයේ චරිත් අසලංක තරගාවලියේ දක්ෂතම පිතිකරු ලෙස සම්මාන දිනා ගත්තේ ලකුණු 361ක් රැස් කරමිනි. එස්එස්සී පිල අර්ධ අවසන් වටයෙන් ඉවත් වීම හේතුවෙන් අසලංකට ක්‍රීඩා කළ හැකි වූයේ තරග 7කට පමණි.



චරිත් අසලංක

රාගම ක්‍රීඩා සමාජයේ බිනුර ප්‍රනාන්දු දක්ෂතම පන්දු යවන්නා ලෙස සම්මාන දිනා ගත්තේ තරග 8කදී කඩුලු 23ක් බිඳ දමමිනි. මේ ක්‍රීඩකයන් තිදෙනාම තවමත් ජගත් එක්දින තරග වරම් දිනා නැති අතර, බිනුර ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විස්සයි20 තරග 2කට පමණක් ක්‍රීඩා කර ඇත.

තරගාවලියේ වැඩිම ලකුණුලාභීන් 10 දෙනා අතරින් ජනිත් සමඟ 5 දෙනකුම තවමත් ජගත් පිටියට එක්ව නැත. දෙවැනි තැන පසුව කමිල් මිෂාර (එන්සීසී), යුද හමුදාවේ හිමාෂ ලියනගේ (5), චරිත් අසලංක (7) සහ ප්‍රමෝද් මධුවන්ත (සැරසන්ස්) ඔවුන් අතර වෙති. මෙවර තරග වාරයේ ශතක 3ක් රැස් කළ එකම පිතිකරු වන මිෂාර තරග 8කදී ලකුණු 437ක් රැස් කළ අතර, තෙවැනි තැන පසු වන ඇන්ජෙලෝ පෙරේරා (එන්සීසී) රැස් කර ඇති ලකුණු සංඛ්‍යාව 389කි. සඳුන් වීරක්කොඩි (389), හිමාෂ ලියනගේ (381), චතුරංග ද සිල්වා (364), චරිත් අසලංක (361), මහේල උඩවත්ත (354), තිසර පෙරේරා (322) සහ ප්‍රමෝද් මධුවන්ත (314) ලකුණු ලාභීන් අතර, සිව්වැනි ස්ථානයේ සිට 10 වැනි ස්ථානය දක්වා රැඳී සිටිති.

පන්දු යවන්නන්ගේ දස්කම් අතර, බිනුර සමඟ මුල් ස්ථාන 10 දිනාගත් ක්‍රීඩකයන්ගෙන් 7 දෙනකුම ජගත් එක්දින තරග වරම් හිමි කර ගෙන නැති ක්‍රීඩකයෝ වෙති.

බදුරලිය ක්‍රීඩා සමාජයේ අලංකාර අසංක සිල්වා සමඟ ඉෂාන් ජයරත්න (රාගම) කඩුලු 18ක් බැගින් බිඳ දමමින් පන්දු යවන්නන් අතර, දෙවැනි සහ තෙවැනි ස්ථාන අත් කර ගත්හ. සිව්වැනි තැන පසු වන ප්‍රභාත් ජයසූරිය (එස්එස්සී) දවාගත් කඩුලු සංඛ්‍යාව 16කි. දුෂාන් විමුක්ති (යුද හමුදා), චමින්ද බණ්ඩාර (සැරසන්ස්) සහ ප්‍රවීන් ජයවික්‍රම (මුවර්ස්) කඩුලු 15 බැගින් දවාගෙන ඇති අතර, එන්සීසී ක්‍රීඩා සමාජයේ චාමික කරුණාරත්න සහ ළහිරු කුමාර කඩුලු 14 බැගින් බිඳ දමා තිබේ. කරුණාරත්න ශ්‍රී ලංකා පිල වෙනුවෙන් ටෙස්ට් තරගයකට පමණක් ක්‍රීඩා කර ඇති අතර, චමින්ද බණ්ඩාර එක්දින තරගයක්, ප්‍රභාත් එක්දින තරග 2ක් සහ කුමාර එක්දින තරග 13කදී ශ්‍රී ලංකා පිල නියෝජනය කර ඇත.

මුවර්ස් ක්‍රීඩා සමාජයේ ඩිලේෂ් ගුණරත්න සමඟ තවත් ක්‍රීඩකයන් තිදෙනෙක් කඩුලු 13ක් බැගින් දවා ගෙන ඇත.



බිනුර ප්‍රනාන්දු




# ඇතැම් නාලිකාවල අද තිබෙන්නේ සිංහල ඉංග්‍රීසි දෙකම නොවන 'සිංගිලිෂ්'

## රජරට ගුවන් විදුලි පරිශ්‍රයේ නව රංග ශාලාවේ ඉදි කිරීම් අරඹමින් ජනමාධ්‍ය ඇමැති කියයි

**අමිල ප්‍රභාත් වනසිංහ**
**අනුරාධපුර අතිරේක**

රාජ්‍ය මාධ්‍යට සංස්කෘතික රකවරණයක් අවශ්‍යයි. ඇතැම් නාලිකාවල සිංහල ඉංග්‍රීසි දෙකම නොවෙයි සිංගිලිෂ් තියෙන්නේ. ඒත් ඒවාටත් රුචි කරන පිරිසක් ඉන්නවා.ඒ නිසා අපට ඒක මුළුමනින්ම බැහැර කරන්න බැහැ. මේක තමා සංකීර්ණත්වය කියන්නේ යැයි ජනමාධ්‍ය ඇමැති, ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා සඳහන් කළේය.

අනුරාධපුර රජරට ගුවන් විදුලි පරිශ්‍රයේ ඉදිකරන නව රංග ශාලාවේ වැඩ ආරම්භ කිරීමේ අවස්ථාවට එක්වීමෙන් අනතුරුව පැවති උත්සව සභාවේදී ඇමැතිවරයා පසුගියදා මේ බව පැවසීය.

අනුරාධපුර රජරට ගුවන් විදුලි පරිශ්‍රයේ ඉදිකෙරෙන මේ රංග ශාලාව මාස අටක කාලයකදී ඉදි කර අවසන් කිරීමට නියමිතය. මේ රංග ශාලාව අතිනවීන ආලෝක හා ශබ්ද උපකරණ පද්ධතියකින් සමන්විත වන අතර ප්‍රේක්ෂකයන් අටසිය පනහකට එකවර අසුන් ගැනීමේ පහසුකම්වලින් සමන්විතය. මේ සඳහා ප්‍රංස ආධාර යටතේ රුපියල් මිලියන 170ක පමණ මුදලක් වැය කෙරේ.එහිදී තවදුරටත් ඇමැතිවරයා මෙසේද පැවසීය.

මේ වන විට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මුල්‍යමය වශයෙන් ශක්තිමත් නැහැ. ඒකට අපි සියලු දෙනාම වග කිව යුතුයි. මෙවැනි තත්ත්වයක්

### එදා ගමම අහපු මුවන්පැලැස්සේ හිටපු කදිරගෙ චරිතය චිත්‍රපටියකින් මවන්න බෑ:

යටතේ ප්‍රංස ආධාර මගින් මේ රංග ශාලාව ඉදිකිරීම් ආරම්භ කිරීම සතුටක්.ඒ වගේම මේ ඉදිකිරීම් නිශ්චිත කාලරාමුවකදී ඉදිකර අවසන් කළ යුතුයි . මෙය ඉලක්කයක් කළොත් මෙය කළ හැකියි .

මම ප්‍රතිපත්තියක් වශයෙන් මුල්ගල් තියන උත්සවවලට සහභාගි වන්නේ නැහැ. වැඩේ අවසන් කළාට පසු එනවා විවෘත කරන්න.ඒක අපට විශාල තෘප්තියක්. කාලයක් තිස්සේ මුල් ගල් පැළවෙනවා. ඒ ගැන සමාජයේ විශාල විවේචනයක් තිබෙනවා.ඒ නිසා මගේ ප්‍රතිපත්තිය තමයි සාදා නිමවුවාට පසු එතැනට එන එක.

නුතනයේ අපට අභියෝග රාශියක් තිබෙනවා. අපි ඒවාට මුහුණ දෙමින් ජය ගත යුතුයි. එදා රූපවාහිනිය එනකොට කීවේ චිත්‍රපට කලාව ඉවරයි කියලා. එහෙම නැහැ. අභියෝග තියෙනවා.

ඉස්සර මුළු ගමම හවස් වෙනකොට සුදානම් වෙනවා. මුවන්පැලැස්ස අහන්න. ඒකෙ හිටපු කදිරගෙ චරිතය චිත්‍රපටියකින් මවන්න බැහැ .රාජ්‍ය මාධ්‍යයට සංස්කෘතික රකවරණයක් අවශ්‍යයි. ඇතැම් නාලිකාවල සිංහල ඉංග්‍රීසි දෙකම නෙමෙයි සිංගිලිෂ් තියෙන්නේ. නමුත් ඒවාටත් රුචි කරන පිරිසක් ඉන්නවා. ඒ නිසා අපට ඒක මුළුමනින්ම බැහැර කරන්න බැහැ.මේක තමා සංකීර්ණත්වය කියන්නේ. පාර්ලිමේන්තුවේ 225 ගැනම ජනතාව කතා කරන්නේ හොඳ නෙමෙයි.වසර දහයක පහළොවක සිට තමා මේ තත්ත්වය ඇති වුණේ.අද අපි සියලු දෙනා ස්වයං විවේචනයක් කරගෙන උත්තරීතර කියන වචනයට යටින් ඉරි දෙකක් ගහන්න පුළුවන් විදිහට කටයුතු කළයුතු බවද හෙතෙම වැඩිදුරටත් පැවසීය .

රුවන්මැලි චෛත්‍යරාමාධිපති පල්ලේගම හේමරතන නාහිමියන් ඇතුළු මහා සංඝරත්නයද, ඇමැති එස්.එම් .චන්ද්‍රසේන, පාර්ලිමේන්තු මන්ත්‍රී උද්දික ප්‍රේමරත්න, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජගත් පී. විජේවීර, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය සේවා හා සංවර්ධන) තුෂාර සන්දනායක මහත්වරුද මේ අවස්ථාවට සහභාගි වුහ.

**ඡායාරූපය - අනුරාධපුර අතිරේක**



ජනමාධ්‍ය ඇමැතිවරයා නව රංග ශාලාවේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කළ අයුරු.

# අලුත් අවුරුද්දට සුබ පතන්න හමුදාපති යාපනයට ගිහින්...

**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**

යාපනයේ සේවය කරන ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හා යාපනය අර්ධද්වීපයේ වෙසෙන ජනතාවට සිංහල හා දෙමළ අලුත් අවුරුද්දට සුභපැතුම් එක්කිරීමට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මහතා පසුගියදා යාපනය අර්ධද්වීපයේ සංචාරයක නිරත වූයේය.

හටපිරිස් ඇමතීමෙන් අනතුරුව යාපනය ආරක්ෂක සේනා ආඥාපති යාපනය අර්ධද්වීපයේ සේවය කරන ත්‍රිවිධ හමුදාවේ සියලු නිලයන් නියෝජනය කරමින් යුද, නාවික හා ගුවන් හමුදා සාමාජිකයන් තිදෙනෙකු වෙත සමරු තිළිණ ප්‍රදානය කළේය.

අනතුරුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි සහ යුද හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මහතා ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා සාමාජිකයන් විසින් නවීකරණය කරන ලද බර වාහන ට්‍රක්, ට්‍රැක්ටර්, පාපැදි සහ තුන් රෝද රථ යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය වෙත භාරදුන්නේය. පසුව, යාපනය, කිලිනොච්චිය සහ මුලතිව් ආරක්ෂක සේනා ආඥාපතිවරුන් සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී, කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමට ගනු ලබන ක්‍රියාමාර්ග හා සෞඛ්‍ය නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ ජනතාවගේ පොදු ගැටලු පිළිබඳව ද සාකච්ඡා කළේය.



# 'පාර්ක් ඇන්ඩ් රයිඩ් සිටි බස්' සේවාවේ ආදායම හොඳයි

## ලංගම සභාපති

**සුභාෂිණී සේනානායක**

කොළඹ නගරයේ රථවාහන තදබදයට විසඳුමක් ලබාදීමට හඳුන්වා දුන් "පාර්ක් ඇන්ඩ් රයිඩ් සිටි බස්" සේවාව ඉදිරි සති කීපයේ දී තවදුරටත් ව්‍යාප්ත කිරීමට ප්‍රවාහන අමාත්‍යාංශය සැලසුම් කර තිබේ.

ඒ අනුව පිළියන්දල 120 බස් මාර්ගයට සහ ගාලු පාරේ, මොරටුව - කොළඹ බස් මාර්ගයට මෙන්ම දිවයිනේ තවත් ප්‍රධාන නගර කීපයකටම ව්‍යාප්ත කිරීම සිදු කෙරෙන බව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පැවැසීය.

දැනට කොළඹ ආශ්‍රිත බස් මාර්ග 4ක පමණක් ධාවනයට යොදවා ඇති 'සිටි බස්' රථවලින් සැලකිය යුතු ආදායම් ඉපයීමක්ද සිදුවන බව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහන් කළ අතර

පාර්ක් ඇන්ඩ් රයිඩ් සිටි බස් සේවාව ඉකුත් ජනවාරි 15 වැනිදා නිල වශයෙන් ආරම්භ කෙරුණු අතර දැනට එම බස් සේවාව කොට්ටාව මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ සිට 138, 174, 112 සහ 115 යන බස් මාර්ගවල ධාවනයට යොදවා තිබේ.

මගීන්ට සිය පෞද්ගලික රථයෙන් පැමිණ එම බස් රථ සේවාවට අදාළව ස්ථාපිත කර ඇති රථගාල්වල සිය රථය නවතා සිටි බස් රථයට ගොඩ විය හැකි වන අතර මෙහි විශේෂත්වය වන්නේ එම බස් රථ සේවාවටම නිර්මාණය කෙරුණු 'සිටි බස් ' ඇප් එක හෙවත් ජංගම දුරකථන යෙදවුමෙන් බස් රථ ඇති ස්ථාන, ඊළඟට පැමිණෙන බස් රථය කුමක්ද යන්න ඇතුළු තොරතුරු රැසක්ම මාර්ගයේ රස්තියාදු නොවී දැනගැනීමට මගීන්ට අවස්ථාව හිමිවීමයි.

සාමාන්‍ය බස් ගාස්තුව මෙන් එකහමාරක මුදලක් 'සිටි බස්' රථයේ අය කෙරෙන අතර ගෙවුණු මාස තුන හමාරක කාලයේ ඉන් සැලකිය යුතු ආදායමක් ලැබූ බව ලංගම සභාපති නීතිඥ කිංස්ලි රණවක මහතා පැවැසීය

# ජාතික ගුවන් විදුලි සාමාජිකයෝ සුව අලුත් අවුරුදු නෑගමන් යති...



කොවිඩ් ආසාදිතව සිටින පිරිස් වෙනුවෙන් අවුරුදු උදාව නිමිති කරගෙන ජාතික ගුවන්විදුලියේ සිටි එෆ්. එම්. ඇතුළු සියලු නාලිකා එක්ව ආහාරපාන, ඖෂධ, රසකැවිලි, පලතුරු සහ අවුරුදු තෑගි පාර්සල් බෙදාදීමේ වැඩපිළිවෙළක් "සුව අලුත් අවුරුද්දේ නෑගමන්" නමින් අලුත් අවුරුදු දිනයේ දී (14) ක්‍රියාත්මක කර තිබුණි. කොළඹ මුල්ලේරියාව නිරෝධායන මධ්‍යස්ථානයේ සිටින කොවිඩ් ආසාදිත පිරිස් වෙනුවෙන් එම පාර්සල් පිරිනැමීම කළ අයුරුයි මේ.

# විස පොල්තෙල් වෙළෙඳපොළේ තිබේදැයි සොයා බැලීම් දිගටම

## රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න

**සුභාෂිණී සේනානායක සහ**
**අනුර ප්‍රේමලාල්**



විස පොල්තෙල් වෙළෙඳපොළේ ඇතිද යන්න පිළිබඳ අඛණ්ඩව සොයා බැලීම් සිදුකරන බව පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මහතා පවසයි.

මේ වන විට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විවිධ ස්ථානවලින් ගත් පොල්තෙල් සාම්පල ගණනාවක් පරීක්ෂාවට ලක් කර ඇති බවත් එවැනි විස පොල්තෙල් වෙළෙඳපොළේ නැති බව තහවුරු වී ඇති බවද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කළේය.

එම විස කාරක පොල්තෙල් පිළිබඳ අනාවරණය වීමෙන් පසු දිවයින පුරාම පොල්තෙල් භාවිතය සම්බන්ධයෙන් අර්බුදකාරී තත්ත්වයක් මතු වූ අතර එම පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් වී ඇත්ද යන්න පිළිබඳ තහවුරු කරගැනීමට දිවයිනම ආවරණය වන පරිදි මහජන පරීක්ෂකවරු විසින් සාම්පල් 125ක් ලබාගෙන තිබුණු අතර ඒවායේ විස කාරක නොමැති බවයි තහවුරු විය.

එහෙත් අඛණ්ඩව දිවයින පුරා වෙළෙඳපොළේ ඇති පොල්තෙල් පරීක්ෂා කෙරෙන බවද රාජ්‍ය ඇමැතිවරයා කියා සිටි අතර පොල්තෙල් සම්බන්ධයෙන් අනියත බියක් ඇති කර ගැනීමට අවශ්‍යතාවක් නැතැයිද කියා සිටියේය.

# වැලිකඩ බන්ධනාගාරයේ රැඳවූවන්ට අවුරුදු කැවිලි සංග්‍රහයක්

**බුද්ධිකා ඉඹුලාන**

සිංහල සහ දෙමළ අවුරුද්ද සමරමින්, වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා සහ පිරිමි රැඳවූවන්ට කිරිබත් ,කැවුම්,කොකිස් ඇතුළු අවුරුදු කැවිලි සංග්‍රහයක් පෙරේදා(14) පැවැත්විණි. වැලිකඩ බන්ධනාගාර අධිකාරි ගාමිණී දිසානායක මහතාගේ සංකල්පයකට අනුව,සිරකරු සුභ සාධක සංගමයේ වැලිකඩ උප කමිටුවේ දායකත්වයෙන්, පුනරුත්ථාපන අංශයේ පූර්ණ අධීක්ෂණයෙන් මේ උත්සවය සංවිධාන කෙරිණි.

මෙහිදී වැලිකඩ බන්ධනාගාරය මෙන්ම එයට අනුබද්ධ කාන්තා අංශයේ රැඳවූ කාන්තාවෝ, බන්ධනගාර රෝහලේ නේවාසික නේවාසිකාවෝද මේ අවස්ථාවට එක්ව සිටියහ.

වැලිකඩ බන්ධනාගාරයේ නේවාසික රැඳවූවන්ගේ සංගීත කණ්ඩායම මේ අවස්ථාවේදී සංගීත වැඩසටහනක් ද පැවැත්වීය.



# මෝටර් රියේ දොර කවුළු මත වාඩි වී අධිවේගී මාර්ගයේ ගිය තරුණයන් සිව්දෙනා රිමාන්ඩ්

**සුභාෂිණී සේනානායක**

මෝටර් රථයක වීදුරු විවෘත කර දොර මතුපිට අනාරක්ෂිත ලෙස දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගමන් ගත් තරුණයන් හතරදෙනා මේ මස 22 වැනි දින දක්වා රිමාන්ඩ් කිරීමට පාණදුර වැඩබලන මහේස්ත්‍රාත් ජයන්ති සිල්වා මහත්මිය නියෝග කළාය.

මේ තරුණයන් පිරිස,ගැලනිගම දක්ෂිණ අධිවේගී රථවාහන පොලිසිය වෙත බාරවීමෙන් අනතුරුව අත්අඩංගුවට ගෙන ඇත.

මෙලෙස රිමාන්ඩ් බාරයට පත්කරනු ලැබුයේ අකුරණ සහ උඩතලවින්න ප්‍රදේශවල පදිංචි අමීර් අතහාල්ලත්,මුහුමුඩින් මොහොමඩ්,ජව්පර් මොහොමඩ් හා මොහොමඩ් අබ්දුල්ලා යන අයය

මේ වාහනය පැදවූ රියදුරාද රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

# දළදා මැඳුරේ අවුරුදු චාරිත්‍ර...



දළදා මාලිගාවේ වාර්ෂිකව පැවැත්වෙන සතර මහා මංගල්‍යයන්ගෙන් එකක් වන අලුත් අවුරුදු මංගල්‍යය පෞරාණික චාරිත්‍රානුකූලව ශ්‍රී දළදා මැඳුරේදී පැවැත්විණි. එහිදී තේවාව භාර නායක හිමිවරුන්ගේ අනුශාසනා මත දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග මහතාගේ මූලිකත්වයෙන් ශ්‍රී දළදා මැඳුරේදී කිරි ඉතිරවීමේ චාරිත්‍රය ඉටු කළ අයුරු.

ඡායාරූපය
අසේල
කුරුළුවංශ

# අඩුආදායම්ලාභීන්ට රුපියල් 5000
# අවුරුදු දීමනාව ගෙවීම යළි ඇරඹෙයි

**කරන්දෙණිය අනුරාධ පියදර්ශනී, එම්.කිර්තිරත්න - යටවත්ත සමූහ, ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ, ඩී මිහිඳුකුල - කොච්චිකඩේ, බදුල්ල විශේෂ නිශාන්ත අබේගුණවර්ධන, ෂන්මුගම් තාවසීලන්, මුල්ලිපොතාන සමූහ, මුල්ලිපොතන සමූහ කෝ එම්.එස්. අබ්දුල් හලීම්, චිත්‍රාරත්න කළුආරච්චි - හිදෝගම සමූහ**

අඩුආදායම්ලාභී පවුල් පවුල් ලක්ෂ 30කට අලුත් අවුරුද්ද වෙනුවෙන් රුපියල් 5000 ක දීමනාව ගෙවීමේ කටයුතු ඊයේ (15) සිට නැවත ආරම්භ කර තිබේ. දරිද්‍රතාව තුරන් කිරීමේ ජනාධිපති කාර්යසාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතාගේ ඉල්ලීමක් අනුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ උපදෙස් පරිදි මේ දීමනාව ගෙවීමේ කටයුතු ඉකුත් 12 වැනිදා සිට ආරම්භ කෙරිණි. අවුරුදු දා (14 ) පමණක් එම මුදල ගෙවීමේ කටයුතු තාවකාලිකව නතර කර තිබූ අතර ඊයේ (15) සිට යළිත් ගෙවීම් ඇරඹීමට පියවර ගෙන තිබේ. ඡායාරූපවලින් දැක්වෙන්නේ රුපියල් 5000 ගෙවීමේ කටයුතු පසුගිය දිනවල දිවයින පුරා දිස්ත්‍රික්කවලදී සිදු කෙරුණු අයුරුයි.

## ගිරිබාව ප්‍රාදේශීය බල ප්‍රදේශය



## අම්බලන්ගොඩ වතුගෙදර





## මාතලේ දිස්ත්‍රික්කය



## මොනරාගල



## බිබිල, මැදගම



## මීගමුව





## මුලතිව් දිස්ත්‍රික්කය මාන්කුලම්





## බදුල්ල





## ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය



## රාගම



## අනුරාධපුර සාලියපුර





# අහස්ගව්ව

## වින්දනීය සිනමාවේ වර්තමාන කියවීම



ශබ්දාගාරය



රොබින්

# අසූව වසරේ සිනමා රංගනයන් පිළිබඳ නිරීක්ෂණ චාරිකාවක්

අසූව වසරේ චිත්‍රපටවලින් මතුවුණු මෙරට ප්‍රධාන පෙළේ සිනමා රංගන ශිල්පීන් තිදෙනෙකුගේ රංගන අවස්ථා පසුගිය සතියේ මා විමසා බැලුවා. ඒ නිසාම ඒ වසරේම තිරගත වූ විවිධ ධාරාවන්වල සුවිශේෂ චිත්‍රපට කිහිපයක සෙසු චරිතාංග නිරූපණයන් දෙස යම් කෙටි විමසුමක් කරන්නට මා උත්සාහ කරනවා. කලාත්මක හෝ සමාන්තර සිනමාව යයි හඳුනාගත හැකි චිත්‍රපට කිහිපයකම එවැනි ප්‍රබල රංගන අවස්ථා හා චරිතාංග නිරූපණයන් අපට හමුවෙනවා.

ඒ වන විට මෙරට ජනප්‍රිය හා ප්‍රබල චරිතාංග රංගන ශිල්පියකු ලෙස ජනප්‍රසාදය දිනාගත් ටෝනි රණසිංහ, අසූව වසරේ චිත්‍රපට පහකට පමණ දායක වූවත් ඒ අතර අවධානයට ලක් වන්නේත්, යම් සාධනීය රංගන ලක්ෂණ පළ කරන්නේත් උප ප්‍රධාන චරිත රඟපෑ චිත්‍රපට දෙකක බව පෙනෙනවා. ඒ “ගඟ අද්දර” සහ “පරිත්‍යාගය” චිත්‍රපට වලයි. “ගඟ අද්දර” චිත්‍රපටයේ තම පරම්පරාවේ කීර්තිනාමය පිළිබඳ මහත් ගර්වයකින් යුතුව දිවි ගෙවූ පසුකාලීනව ආත්මීයව බිඳ වැටෙන වියපත් පියකුගේ චරිතයට ටෝනි රණසිංහ ප්‍රබල හැඟීම් නිරූපණයක් එකතු කරන්නට සමත් වෙනවා. එසේම “පරිත්‍යාගය” චිත්‍රපටයේ දැවැද්ද පිළිබඳ ගැටලුවක් ඉදිරියේ තම ගැමි පෙම්වතියත්, තම දෙමාපියන්ගේ සාම්ප්‍රදායික කුල සිරිත් හා ආකල්පත් අතර අතරමංව තීරණයක් ගත නොහැකි වන පාසල් ගුරුවරයාගේ චරිතයක මානසික ස්වභාවය නිවැරදිව රංගනයෙන් හසුකරගන්නා ඔහු වහා ප්‍රේක්ෂක අවධානය දිනා ගන්නට සමත් වෙනවා.

අසූව වසරට එක්වන විටත් ඊට ආසන්නව “සිරිපාල සහ රන්මැණිකා”, “වීරපුරන් අප්පු”, “වසන්තයේ දවසක්”, “චූඩා මාණික්‍යය” , “පොඩි මල්ලී” වැනි චිත්‍රපට ගණනාවක් ඔස්සේ තමාගේ චරිතාංග නිරූපණ හැකියාවේ සවිමත් බවත්, තමාගේ චරිත රංගනයේ පිවිසුමත් හොඳින් පෙන්වා දී තිබුණු එමෙන්ම ජනප්‍රියත්වයටත්, ප්‍රේක්ෂක ආකර්ෂණයටත් ලක්ව තිබුණු ‘රවීන්ද්‍ර රන්දෙනිය’ අසූව වසරේ ප්‍රේක්ෂක අවධානයට ලක් වන්නේ එකම එක චිත්‍රපටියකින් බව පැහැදිලියි. ඒ හර්බට් රංජිත් පීරිස්ගේ ‘එක්ටැම්ගේ’ චිත්‍රපටයයි. තමා ඉදිරියේ ආදරණීය ඉඟිබිඟි පාන ගැමි තරුණියකගේ සැබෑ හැඟීම් තේරුම් ගත නොහැකිව සිතින් ඇයට දැඩි ලෙස ආදරය කරන අවසානයේ ඒ නිසාම පාළු හුදෙකලා ඛේදජනක දිවි පැවැත්මක සිරගත වන අර්ධ නාගරික තරුණයකුගේ චරිතයක හැඟීම් නිරූපණය හා චරිත විකාශනය පැහැදිලිව එළිදක්වන්නට රවීන්ද්‍ර දක්වන්නේ මනා හැකියාවක්. “දුහුළු මලක්” චිත්‍රපටයේදී ඔහු රඟපෑ සැහැල්ලු හැඟුම්බර පෙම්වතාගේ චරිතයට වඩා වෙනස් පැහැයක් හා භාව නිරූපණයක් දක්වන මේ චරිතය ඔහුගේ රංගන අවස්ථා අතර වෙනස් මානයක් එළිදක්වන අවස්ථාවක් බව කිව යුතුයි. අසූව වසරේ වඩාත් විවාදයකට හා විචාරක අවධානයකට ලක් වූ ප්‍රබල චිත්‍රපටයක් වූ “හංස විලක්” නිර්මාණය කරමින් ලාංකික සිනමාවේ අධ්‍යක්ෂවරයකු ලෙස සුවිශෙෂ් මුද්‍රාවක් තැබූ ධර්මසිරි බණ්ඩාරනායක, සිනමා රංගනය පිළිබඳව ද ඒ වසරේම නව මානයක්, නව චරිත ලක්ෂණයක් සනිටුහන් කරන්නට සමත් වෙනවා. (අසූව වසරේ ඔහු රඟපෑ ‘හෙවනැලි ඇද මිනිස්සු’ “හංසවිලක්” චිත්‍රපට දෙකම තිරගත වුණු.)

‘හංසවිලක්’ චිත්‍රපටයේ ප්‍රධාන චරිත දෙකකින් ධර්මසිරි සහ හෙන්රි ජයසේන යන ප්‍රබල රංගන ශිල්පීන් දෙදෙනාම චිත්‍රපටයේ එන සරල තාත්වික රීතිය ඉක්මවන යම් නාටකීය (එහෙත් වේදිකාමය නොවන) රීතිය සමඟ අවස්ථානුකූලව මුසුවෙමින් ප්‍රබල මතකයක් බවට පත්වන රංගනයක් ප්‍රේක්ෂකයාට තිළිණ කරනවා. (ඒ සමඟම චිත්‍රපටයේ කෙටි චරිතයක් නිරූපණය කළ ජී.ඩබ්ලිව්. සුරේන්ද්‍රගේ ප්‍රබල රංගනය ද අපගේ මතකයේ තැන්පත් වූ රංගන අවස්ථාවක්.) මෙහිදී මීට පෙර වසරේ (1979) “පළගැටියෝ” චිත්‍රපටයේ සිටම ධර්මසිරි විසින් නිරූපණය කළ සමාජ, ආර්ථික හා සදාචාර සාධක මඟින් පීඩනයටත් මානසික කම්පනයටත් පත් තරුණයකු පිළිබඳ නව පිළිබිඹුවක්. මේ වසරේ ඉහත කී චිත්‍රපට දෙක මඟින් ද තවදුරටත් තීව්‍ර ලෙස සනිටුහන් කළ බවක් පැහැදිලිව පෙනෙනවා.



රවීන්ද්‍ර

ධර්මසිරි මේ අසූව දශකයේ ආසන්නයේ හා එහි මුල්ම වසරවල (1981 දී තිරගත වූ “බඹා කෙටූ හැටි” සහ “සතර පෙර නිමිති” චිත්‍රපටවල චරිතත් මේ ලක්ෂණය යම් දුරකට පළ කරනවා.) මතු කළ මේ පීඩාවටත් කම්පනයටත් පත් තරුණයා පිළිබඳ පිළිබිඹුව, හැටේ දශකයේ අග “දෙලොවක් අතර”, “දහසක් සිතිවිලි”, “හන්තානේ කතාව” හෝ “අක්කර පහ” බඳු චිත්‍රපට ඔස්සේ මතුවුණු කම්පිත තරුණයා පිළිබඳ පිළිබිඹුවේම යම් දිගුවක් දෝ යැයි විචාරවත් ප්‍රේක්ෂකයකුට ඇතැම් විට සිතෙන්නට ද හැකියි.

අසූව වසරේ තිරගත වූ තවත් කලාත්මක හා සමාන්තර ධාරාවේ යයි සැලකෙන චිත්‍රපට කිහිපයක අපේ විවිධ රංගන ශිල්පීන් කිහිප දෙනෙකුගේම චරිත හා චිත්‍රපටයේ ප්‍රකාශන රීතිය හඳුනා ගැනීමත්, විවිධ රංගන පිවිසුමත්, චරිතාංග රංගනයේ මනා හැකියාවත් ප්‍රකට වෙනවා. “කරුමක්කාරයෝ” චිත්‍රපටයේ එක් තීරණාත්මක චරිතයක් වූ විලිසොංගේ පියාගේ චරිතයට එක්වන දිගු චරිතාංග රංගන ඉතිහාසයක් ඇති රංග ශිල්පියකු වූ “සෝමසිරි දෙනිපිටිය” තම චරිතයට අදාළ මතුපිට තලයේ විවෘත රළු චර්යාවන් මෙන්ම රහසිගතව ඇලී ගැලී සිටින ශෘංගාරාත්මක හැසිරීම ද දරාගෙන නිසලව සිටීමේ ස්වභාවය ද මනාව පෙන්නුම් කරන්නේ ආයාසයෙන් තොරවයි. එය සෝමසිරි දෙනිපිටිය නම් රංගන ශිල්පියාගේ රංගන දිවියේ අවසාන භාගයේ ප්‍රකට වූ ඉහළ රංගන අවස්ථාවක්. ‘කරුමක්කාරයෝ’ චිත්‍රපටයේ තවත් කෙටි චරිතයට පණපොවන “උපාලි අත්තනායක” තමාට සුපුරුදු යම් අධිරංගන ස්වභාවය හැකිතාක් යටපත්කොට චරිතයට හොඳින් සමීප වන බව මතකයේ ඉතිරි වෙනවා. ලාංකික සිනමාවේ බිහි වූ තවත් ප්‍රබල රංගන ශිල්පියකු වන “ඩී.ආර්. නානායක්කාර”, “සිරිබෝ අයියා” චිත්‍රපටයේ එන ගැමියකුගේ කෙටි චරිතයකින් ප්‍රේක්ෂකයාගේ චරිත අවබෝධය මනාව සවිමත් කරන්නට සමත් වෙනවා. “උතුමාණෙනි” චිත්‍රපටයේ බේබි මහත්තයාගේ චරිතය ඔස්සේ ප්‍රධාන චරිතයකට එක්වන තවත් දක්ෂ චරිතාංග රංගන ශිල්පියකු වූ “සොමී රත්නායක” තම චරිතයට අදාළ ශරීර භාෂාව, චර්යා රටා, හඬ හැසිරවීම වැනි ලක්ෂණ මනාව හසුරුවමින් චිත්‍රපටයේ සෙසු චරිත මෙන්ම ප්‍රේක්ෂක මානසිකත්වය මතත් විශාල ආධිපත්‍යයක් දරනවා. මෙය සොමී රත්නායකගේ චරිතාංග රංගන ඉදිරි විකාශනයේ එක් ප්‍රධාන මුල් අඩියරක් ලෙස හඳුනා ගන්නට පුළුවනි. “පරිත්‍යාගය” චිත්‍රපටයේ අමරසිරි කලංසූරිය ප්‍රකට කළ රංගන පිවිසුමත්, කැපවීමත් හා චරිත අවබෝධයත් චරිතයට අදාළ ලක්ෂණ ප්‍රේක්ෂකයාට සමීප කරවන්නට හොඳින් ඉවහල් වූවා. එය අසූව වසරේ මතකයේ රැඳුණු රංගනයක්.



ටෝනි

තවත් අතෙකින් හැටේ හා හැත්තෑව දශකයේ මුල සිටම මෙරටට ආවේණික වාණිජ ලක්ෂණ සහිත ජනප්‍රිය ධාරාවේ චිත්‍රපට ඔස්සේ චරිතාංග රංගනයට එක්ව දිග ගමනක් හා පරිචයක් ලබාගත් තමාටම ආවේණික ප්‍රබල රංගන පෞරුෂයක් සහිත ජනප්‍රිය රංගන ශිල්පීන් කිහිපදෙනෙකුම අසූව වසරේ චිත්‍රපටවල අවධානය හා ආකර්ෂණය දිනා ගන්නා රංගනයන් ප්‍රකට කරන බව පෙනෙනවා. ඒ අතර රොබින් ප්‍රනාන්දු, රෙක්ස් කොඩිප්පිලි හා මර්වින් ජයතුංග මූලික වෙනවා. තමාගේ තියුණු ආකර්ෂණීය මුහුණුවරත් ශරීර ලක්ෂණ හා ශාරීරික භාෂාවත් මෙන්ම තමා ප්‍රගුණ කළ සටන් හා ක්‍රියාදාම චර්යාවන්වල හැඩතලත් තම චරිත රංගනය සඳහා ප්‍රධාන මෙවලමක් කරගන්නා නළුවකු වන ‘රොබින් ප්‍රනාන්දු’ අසූව වසරේ තිරගත වූ චිත්‍රපට කිහිපයක අවධානය ලබා ගන්නා රංගන අවස්ථා පෙන්නුම් කළා. ‘රත්තා’, ‘සසරක පැතුම්’, ‘කිඳුරු කුමාරි” , ‘මුවන් පැලැස්ස 2 යන චිත්‍රපට වල ඔහු පළ කළ රංගනයන් එදා ප්‍රේක්ෂකයින්ගේ අවධානය දිනාගත් බව පෙනෙනවා. එවැනිම තමාට ආවේණික පිවිසුමක්, දේහ භාෂාවක් හා චර්යාවන් පළ කළ “දුෂ්ට චරිත රඟපෑමට සම්මත වී රංගන ශිල්පියකු වූ ‘රෙක්ස් කොඩිප්පිලි’ බොහෝදුරට අසූව වසරේ රඟපෑ චිත්‍රපට කිහිපයකි. ඔහු ඒ තත්ත්වයෙන් මිදෙන්නට සමත් වුණා. “රත්තා”, “මුවන්පැලැස්ස 2” මෙන්ම “උතුමාණෙනි” චිත්‍රපටයේ කෙටි චරිතයක් වූ නීතිඥයාගේ චරිතය ඊට මනා නිදසුන් පෙන්වනවා. ඔහුගේ රංගනයේ යම් අධිරංගන ස්වභාවයක් පළ වුවත් ඒ ඒ චිත්‍රපටවල ශෛලියටත්, අවස්ථාවන්ටත් ඒ ලක්ෂණය සමපාත වෙනවා. මෙරට ජනප්‍රිය සිනමාවේ එක්තරා අත්හදා බැලීම් වැනි චිත්‍රපට වූ ‘රත්තා’, ‘සංඛපාලී’, ‘මුවන් පැලැස්ස 2’ බඳු චිත්‍රපටවලදී රොබින් , රෙක්ස්, මර්වින් වැනි දේහධාරී පෞරුෂයන් හා ක්‍රියාදාම ලක්ෂණ මුල් කරගත් රංගන ශිල්පීන්ට එකිනෙකා මුහුණට මුහුණ ගැටෙන රංගනයන් මඟින් ප්‍රේක්ෂකයා ආකර්ශණය කරගන්නට හැකි වුණා.

එදා චිත්‍රපට ප්‍රේක්ෂකයින්ට මේ ජනප්‍රිය ධාරාවේ චිත්‍රපටවල පවා මතුවුණු තියුණු නාට්‍යමය රංගනයන් මතකයේ රැඳුණු සිහිවටන බවට පත්වූවා. අවස්ථා පිළිබඳ ඉදිරියට මතකයට නඟාගන්නට හැකි වේවි.

**මනුබන්දු විද්‍යාපති**

# 59 අවුරුද්දේ අවුරුදු තෑග්ග දෛවයෝගය



රුක්මණී



දෛවයෝගය චිත්‍රපටය ලාංකේය සිනමා රිදීතිරයට පායා මේ වසර වන විට හරියටම වසර 60කට වැඩිය. චිත්‍රපටයේ නිෂ්පාදන කටයුත්තට අත තැබුවේ සිනමා කර්මාන්තයේ හසළ බුද්ධියක් ඇති දෙදෙනකු නම් නොවෙයි. මේ දෙදෙනාම නවකයන්. නමින් ඇල්ප්‍රඩ් ද සොයිසා සහ ඊ.ජේ.සී.ද සොයිසායි. මෙහි විශේෂත්වය නම් දෙදෙනාම සහෝදරයන් වීමයි. දෛවයෝගය චිත්‍රපටය සිංහල රිදීතිරයේ දිග හැරුණේ ඩබ්ලිව්. ඒ. සිල්වා සූරීන් ගේ නව කතාවක් ආශ්‍රයෙන් වුවත් චිත්‍රපටයේ අධ්‍යක්ෂණ කටයුතු සිදු කළේ එවක දී භාරතයේ ජනප්‍රිය අධ්‍යක්ෂවරයකු වුණු එස්.කේ.ඕජා. ඒ වගේම මේ චිත්‍රපටය සිංහල සිනමා වංශ කතාවේ වැදගත් සන්ධිස්ථානයක් පසු කළ චිත්‍රපටයක්. භාරතයේ චිත්‍රාගාරයක (ප්‍රභාත් ස්ටුඩියෝ - පූනා) මුල්ම වරට නිපදවන ලද දෛවයෝගය චිත්‍රපටය අධ්‍යක්ෂණය මෙන්ම සංගීත අධ්‍යක්ෂණය සඳහා ඉන්දීය ජාතිකයන් සම්බන්ධ වූ අතර, මෙම චිත්‍රපටය, ලාංකේය සිනමාව ආරම්භයේ සිට 1959 දී මේ සිනමා පටය නිෂ්පාදනය වන තුරු වැඩිම මුදලක් යෙදවූ චිත්‍රපටය ලෙස ද හඳුන්වන ලදි

1969 දී තිරගත වුණු දෛවයෝගය චිත්‍රපටය තවත් අමුතුම විදියේ සිදුවීමක් වුණා. ඒක සිද්ධ වුණේ නළු නිළි තේරීම කරන මොහොතේදීය. මේ චිත්‍රපටයේ ප්‍රධාන නළු නිළි යුවළ ලෙස රංගනයෙන් සම්බන්ධ වුණේ රුක්මණී දේවි සහ සේනාධීර කුරුප්පුය. නමුත් සේනාධීර කුරුප්පුට පෙර මේ චරිතයට නම් කරලා තිබුණේ භාරත සිනමාව හොල්ලගෙන හිටපු දිලිප් කුමාර්ව. සිද්ධිය වුණේ මෙන්න මේ විදියට

දෛවයෝගය චිත්‍රපටය අධ්‍යක්ෂණය කරන්න බාර අරගෙන තිබුණේ එස්. කේ.ඕජාය. ඔහු මීට පෙර අධ්‍යක්ෂණයෙන් සම්බන්ධ වුණ "හල්චල්" චිත්‍රපටයට දිලිප් කුමාර් රංගනයෙන් සම්බන්ධ වීම නිසා ඔවුන් දෙදෙනා අතර මනා හිතවත්කමක් පැවැතියා. මේ නිසා ඕජා ගේ පළමු කැමැත්ත වූයේ ප්‍රධාන නළුවා ලෙස දිලිප් කුමාර් සම්බන්ධ කරගත යුතුයි යන්නයි.

මේ අවධිය වෙනකොට ඉන්දීය ශිල්පීන් හා ලංකාවේ ශිල්පීන් අතර පැවැත්වුණේ තරගකාරීත්වයක්. මේ නිසා ඔවුන් කිසිවෙක් තවත් කෙනෙකුට දෙවෙනි වෙන්න කැමැත්තක් දැක්වූයේ නෑ. යම්කිසි විදියකින් මෙයට හේතුවක් වෙන්න ඇත්තේ බහුතරයක් චිත්‍රපටවල ඉන්දීය ශිල්පීන් කටයුතු කරන නිසා වෙන්නත් පුළුවන්. කොහොම වුණත් චිත්‍රපටයේ අධ්‍යක්ෂ පරයා වුණු එස්. කේ.ඕජාට උවමනා විදියට දිලිප් කුමාර්ව ප්‍රධාන චරිතයට සම්බන්ධ කරගන්න හැකියාවක් ලැබුණේ නෑ. එයට එකහෙළාම විරුද්ධ වුණේ රුක්මණී දේවියයි. ඇය ප්‍රකාශ කරලා තිබුණා දිලිප් කුමාර් මේ චරිතයට ගතයුතු නෑ, ඒ චරිතයට අපේ ලංකාවෙන්ම නළුවෙක් ගත යුතුයි කියලා. එහෙම කියලා ඇය එතැනින් නතර වුණේ නෑ. ලංකාවේ නළුවෙක් දිලිප් කරන්න හදපු චරිතයකට නම් කළා. ඔහු තමයි සේනාධීර කුරුප්පු. රුක්මණීගේ මේ මැදිහත්වීම නිසා දිලිප් කුමාර් සිද්ධ වුණේ දෛවයෝගය චිත්‍රපටයෙන් එළියට විසිවෙන්න. එදා රුක්මණීගේ මේ මැදිහත් වීම නැත්නම් අවුරුදු හැට ගණනක් ගිහිල්ලත් අපට කියන්න සිද්ධ වෙන්නේ "දෛවයෝගය" මේන් රෝල් එක කළේ දිලිප් කුමාර් කියලා. ඒ කාලයේ නිළියන්ට වර්තමානයේ තරුවලට මෙන් බොලිවුඩ් ගායක් නැති බව දැක්වීමට තියෙන හොඳම උදාහරණයක් තමයි ඒ සිදුවීම. ඒක හරියාකාරව පෙන්නුම් කළා.

**රංගනය**
රුක්මණී දේවි, එඩී ජයමාන්න, සේනාධීර කුරුප්පු, ලලිතා සිල්වා, මාක් සමරනායක, තිමෝතියස් පෙරේරා, කුමාරි ලතා.

**අධ්‍යක්ෂණය** - එස්.කේ.ඕජා
**සංගීත අධ්‍යක්ෂණය**
සජාද් හුසේන්
**තිරගත වූ දිනය**
1959 අප්‍රේල් 18

**රජිත බස්නායක**



රසමුසු තැන් පිරි ඔබේ සිනමා ලිපි අපට යොමු කරන්න
"අහස්ගව්ව" දිනමිණ ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10. ahasgawwa@lakehouse.lk

# ජනතා මණ්ඩපය

■ ජනතා මණ්ඩපය, දිනමිණ, ලේක්හවුස්, කොළඹ 10
■ ෆැක්ස් 2429220 ■ ඊ මේල් - janathamadapayaancl@gmail.com

## පළාත් ඡන්දයට සරල ක්‍රමයක්



අද වන විට 'සුදු අලියකු' බවට පත්ව, විසංවාදයට ලක්වී ඇති,පළාත් සභා සඳහා වූ මැතිවරණය, නව 'මිශ්‍ර මැතිවරණ' ක්‍රමය යටතේ පවත්වා, පළාත් සභා මන්ත්‍රීන් සංඛ්‍යාව,(2018 පළාත් පාලන මැතිවරණයේ සිදුවූවාක් මෙන්) දෙගුණ තෙගුණ කර, ජනතාවට 'කොරේ පිටට මරේ'තත්වයක් ඇති කිරීමට සූදානම් වන බව පෙනේ.

මෙහිදී, පුරවැසියන් මෙන්ම ස්වෛරීය ඡන්ද දායකයින් වශයෙන් අප මුලින්ම දකින යථාර්ථය නම්, දැනටමත් විමධ්‍යගත දේශපාලන ව්‍යුහය තුල සිටින 455 ක් වන පළාත් සභා මන්ත්‍රීන් හා 8653 ක් වන පළාත් පාලන සභිකයන්ගේ සංඛ්‍යාව හා කාර්ය භාරය, තවත්දෙපිළිපත්(Duplicate) වී, ඵලරහිත, අවුල් ජාලාවක් බවට පත්වීමය.

සංඛ්‍යාත්මකව බැලුවහොත්, පාර්ලිමේන්තු මන්ත්‍රීන් 225 ඇතුළුව, දැනටමත් එක් මැතිවරණ කොට්ඨාසයක් තුළ, විමධ්‍යගත දේශපාලන ව්‍යුහයට සක්‍රීයව සම්බන්ධවී සිටින දේශපාලකයන් සංඛ්‍යාව 47 කි. 'මිශ්‍රක්‍රමය'ක්‍රියාත්මකකිරීමෙන්,පළාත් සභා මන්ත්‍රීන් සංඛ්‍යාවද1,000 ක් ඉක්මවා ගොස්,එක් මැතිවරණ කොට්ඨාසයකට පත්වන දේශ පාලකයන් සංඛ්‍යාව 53 ක් අභිභවා යනු ඇත. නිසි ඵලදායිතාවයක් නොමැතිව ප්‍රාදේශීය හා පළාත් දේශ පාලකයන්ගේ සංඛ්‍යාව මෙලෙස අවිද්‍යාත්මකව වැඩි කිරීම,ජීවන බරින් මිරිකී සිටින බදු ගෙවන පුරවැසියා දරා ගන්නේ කෙසේද යන්න ගැටලුවකි.

1987 හි සිට 'මනාප ක්‍රමය' අහෝසි කර, පාර්ලිමේන්තු මන්ත්‍රීන් හුදෙක් තම 'චන්ද බැංකුව'රැක ගැනීම සඳහා අවශ්‍ය බලතල රඳවා ගැනීම හා විමධ්‍යගත අයවැයේ අරමුදල් මැතිවරණ කොට්ඨාස මට්ටමේ වියදම් කිරීම නවතා, විමධ්‍යගත දේශපාලන පරිපාලනය අර්ථවත් කිරීමට කටයුතු කළේ නම් පළාත් සභා 'සුදු අලීන්'බවට පත් නොවීමට ඉඩ තිබුණි .

මෙලෙස දැනට නිෂ්ඵලවී ඇති කාරණයක් සඳහා, පැරණි 'මනාප ඡන්ද'ක්‍රමය හෝ සංකීර්ණ හා අධි වියදම් සහිත ඊනියා 'මිශ්‍ර' මැතිවරණයක් හෝ පැවැත්වීම අතිශයින්ම නාස්තිකාර හා අර්ථශූන්‍ය ක්‍රියාවක් වන හෙයින් ඉදිරි පළාත් සභා මැතිවරණය පහත සඳහන් පරිදි පවත්වන ලෙස යෝජනා කරමි.

පළාත් සභා මැතිවරණය සඳහා වියදම් අඩු, සරල ක්‍රමයක ප්‍රධාන පියවරයන්

1) ව්‍යාපාරික හා වෙනත් බාහිර අරමුණු මුදුන්පත් කරගැනීමේ අටියෙන්, හතු පිපෙන්නාක් මෙන් මතුවන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ලියාපදිංචිය අධෛර්යමත් කිරීම සඳහා,දැඩි සුදුසුකම් උපමාන සහ ඉහළ මුදල් තැන්පතු අවශ්‍යතා පැනවීම තුලින් ඡන්ද දායකයින් ව්‍යාකූලත්වයට පත් කරන,දිගු ඡන්ද පත්‍රිකා කෙටිකිරීම.

2) මැතිවරණයේ මූලික පරමාර්ථය පිරිසිදුව ඉටුකිරීම

ශ්‍රී ලාංකික අනන්‍යතාවය අනිවාර්යයෙන් තහවුරු කිරීම වෙනුවෙන්, ජාති,ආගම්,කුලභේද හා නිජ බිම් නොතකා, සෑම පුද්ගල ඡන්දයකටම සමාන වටිනාකමක් ලබා දීම සඳහා, සරල සමානුපාතික ගණිතය (PR Arithmetic) යොදා, දිස්ත්‍රික් මට්ටමෙන් පූර්ව නිශ්චිත ආසන සංඛ්‍යාවක් පිරි නැමිය යුතුය.මෙහිදී,පක්ෂවලට හිමිවන ආසන සංඛ්‍යාව,වඩාත් සාධාරණව හා නිවැරදිව ගණනය කිරීම සඳහා,'අනෙකුත්" සනයට අයත් වන චන්ද එකතුව අත හැර,ප්‍රස්තුත පක්ෂ පමණක් ලබාගත් මුළු වලංගු චන්ද එකතුව භාවිතා කළ යුතුය.

3) මැතිවරණයේ ද්විතීයික පරමාර්ථය අරමුණාත්මකව ඉටුකිරීම

මේ සඳහා,පළමු - වෙන්ම, අනිවාර්ය නොවන 'මනාප ඡන්ද ක්‍රමය' අහෝසි කළ යුතුය. එවිට, නිතැතින්ම මැතිවරණය සරල,අර්ථවත්, අඩු පිරිවැයක් සහිත අවිහිංසාවාදී ව්‍යායාමයක් බවට පත්වනු ඇත. ඉන්පසු, පක්ෂ විසින් තම පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරයට ලබා දී ඇති විවිධ බර අනුව,පහත යෝජනා කර ඇති එක් විකල්ප ලැයිස්තු ක්‍රමයක් යටතේ,(එක් විකල්පයක් සඳහා සියලු පක්ෂ එකඟත්වයකට එළඹීමෙන් පසුව හෝ අදාළ පක්ෂයේ තනි තේරීම අනුව හෝ ) පහත අංක 04 හි සඳහන් සුදුසුකම් මත, තෝරා ගත් තම අපේක්ෂකයින්ගේ නම්,(අතිරේක නම් කිහිපයක්ද ඇතුළුව) ලැයිස්තුගත කර, නාමයෝජනා දිනයේදී බලධාරීන්ට ඉදිරිපත් කර ලියා පදිංචි කරන්න.

අ) 1978 මුල් 'සමානුපාතික ක්‍රමයට අනිවාර්ය උපාංගයවූ'කුසලතා අනුපිළිවෙලට'සැදු දිස්ත්‍රික් ලැයිස්තුව.

ආ) 'කොට්ඨාස ක්‍රමයට අනුකූලව එක් මැතිවරණ කොට්ඨායකට එක් අපේක්ෂකයෙකු හෝ වැඩි ගණනක් බැගින් සකස් කළ දිස්ත්‍රික් ලැයිස්තුව.

ඇ) මෑතක් දක්වා 'ජවිපෙ' විසින් භාවිතා කරන ලද මධ්‍යම අපේක්ෂක නාම සංචිතය.

ඈ) දැනට පවතින 'සිංහල අකාරාදී පිළිවෙලට'සකස් කරන ලද දිස්ත්‍රික් ලැයිස්තුව. මෙහිදී 'මනාප ඡන්ද අංක' මතු නොවේ.

4) තිරසාර පළාත් සභාවක අරමුණු හා කාර්යයන් ඉටු කිරීම සඳහා, ජාතික මැතිවරණ කොමිෂන් සභාව විසින් විටින් විට නියම කරණු ලබන අනිවාර්ය සුදුසුකම් උපමාන යන් සහ ව්‍යුහාත්මක(Structured) සම්මුඛ පරීක්ෂණයන්ට යටත්ව, මූලික අධ්‍යාපන සුදුසුකමක් ඇති, 'පළමුව- රට'යන මානසිකත්වයෙන් ඔදවැඩුණු,නැණවත් හා සුහුරු සාමාන්‍ය බුද්ධියකින් හෙබි, අව්‍යාජ දේශපාලන වෘත්තිකයන් වීමට කැප වුනු පුද්ගලයන් නම් කිරීමට පක්ෂ/සන්ධාන අනිවාර්යයෙන් වග බලා ගත යුතුය.

6) ඡන්දදායකයින්ගේ තීරණයට මග පෙන්විය යුතු ප්‍රධාන සාධකය වන 'පක්ෂ මැතිවරණ/ ප්‍රතිපත්ති ප්‍රකාශනය' නඩු පැවරිය හැකි ලේඛනයක් බවට පත් කරන්න.

7) පවතින රජයේ 'පස් අවුරුදු මැතිවරණ / ප්‍රතිපත්ති ප්‍රකාශනය' සහ වාර්ෂික ජාතික / විමධ්‍යගත අයවැය අනුව, සමතුලිත පළාත් සංවර්ධනයක් තහවුරු කිරීම සඳහා, ජනපතිගේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ,පළාත් සභාවලට,අවශ්‍ය වෙතොත්,වැඩි බලතලද ලබාදී, තව දුරටත් ඒවා 'සුදු අලීන්' වීමට ඉඩ නොදී,කාර්යක්ෂම ආයතන බවට පත් කළ යුතුය. මෙහිදී, පාර්ලිමේන්තු මන්ත්‍රීන් සඳහා විමධ්‍ය ගත අය වැයෙන් ප්‍රතිපාදන ලබා දීමද නැවැත් විය යුතුය.

8) රට වෙනුවෙන් දරන සමස්ත පිරිවැයට උපරිම ප්‍රතිලාභයක් ලබාදීමට හා ඡන්දදායකයින්ගෙන් ප්‍රශස්ථ මට්ටමේ මැතිවරණ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා, පළාත් සභා මැතිවරණය එක් නිශ්චිත දිනයක පැවැත්වීම දැන් ආරම්භ කළ හැක.

**බර්නාඩ් ප්‍රනාන්දු - මොරටුව**

## සමනල තටු සිඳින්නෙපා පාට මැකී යයි දේදුන්නේ

සුදෝ සුදුවන් කොක් රෑනක් සේ උදෑසනින් පාසල් ගිය කාලය කිසිවෙකුට අමතක නොවේ. දේදුන්නේ පාට ඇති පුංචි සමනල පැටව් සේ නිදහසේ සුව විඳිමින් ආදරණීය කැදැල්ලක සුරතල් වෙමින් දිවි ගෙවූ බාලවියක් සෑමදෙනාටම තිබුණි. මෙසේ සොඳුරු කාලයක් පසු කරමින් දැනුම් තේරුම් ඇති මේරූ අවදියකට පා තැබූ කල මදක් හැරී බැලූ විට අප මෙන් සොඳුරු මල් හීන ඇහිඳින තවත් පිරිසක් සිටිනා බව අමතක නොකළ යුතුය. නමුත් පාට පාට දේදුන්නේ සමනල සිහින සොයන අහිංසක කුඩා ජීවිත රැසක අනාගත ලෝකයම අඳුරු කරමින් කුඩා දරුවන්ගේ සමනල තටු සිඳ බිඳ දමා තලා පොඩි කරන්නට මාන බලමින් සිටින වල්මත් වූ වෘකයන් වැනි කෲර පාපතරයන් අද සමාජයේ පැටව් ගසා ඇත.

අප මේ වනවිට පසු කරමින් සිටින්නේ තාක්ෂණයෙන්, දැනුමින්, ගෝලීයකරණයෙන්, නව්‍යකරණයෙන් කෙළ පැමිණි යුගයක්ය. නමුත් මෙතරම් දියුණු සමාජයකට අප පැමිණිය ද මිනිසා තවමත් වල්මත් වී අතරමංව සදාචාරය ඉක්මවමින් කටයුතු කරන බවක් පෙනේ. ඒ මක් නිසා ද යත් මෑතකාලීනව මුද්‍රිත හෝ විද්‍යුත් නව මාධ්‍ය හෝ වේවා සෑම මාධ්‍යයකම පාහේ උණු කැවුම් සේ මාධ්‍ය විකුණනු ලබන්නේ ළමා අපචාර, ළමා අපයෝජන, ලිංගික සූරාකෑම්, ළමා දිවි නසා ගැනීම් වැනි සිද්ධීන්ය. එකම බඩවැල කඩාගෙන ආ සහෝදරිය දූෂණය කරන සහෝදරයන් හය හතරක් නොතේරෙන තම කුසින් වැදූ සිඟිත්තාට අමානුෂික ලෙස පහර දෙන මව්වරු, ශිල්ප ඉගෙනීමට සෙවණට එන දූ දරුවන් දූෂණයට, අපයෝජනයට ලක්කරන තිරිසන් වූ ගුරුවරු, තම මුණුබුරු මිණිබිරියන් දූෂණය කර මරා දමන සාහසිකයා.මාපියන්ගේ වැරදිවලට සහ ඔවුන්ගේ කෝපය පිටකිරීමට නූතනයේ තම දරුවා යොදා ගැනීමේ පුවත් ඕනෑ තරම් අසන්නට ලැබේ. සිඟිත්තෙකු යනු පවුලටම සතුට ප්‍රාණය ගෙන දෙන දායාදයකි. එවන් උතුම් වස්තුවකට පහරදීම්, මරා දැමීම් සිදුකිරීමට තරම් මෙම සමාජය කෙලෙසී හමාරය. තව ද තම නිවෙස, මහ මග, පොදු ප්‍රවාහන සේවාව, පාසල් වෑන් රථ, පාසල යනාදී මෙකී නොකී සෑම තැන්හිම දරුවන් කෙලෙසෙන්නේත්, කෲර වධබන්ධනයට ලක්වන්නේත්, දූෂණයට ලක්වන්නේත්, මනුෂ්‍යත්වය හා සමාජ හර පද්ධතීන් විනාශ වී යාම තුළය. රටක් භෞතික වශයෙන් කොතරම් සංවර්ධනය කළ ද නිසි පළ නෙළා ගත නොහැකි වන්නේ මිනිසාගේ ආධ්‍යාත්මය සංවර්ධනය නොවීම තුළය.



මදක් සිතන්න. අධ්‍යාපනය කරගෙන යාමට දෙමාපියන්ට වත්කමක් නොමැතිකම නිසාත් දෙමාපියන් දරුවන් නොසලකා හැරීම නිසාත් ළමා යාචකයන්, වීදි දරුවන්, ළමා කම්කරුවන් සේම නොයෙක් වැරදි ක්‍රියාවලට පෙළඹුණු දරුවන් මේ සමාජයේ අනන්තයි, අප්‍රමාණයි. තව ද දෙමාපියන් වෙන් වී මව හෝ පියා භාරයේ හැදී වැඩෙන විට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට යටත් වී සිටින දරුවන් ද ඕනෑ තරම්ය. මව හෝ පියා ජීවිතය ගැට ගසා ගැනීමට මෙරට රැකියාවක් නොමැතිකම නිසා දෙදෙනාම හෝ එක් අයෙකු විදෙස් රටවල සේවයට යයි. එහිදී බොහෝ විට මව විදෙස් ගත වන අතර මිත්තණිය භාරයේ හෝ පියා භාරයේ දරුවන් හැදී වැඩෙයි. මේ සමාජයේ කෲර බව ගැන කිසි අවබෝධයක් නොමැති මිත්තණිය නිසා දරුවන් නොයෙක් අපචාර, අපහරණවලට යොමු වේ. ඔවුන් ගැන සෙවීමට කිසිවෙකු නොමැති නිසා මේ සමාජයේ සිටින තිරිසන් ගති ඇති මිනිසුන්ට එය මහත් වාසියක් වී ඇත. බොහෝවිට නොයෙක් අපචාර, අපයෝජන, දූෂණවලට ලක්වන දරුවන් ගැන සොයා බැලූ විට ඔවුන්ගේ දෙමාපියන් වෙන්ව ජීවත්වන හෝ මව බොහෝ දුරට විදෙස් ගත වූ දරුවන් බව අනාවරණය වේ.

මේ ජීවිතවලට වගකිව යුත්තේ දෙමාපියන්, වැඩිහිටියන් ද පිරිහී යන ආර්ථිකය ද අධම පාපතරයින් වෙසෙන සමාජය ද නොඑසේ නම් රජය ද නීතිය ද යන්න වත්මන් සමාජයම කළඹා විසඳුම් සෙවිය යුතු ගැටලුවක් බවට පත්ව ඇත.

**බී. යූ. මධුෂානී ජයසූරිය**

## ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ අවධානයට



මෙරට මාධ්‍ය කලාව යම් මට්ටමකට රැගෙන ඒමට ගරු ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා සුවිශාල කාර්යභාරයක් එදා සිට අද දක්වාම කර තිබේ.

මාධ්‍ය ක්ෂේත්‍ර අතර පුවත්පත් වාර්තාකරණයට සුවිශේෂ තැනක් හිමි වෙයි. පුවත්පත් වාර්තාකරණයෙත් විවිධ භූමිකා ඇත.

මෙම වාර්තාකරුවන් අතර කිසි දවසක කිසිවෙකුගේ අවධානය යොමු නොවන කොටසක් වෙයි. ඒ පාඨක මාධ්‍යවේදීන්ය. මෙරට පළවන සෑම ජාතික පුවත්පතකටම දිනපතා ලිපි දහස් ගණනින් සපයන පාඨක මාධ්‍යවේදියෝ රාශියක් සිටිති.

එහෙත් මෙම පාඨක මාධ්‍යවේදීන්ට අද වෙනතුරු මාධ්‍යවේදියකුට ලැබෙන කිසිම වරප්‍රසාදයක් නොලැබේ. මෙම මාධ්‍යවේදීන් ආයතනවලට සේවා සපයන්නේ සම්පූර්ණයෙන්ම නොමිලේය. එහෙත් අද දවස වනතුරු කිසිම ඇගයීමක් කර නොමැත. මේ රටේ පැවැත්වෙන කිසිම මාධ්‍ය සම්මාන උළෙලකට අයදුම් කිරීමටද නොහැකිය.

අතිදක්ෂයන් ඇති මෙම මාධ්‍ය කලාවටද යම් වටිනාකමක් ලබා දීමේ වැඩසටහනක් සැලසුම් කිරීම ඔබතුමියගේ යුතුකමකි.

පාඨක මාධ්‍යවේදීන් රැකගනිමු.

**චන්දන වන්නිආරච්චි - දෙහිඅත්තකණ්ඩිය**

## මුද්දරය ලොකුයි



දැනට වලංගු රු.15 මුද්දරය ප්‍රමාණයෙන් ඉතා ලොකුයි. එයින් මුද්දර 02 ක් හෝ 03 ක් ගත හැකිය. එම නිසා එය මීට මාස කිහිපයකට පෙර තිබූ මුද්දරය මෙන් කුඩා වන්නේ නම් හොඳයි. කුඩා ලියුම් කවරයේ ලිපිනය පවා ලිවීමට මේ මුද්දරය නිසා අපහසුය. එම නිසා දැනට පවතින මුද්දරය කුඩා වන්නේ නම් යහපති.

**වඳුරාමුල්ලේ - ලයනල් ජයලත්**

## එදා මෙදා ක්‍රිකට් වෙනස



1996 වසරෙහි ශ්‍රී ලංකා ක්‍රිකට් පිල සහ ඔස්ට්‍රේලියා පිල ලෝක කුසලානය සඳහා පාකිස්ථානයෙහි පැවැති තරගය හිදී ලෝක කුසලානය ජයග්‍රහණය කරන ලද්දේ අර්ජුන රණතුංග නායකත්වය සපයන ලද අරවින් ද සිල්වා උපනායකත්වය දරන ලද සහ සෙසු ක්‍රීඩකයින්ගෙන් සමන්විත වන ලද ශ්‍රී ලංකා ක්‍රිකට් පිල ලෙස සිදුවීම රටට ගෙන දුන් ඉමහත් වූ කීර්තියකි, ආඩම්බරයකි.

ඉක්බිති වසර 25 කට පසු එනම් 2021.03.18 වෙනි දින රූපවාහිනිය තුළින් එම අවස්ථාව නැවත වතාවක් විකාශය කිරීම එදා මෙදාතුර ක්‍රිකට් ලෝලී නරඹන ප්‍රේක්ෂක ජනතාව වෙත ගෙන දෙනු ලැබුවේ ඉමිහිරි වින්දනීය ආශ්වාදයකි, අස්වැසිල්ලකි. එම විශේෂිත දිනය උදාවනතුරු ඔවුන් පුන පුනා සැදී පැහැදී සිටිනු ලැබුවේ නොඉවසිල්ලෙනි.

තරගය රූපවාහිනිය තුළින් විකාශය වීමට නියමිතව තිබුණේ එදින පස්වරු 5.00 ට පමණය. ඊට පෙර හෝරාවන්හිදී මෙහි ක්‍රීඩකයන් සමඟින් ක්‍රිකට් විස්තර ප්‍රකාශකයින්, විශ්ලේෂකයින් සාකච්ඡා මණ්ඩපයෙහි සිට අතීතාවර්ජනයක යෙදෙමින්, තරගය පැවැති කාලපරිච්ඡේදයෙහිදී ශ්‍රී ලංකා පිලෙහි ක්‍රිකට් ක්‍රීඩක සාමාජිකයින් හට ඉඳුම් හිටුම් නවාතැන්, ආහාරපාන මෙන්ම තමන් හට හිමි එක් නිල ඇඳුම පමණක් නැවත නැවතත් සෝදා පිරිසිදු කරගනිමින් ස්වකීය වියදමෙන් මෙකී සියලු අවශ්‍යතාවයන් ඉටුකරගත් බැව් ඔව්හු පවසන ලදි. එහෙයින් මෙබඳු වූ දැඩි අපහසුතාවයන් දුෂ්කරතාවයන් මධ්‍යයෙහිදී ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාපිටිය වීරත්වය පසක් කරමින් ජයග්‍රහණය කළ අයුරු මොනවට පිළිබිඹු වන්නේය.

එමෙන්ම මෙම තරගාවලිය එදා සහ මෙදා යන පරපුරයන්හි නරඹන ලද ක්‍රිකට් ලෝලී ප්‍රේක්ෂක ජනතාවගේ ප්‍රකාශයන් වූයේ වත්මන්හි පවත්වනු ලබන බොහෝ තරගයන් පරාජය වීමට හේතු සාධකය ලෙස ක්‍රීඩකයින් අතර විනය නොමැතිවීම, සුහදත්වය ගිලිහී ගොස් අසමගිය තිව්‍රවීම, අසීමිත පහසුකම්, හෝටල්හි නවාතැන් ගෙන විවිධ වූ වින්දනයන් ලැබ පසුදා පවත්වනු ලබන තරගයන් වෙත අධිෂ්ඨානයෙන් හා ක්‍රියාශීලී ලෙස නිරතවීමට නොහැකිවීම ලෙස සන්සන්දනාත්මක ලෙස විග්‍රහ කළ හැකි බැව්ය.

එපමණක් ද නොව වත්මන් ක්‍රීඩකයින් කනෙහි කරාබු පලඳිමින් ද ශරීරයෙහි 'ටැටු' ප්‍රදර්ශනය කරමින් රටෙහි අනන්‍යතාවය, සංස්කෘතිය පහත් ස්ථාවරය වෙත ඇද දමමින් රටට උචිත නොවන ලෙස හැසිරීම අනුමත නොකරන බැව් බුද්ධිගෝචර ක්‍රීඩාලෝලීහු පවසති.

ඉක්බිති කාසියේ වාසිය ලබාගනිමින් ප්‍රථමයෙන් පන්දුවට පහර දීම ඕස්ට්‍රේලියාව සිදුකළ අතර එහිදී සත්දෙනෙකු දැවී ගොස් ලකුණු 241 ක් රැස් කළ අතර, ඉන්පසු පන්දුවට පහරදීමට පැමිණි ශ්‍රී ලංකා පිලෙහි ක්‍රීඩකයින් කණ්ඩායම තිදෙනෙකු දැවී ලකුණු 245 ක් (හතරේ පහරක් සමගින්) රැස්කර ගනිමින් ප්‍රතිවාදී ඕස්ට්‍රේලියාව අභිභවමින් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ලෝක කුසලානය ජයග්‍රහණය කිරීමට සමත්විය.

එදවස කාලය, පසුබිම හා කණ්ඩායම යන ස්වර්ණමය වූත් ක්‍රියාශීලි සොඳුරුබර සාධකයන් හදවතට මනසට ගුරුකොට සන්තර්පණය කරගනිමින් පූර්වාදර්ශයට ගනිමින් ක්‍රිකට් ක්ෂේත්‍රයෙහි උන්නතිය අරභයා වත්මන් ක්‍රිකට් කණ්ඩායම්, ක්‍රීඩකයින් අප්‍රතිහත කැපවීමෙන් පිටිය සහ එහි ගරුත්වය එකාවන්ව හිඳිමින් ආරක්ෂා කරගත යුතු නොවේද?

**සරත් ලියනගේ රන්මුතුගල**

## අරලිය උයනට ඇයි අඩු සැලකිලි

ගම්පහ කසගහවත්ත ප්‍රදේශයේ යක්කල පාරට සම්බන්ධ අරලිය උයන නේවාසික ප්‍රදේශයේ පිවිසුම් මාර්ගය නිසි ලෙස ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා ප්‍රදේශවාසීහු දැඩි අපහසුතාවට පත්ව සිටිති. ගම්පහ නගරයට ආසන්ව ඇති සියලු තැන්වල මාර්ග ප්‍රතිසංස්කරණය කළද මෙම පිවිසුම් මාර්ගය බොහෝ කලකින් ප්‍රතිසංස්කරණය කර නැත. එනිසා අරලිය උයන වාසීන් ඉල්ලා සිටින්නේ මෙම මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසය.

**ප්‍රසන්න වෙල්ගම**

## පොල් ගසේ ඉරණම

එදා ශ්‍රී ලංකාද්වීපය වනාහී පොල් ගසෙන් සංවර්ධිත පොල් උපන් දේශයක් විය. වනාන්තර හැරුණුවිට කුඩා, මධ්‍යම, විශාල ප්‍රමාණයේ පොල් ඉඩම් ද සුලභ විය. එසේම පොල් වගාව ඉඩම් හිමි වැවිලිකරුවන්ගේ ප්‍රධානතම භෝගයක් වූවාක් මෙන්ම ප්‍රධාන පෙළේ වාණිජ භාණ්ඩයක් ද විය. අපනයන භාණ්ඩයක් ද විය. ආදායම් මාර්ගයක් ද විය.

පොල් ගස් හැම අතකින්ම ජනයාට සම්පතක් විය. පොල් ගස ආශ්‍රිතව ගසේ කඳ, ගෙඩි, ලෙලි, කොහු, අතු, ගොබ, මල්, මුල් ආදී වශයෙන් ගසේ සර්වාංගයෙන්ම ජනයාට බහුකාර්ය සේවාවක සිදුවිය. එනිසාම "පොල් ගස කප්රුකක්" ලෙස ද සැලකිණි. ඒ සැබෑය.

මෙදා ඒ එසේ නොවේය. සියල්ල කනපිට පෙරලිලාය. දිගුකලක පටන්ම පොල් වගාව අඩපණ වී ඇති අතර එහි අභාග්‍යසම්පන්න විනාසය වේගවත් වී ඇත.

කුඩා, මධ්‍යම, විශාල ප්‍රමාණයේ පොල් ඉඩම් ඒවායේ හිමිකරුවෝ වෙන්දේසිකරුවන්ට විකුණා යම් මුදලක් ලබා ගෙන ඉන් සෑහීමට පත් වෙති. ඉඩම් වෙන්දේසිකරුවෝ ද එම ඉඩම් ප. 10.15 වැනි ඉතා කුඩා කැබලිවලට කොටස් කරමින් අධික මිල ගණන්වලට වෙන්දේසියේ විකුණා දමති. යහමින් සල්ලි බාගේ ඇති උදවිය ඒ බිම් කැබලි මිලයට ගෙන ඒවායේ පදිංචි වෙති. නැතහොත් විවිධ ව්‍යාපාර පවත්වාගෙන යති. ඇති පොල් ගස් කිහිපයද කපා ඉවත් කරති.

චිරාත් කාලයක් තිස්සේ පොල් ගස සම්බන්ධයෙන් සිදුවන මේ ක්‍රියාදාමය හේතුකොටගෙන රට තුළ පොල් ගසේ ආරක්ෂාව හා වගාවද ඒ ආශ්‍රිත සියලු සම්පත් හා නිෂ්පාදන ආදියද කෙමෙන් ශූන්‍ය වෙමින් තිබේ. ශේෂව ඇති පොල් ගසට ද අනාගතයේදී එකී ඉරණමම අත්වෙනවා ඇත.

තවද පවතින පොල් වගාවට ද ඇතැම් සතුන්ගෙන් වන හානි බහුල වන අතර, ඇති පොල් ගසෙන් ප්‍රයෝජනයක් ලබා ගැනීම ද අසීරු වී ඇත. මේ පොල් විපත්තීන්ට නිසි පිළියම් නොයෙදුවහොත් නුදුරු අනාගතයේදීම මෙරට "පොල් දුර්භීක්ෂයක්" ඇතිවීම නම් නොවැලැක්විය හැකි වනු ඇත. දැනට නාම මාත්‍රිකව පොල් මණ්ඩලයක් ඇත ද පොල් වගාවේ අනාගතාභිවෘද්ධියට සපලදායි පියවර ගන්නා ආකාරයක් ද පෙනෙන්නට නැත.

වර්තමානයේ උද්ගතව ඇති "පොල්තෙල් හබය"ද මෙරට පොල් දුර්භීක්ෂයේම නූතන එක්තරා ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකිය. ඒ බව පොල්වල අතීත වර්තමාන යථා තත්ත්වය විමසීම තුළින් මැනවින් පැහැදිලි වෙනවා ඇත.

එදා රට තුළ පොල් මෙන්ම පොල් තෙල් ද හිඟයක් නොවීය. මහා පරිමාණ පොල් තෙල් මෝල් සක්‍රීයව පැවතුනා සේම ගෘහාශ්‍රිතව පොල් තෙල් හිඳින ස්ථාන ද රට පුරා තැන තැන විසිරී පැවතිණි. තෙල් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වන කොප්පරා වියළි පොල් පෙති ආදියේ ද හිඟයක් නොවීය. එනිසා නගරයේද ගමේද පිරිසිදු හොඳ පොල් තෙල්වල ද හිඟයක් නොවීය. ඒ එදාය.

මෙදා එසේ නොවේය. පොල් තෙලේ පමණක් නොව පොල් ගසේම ශෝචනීය ඉරණමේ හේතුඵල චක්‍රය පහත සඳහන් ආකාරයෙන් දත හැකි වෙයි. ඒ කෙසේද යත්?

පොල් වගා කළ ඉඩම් සහ ඉඩම් වල පොල් වගාව ශූන්‍ය වන කල පොල් ගස් හිඟ වෙයි. පොල් ගස් හිඟවන කල පොල් ගෙඩි පමණක් නොව පොල් ගස ආශ්‍රිත සියලු සම්පත් නිෂ්පාදන ද හිඟ වෙයි. විශේෂයෙන් පොල් ගෙඩි හිඟ වන කල තෙල් සිඳීමට ගනු ලබන කොප්පරා, වියළි පොල් පෙති ආදියද හිඟ වෙයි. එකල පොල් තෙල් නිෂ්පාදනය කරන ආයතන ද හිඟවන කල පොල් තෙල් ද හිඟ වෙයි.

එකල්හි රටේ ඉල්ලුමේ තරමට තෙල් සැපයුම ද අසීරු වෙයි. එසේ තෙල් හිඟවන කල වෙනත් ආහාර සහ භාණ්ඩ සේම පොල් ද, පොල්තෙල් ද පිටරටවලින් ආනයනය කිරීමට සිදු වෙයි. දැන් සිදුවෙමින් පවතින්නේ එම ක්‍රියාදාමයයි. වාර්තා වන අන්දමට පොල්තෙල් ආනයනය ද දිගුකලක පටන් සිදුවන්නක් බව ද පැවසේ.

සාම්ප්‍රදායික පිටරට ආහාර හෝ කිනම් රට බඩුවලට හෝ ඉතා ගිජු ඇල්මක් දක්වන ජනයා ද පරීක්ෂා කළා හෝ නොකළා හෝ පොල් තෙල් මිශ්‍ර කළා හෝ නොකළා හෝ ෆාම් තෙල් මිශ්‍ර කළ නොකළා හෝ ආනයනික පොල් තෙල් ද ඉතා භක්ත්‍යාදරයෙන් පිළිගෙන පරිභෝජනයට ද ගනිති. ඒ එසේ නමුත් මේ ඊයේ පෙරේදා ආනයනික පොල් තෙල් වගයක් කුමන හේතූන් නිසා හෝ පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඒවායේ පිළිකා කාරක විෂ බීජයන් අන්තර්ගත වන බවට පුවතක් ද ප්‍රචාරය වන්නට විය. එසේම ඒ ගැන මතවාදයන් ද අසන්නට ලැබිණි. සමහරවිට එසේ පරීක්ෂා කරන තුරුත් මෙහි ආනයනය කරන්නට ඇත්තේ ද එම පොල්තෙල්ම විය හැකි යැයි ද උපකල්පනය කළ හැකිය.

තව ද ප්‍රධාන ආහාරය වන බතට ගන්නා සහල්වල පටන් සියලු ආහාර ද්‍රව්‍ය, එළවළු, පලතුරු ආදිය නොයෙක් විසකාරකයන් සමඟ මිශ්‍රිතව ආහාරයට ගැනීමට සැදී පැහැදී සිටින ජනයාට මේ විෂ සහිත පොල් තෙල් පරිභෝජනය ද අරුමයක් නොවනු ඇත. ජනයාට වස විස කෑමේ දීර්ඝකාලීන පළපුරුද්දක් ඇති වග ද අමතක කළ යුතු නොවේ. පිළිකා රෝගීන් සහ වෙනත් රෝගීන්ගේ අතිබහුතර සංවර්ධනය ද එහි ප්‍රතිඵලයම විය හැකිය.

මහා පරිමාණයෙන් පොල් තෙල් සිඳීම ශූන්‍ය බවට පත්වන කල්හි වැඩි වැඩියෙන් නිෂ්පාදනය කළ යුතු හා යුගයේ අවශ්‍යතාවයක් වන "පුන්නක්කු" හිඟවීම ද ප්‍රශ්නයක් විය හැකිය.

**එච්. බී. ආර්. වෑගන්තලේ - කුරුණෑගල**

නාඋල සමූහ

# දිය නෑමට ගිය තරුණයා නාලන්ද ජලාශයට බිලි

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද උදාවෙද්දී විසි-දෙහැවිරිදි තරුණයකු නාලන්ද ජලාශයේ දෙමද ඔය ප්‍රදේශයේ දී පසුගිය දා පස්වරුවේ දී (13)දියේ ගිලී ජීවිතක්ෂයට පත්වී ඇතැයි මහවෙල පොලිසිය කියයි.

දිය නෑම සඳහා තවත් තරුණයන් දෙදෙනකු සමඟ නාලන්ද ජලාශයට බැස ඇති මෙම තරුණයා එක වරම දියේ ගිලී ගොස් ඇති බව සිදුකරන ලද මූලික පොලිස් පරීක්ෂණ වල දී තහවුරු කරගත් බව මහවෙල පොලිසිය කියයි.

මෙසේ මියගොස් ඇත්තේ ඇටඹග-ස්ලන්ද, මේල්පිටිය, නාඋල ලිපිනයේ පදිංචිව සිටි ලසන්ත සංජු බණ්ඩාර (22) නැමති තරුණයෙකි.

දියේ ගිලුනු සිරුර සෙවීමේ කටයුතු දැඩි අඳුර හේතුවෙන් නවතා දමා පසුදින එනම් (14) දඹුල්ල හා නාඋල පොලිස් ජීවිතාරක්ෂක ඒකකයන්ගේ මැදිහත්වී-මෙන් සිදුකරන ලදී.

දියේ ගිලුනු තරුණයාගේ සිරුර ගොඩගන්නා අවස්ථාවේ දී ප්‍රදේශවාසින් දෙදහසකට අධික පිරිසක් රැස්කකා බලා සිටීම හේතුවෙන් ඔවුන් එම ස්ථානයෙන් ඉවත් කිරීම සඳහා පොලිසිය මහත් පරිශ්‍ර-මයක් දරන අයුරු දක්නට ලැබුණි.

කෙසේ වෙතත් පොලිස් දැනුම්දීම් නොතකා අධික පිරිසක් එක තැන රැදි සිටිම හේතුවෙන් සිරුර ගොඩගැනීමේ කටයුතු වල දි බාධා එල්ලවන ලදී.

මුඛ ආවරණ නොපැළඳ සහ සමාජ දුරස්ථභාවය ආරක්ෂා කර නොගනිමින් විශාල පිරිසක් රැස් කකා බලා සිටිනු දක්නට ලදී.



තරුණයාගේ සිරුර ගොඩගත් අයුරු.



දියේ ගිලි මිය ගිය ලසන්ත සංජු බණ්ඩාර

නාලන්ද ජලාශයේ ජලය ගලා බසින දෙමද ඔය ප්‍රදේ-ශයේ දී පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ කිමිදුම් කරුවන් විසින් සිරුර ගොඩ ගැනී-මෙන් පසු මාදිපොළ හදිසි මරණ පරීක්ෂක එස්. එම්.ඒ.සේනානායක මහතා විසින් මරණ පරික්ෂණය සිදුකරන ලදී.

සිද්ධිය සම්බන්ධයෙන් මහවෙල පොලිසිය වැඩිදුර පරික්ෂණ පවත්වති.

දිනමිණ දසත දස අත ම එක තැන

ටී.සී.ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

# අත්ථදස්සි නාහිමි ආදාහන පූජෝත්සවය 17දා



බිංගිරිය ඓතිහාසික ශ්‍රී දේවගිරිය රාජමවහා විහාරස්ථානය ඇතුළු වයඹ පළාතේ විහාරස්ථාන ගණනාවක අධිපති ධූරය දැරූ සත්කෝරළය මහ දිසාවේ ප්‍රධාන සංඝ නායක ධුරන්දර සද්ධර්ම කීර්ති ශ්‍රී සංඝරක්ඛිත සරණංකර අතිපූජ්‍ය මලගනේ අත්ථදස්සි නාහිමි පාණන් වහන්සේ හදිසියේ අප-වත්වි වදාළහ.උන්වහන්සේගේ ශ්‍රී දේහය සම්බන්ධ අවසන් කටයුතු මේ මස 17 වැනි සෙනසුරාදා පස්නරු 2 ට බිංගිරිය රාජමහ විහාරස්ථාන පරි-ශ්‍රයේ දී සිදු කිරිමට ආදාහන කමිටුව තීරණය කර ඇත.මෙම අවස්ථාවට සහභාගිවිමට එන සියලු සැදැහැවතුන් නියම කර ඇති සෞඛ්‍ය වත් පිළි-වෙත් අනුගමනය කරමින් පැමිණිය යුතු බවත් එම කමිටුව නිවේදනය කර ඇත.

අයි.එම්.වී.සී. ගුණසේකර - ඇල්පිටිය සමූහ

# දඬ කොළයක් දුන්නැයි පොලිස් නිලධාරියකුට පහර දීලා

දක්ෂිණ අධිවේගී මාර්ගයේ කුරුඳුගහ-හැතැප්ම පිවිසුමෙන් කොළඹ බලා යෑමට පැමිණි රථවාහන හිමියකු විසින් එම ස්ථානයේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරියකුට ඉකුත්දා (13) සවස පහර දී ඇතැයි පොලිසිය පවසයි.

සිද්ධියට සම්බන්ධ රථවාහන හිමියා අත් අඩංගුවට ගත් බවද පොලිසිය පවසයි.

එම පහර කෑමට ලක්වූ පොලිස් නිලධා-රියා ඇල්පිටිය මූලික රෝහලට නේවාසික ප්‍රතිකාර සඳහා ඇතුළත් වී ඇතැයි රෝහල් ආරංචි මාර්ග පවසයි.

දක්ෂිණ අධිවේගී මාර්ගයේ කුරුඳුගහැ-තැප්ම පිවිසුමෙන් කොළඹ දෙසට යෑමට පැමිණි මෙම සැකකරුගේ මෝටර් රථයේ ඉදිරිපස වම්පැත්තේ අසුනේ වාඩිවී සිටි අය ආරක්ෂක බඳ පටි පළඳා නොසිටීමේ වරදට පොලිස් නිලධාරියා විසින් දඬ කොළයක් ලබා දීමේදී ඊට කිපුණු සැකකරු විසින් එම රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරියාට මෙසේ පහර දී ඇතැයි පොලිසිය පවසයි.

සිද්ධිය සම්බන්ධයෙන් ඇල්පිටිය පොලි-සිය වැඩි දුර පරීක්ෂණ පවත්වයි.

මල්වාන සමූහ මහානාම විතානගේ

# ඩෙබිට් කාඩ්පතක් සොරකම් කර සුපිරි වෙළෙඳසල්වලින් බඩු අරන්

ඇඹරලුව ප්‍රදේශයේ නිවසකින් ඩෙබිට් බැංකු කාඩ් පතක් සොරකම් කර සුපිරි වෙළෙ-ඳසල් වලින් වංචනික ලෙස රුපියල් විසිපන් දහසක් පමණ වටිනා භාණ්ඩ මිලදී ගත් දහනව හැවිරිදි තරුණහයකු ඉකුත් සඳුදා ( 12 වැනිදා ) වැලිවේරිය පොලිසියට භාර වී ඇත.

ඒ සමගම එම තරුණයා ළඟ තිබී එම බැංකු කාඩ් පත පොලිස් භාරයට ගැනිණි.

එම තරුණයා සිය නිවෙස ආසන්නයේ තිබෙන නිවෙසක ඉකුත් සෙනසුරාදා ( 10 වැනිදා ) පැවති සාදයකට සහභාගී වූ අව-ස්ථාවේ මේ බැංකු කාඩ් පත නිවෙසේ බිම වැටී තිබී අහුලා ගත් බවට පොලිසියට පවසා තිබේ.

එම තරුණයා විසින් එම බැංකු කාඩ් පත උපයෝගී කර ගෙන සුපිරි වෙළෙඳසල් වලින් භාණ්ඩ මිලදී ගෙන ඇත.

මෙමප්‍රදේශයේම පදිංචි එම තරුණයා ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කොට ඇප මත මුදා හැර තිබේ.

වැලිවේරිය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක වසන්ත පුෂ්පකුමාර , අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරික්ෂක ජයතිස්ස , හා පො.කො. හෙට්ටිආරච්චි ( 46373 ) යන නිලධාරීහු මේ සිද්ධිය පිළිබඳව පරික්ෂණ පවත්වති.

ඒ.ටී.එම්.ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

# ත්‍රීමලයේ පාසල් 3කට පුස්තකාල පොත්

ත්‍රිකුණාමල අධ්‍යාපන කලා-පයට අයත් පාසල් තුනකට ජනාධිපති ලේකම් කාර්යා-ලය මඟින් ලබාදුන් පුස්ත-කාල පොත් පිරිනැමීම දිස්ත්‍රික් ලේකම් කාර්යලයේදී පාර්ලි-මේන්තු මන්ත්‍රී කපිල නුවන් අතුකෝරල හා දිසාපති සමන් දර්ශන පාඩිකෝරල යන මහ-ත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

ගෝමරන්කඩවල, අඩ-ම්පනේ ප්‍රදේශයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සමග පැවැති “ගම සමග පිළි-සඳරක්” වැඩ සටහනේදී පාසල් සිසුන් පිරිසක් තම පාසල් වල පුස්තකාලවල පවතින පොත් අඩුපාඩු පෙන්වාදිමේදී එම අවස්ථාවේදී ලබාදුන් පොරො-න්දුවක් අනුව මෙම පොත් පරි-ත්‍යාගය සිදුකරනු ලැබ තිබුණි.

මේ අනුව සංකේතාත්මකව කල්‍යාණපුර විදුහලට, මැදව-ච්චිය විදුහලට හා ශ්‍රී පුර විදු-හලට පොත් ලබාදිම සිදුකළ අතර සෙසු විද්‍යාලවලට පොත් එම පාසල් වලට යැවීමට කට-යුතු කරන බව දිසාපති වරයා මෙහිදීපැවසීය.



අම්බලන්ගොඩ සමූහ - ආර්.ඥාණදාස

# දිඹුල්දූව ප්‍රබුද්ධ වැඩිහිටි සමිතියට උපකරණ



හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ තිබෙන වැඩිහිටි සමිති හැට එකක් අතුරින් හොඳම වැඩිහිටි සමිතිය ලෙස තේරුන දිඹුල්දූව ප්‍රබුද්ධ වැඩිහිටි සමිති-යට ජාතික වැඩිහිටි සභාව මගින් රුපියල් ලක්ෂයක් වටිනාකමින් යුත් පුටු,මේස,විදුලි කේතල,ගෑස් ලිප් යනාදිය එම සමිතියට නිල වශයෙන් භාර දීම පසුගියදා සිදු කරනු ලැබීය.

හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරී ලලිත් ද සිල්වා මහතා විසින් එම උපකරණ සමිතියේ සභාපති විජයසිරි ජයසිංහ මහතා වෙත භාර දුන් අවස්ථාවයි මේ.

සමිතියේ ලේකම් ආර්.රූපසිරි, රත්ගම ප්‍රාද්ශීය සභා මන්ත්‍රීවරුන් වන එච්.ඩබ්ලිව්. තුෂාර, ජී.ඩබ්ලිව්.හිමාෂි අනුරාධා, යන මහත්ම මහත්මීහු ද මෙහි සිටිති.

වැල්ලවාය විශේෂ - ජී අයි ආර් ගරුසිංහ

# වැල්ලවාය ප්‍රා.සභාවේ 4කට කොවිඩ්

වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හා ලේකම් වරයා හා කාර්යමණ්ඩලයේ සේවි-කාවක් ඇතුළු පුද්ගලයන් සිව්දෙනෙකුට කොවිඩ් 19 වයිරසය ආසාද-නය වී ඇතැයි සෞඛ්‍ය අංශ පවසයි. ආසාදිත-යන් වාර්තාවීමත් සමග ඉකුත් 08දා වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ මාසික රැස්විමට සහභාගි වූ සියලු පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් එදින රැස්වීම ආවරණයට පැමිණි මාධ්‍යවේදීන් හා සභාවේ කාර්යමණ්ඩලය ස්වයං නිරෝධානයට යොමු කර තිබේ .

එම පිරිසගේ හා ආසාදිතයන්ගේ ආශ්‍රිත පුද්ගලයන්ගේ පී සී ආර් පරීක්ෂණ සඳහා ජෛව සාම්පල ලබාගැනීම 15දා වැල්ලවාය මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාවේදී සිදුකරන ලදී.

අයි. එම්. වී. සී. ගුණසේකර - ඇල්පිටිය සමූහ

# ෆුජි සුගත දහම් පාසලේ සිඟිති බක්මහ උළෙළ

ජපානයේ ෆුජි සුගත සේනාසනස්ථ ෆුජි සුගත දහම් පාසල මගින් ප්‍රථම වරට සංවිධානය කළ සිඟිති බක්මහ උළෙළ පසුගියදා (11) දවස පුරා එම සෙනසුන් විහාරස්ථ පරිශ්‍රයේදී පැවැත්විණි. ජපානයේ ශ්‍රී ලංකා තානාපති සංජීව ගුණසේකර මහතාගේ ප්‍රධානත්ව-යෙන් ආචාර්ය මාවරලේ භද්දිය, ප්‍රධානාචාර්ය ගෝනදෙණියේ චන්දවි-මල, ආචාර්ය උඩුග-ම්පොළ හේමරතන, අම්පිටියේ සද්ධාවාස හිමිවරුන්ගේ සහභාගි-ත්වයෙන් පැවැති මෙම සිඟිති බක්මහ උළෙළ ෆුජි සුගත සේනාසනා-ධිපති හුරුළුනිකවැව සුධම්ම හිමියන්ගේ අනුශාසනා පරිදි එම විහාරස්ථ දායක සභාව විසින් සංවිධානය කර තිබිණි.

අමිල ප්‍රභාත් වනසිංහ-අනුරාධපුර අතිරේක

# මෙත්සිරි සෙවණ කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත සුව අවුරුදු නෑගම්



අනුරාධපුර මෙත්සිරි සෙවණ කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයේ කොවිඩ්-19 වයිර-සය ආසාධිතව ප්‍රතිකාර ලබන පිරිස් වෙත හා රෝහල් කාර්ය මණ්ඩලය වෙත අවුරුදු අසි-රිය රැගෙන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, රජරට සේවය හා කාගීල්ස් ෆුඩ් සිටි ආයත-නය සමඟ රාජ්‍යය අමාත්‍ය දුමින්ද දිසානායක මහතා එම රෝහල වෙත “සුව අවුරුදු නෑ ගමන්”පෙරේදා(14) ගියේය.

රෝග බියෙන් තොර, සුව සම්පත සපිරි, නිරෝගී සම්පන්න වාසනාවන්ත සුව නව වසරක් වේවා යන ප්‍රාර්ථනයෙන් අනුරාධ-පුර මෙත්සිරි සෙවණ කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයේ කොවිඩ්-19 වයිසරය ආසා-ධිතව ප්‍රතිකාර ලබන පිරිස් වෙත හා රෝහල් කාර්ය මණ්ඩලය වෙත අවුරුදු අසිරිය ගෙන එමින් රෝහල සඳහා අත්‍යවශ්‍ය උපකරණ හා අවුරුදු කැවිලි ලබාදීම අනුරාධපුර මෙත්සිරි සෙවන කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයේදී සිදු කෙරිණි.

ඌරුබොක්ක විශේෂ - ඒ.පී.දයාචන්ද්‍ර

# ගින්නලියේ රිය අනතුරකින් කතුන් දෙදෙනකුට බරපතළයි



ඌරුබොක්ක ගින්නලිය ප්‍රදේශයේදී සිදුවූ රිය අනතුරකින් කාන්තාවන් දෙදෙනකු බරපතළ තුවාල ලබා ඇතැයි ඌරුබොක්ක පොලීසිය පව-සයි.

මෙසේ බරපතළ තුවාල ලබා ඇති කාන්තාවන් දෙදෙනා බෙරලපනාතර තණබිම ප්‍රදේශයේ පදිංචි කාරියන් දෙදෙනකු බවට පොලීසිය පැවසීය. පසු-ගිය 12 දින රාත්‍රි 8.15 ට පමණ ඌරුබොක්ක ඇඹි-ලිපිටිය ප්‍රධාන මාර්ගයේ ගින්නලිය ප්‍රදේශයේදී මෙම අනතුර සිදුව ඇති අතර ඇඹිලිපිටිය කෑල්ල ප්‍රදේශයේ සිට පැමිණි කැබ් රථයක් ඌරුබොක්ක දෙස සිට ගින්නලිය දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයේ මුහුණට මුහුණ ගැටීමෙන් රිය අනතුර සිදුව තිබූ අතර එහිදී කැබ් රථයේ සිටි කාන්තා-වන් දෙදෙනා බරපතළ තුවාල ලබා ඌරුබොක්ක හීගොඩ ප්‍රාදේශීය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා කඹුරුපිටිය ආඳපාන මූලික රෝහලට මාරු කර යවා ඇති බවට පොලීසිය පව-සයි.කාන්තාවන් දෙදෙනාගේ තත්ත්වය බරපතළ බව පොලීසිය පවසයි.අනතුර සිදුවන අවස්ථාවේ කැබ් රථයේ රියැදුරු අධික ලෙස මත්පැන් පානය කර සිටී බවත් කැබ් රථය බෙරලපනාතර තණබිම ප්‍රදේශයේ බවත් කොළඹ සිට පැමිණි කාන්තාවන් දෙදෙනකු එක්කර ගෙන ඒම සඳහා කෑල්ල ප්‍රදේ-ශයට ගොස් ඇති බවත් ඒ එන අතරතුර ඌරු-බොක්ක නගරයේ පාමසියක සේවය කරන තරු-ණියක නිවසට ඇරලීම සඳහා ගිය ත්‍රීරෝද රථයේ මුහුණට මුහුණ ගැටී ඇත.අනතුරෙන් කැබ් රථයට සහ ත්‍රිරෝද රථයට බරපතළ හානි සිදුව ඇත.

කැබ් රථය අධික වේගයෙන් පැමිණ ඇති අතර එහිදී ප්‍රතිවිරුද්ධ දෙසින් ගිය ත්‍රීරෝද රථයේ ගැටී මෙම අනතුර සිදුව ඇති බවත් අනතුර සිදු-කළ කැබ් රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර රියදුරුට විරුද්ධව බීමත්ව රිය පැදවීම සහ අපරික්ෂාකාරි රිය පැදවීම යන චෝදනා යටතේ නඩු පැවැරීමට කටයුතු කළ බවත් රියැදුරු මොර-වක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත බවත් පොලීසිය පවසයි.

ඌරුබොක්ක පොලිස් ස්ථානාධිපති ප්‍ර. පො.ප.සමරවික්‍රම මහතාගේ උපදෙස් අනුව රථ-වාහන අංශයේ ස්ථානාධිපති උ.පො.ප.සමන් මහතාගේ මෙහෙයවීම යටතේ පො.කො.75729 රන්දෙණිය,පො.කො.76804 රේෂාන් යන රථවා-හන අංශයේ නිලධාරිහු පරීක්ෂණ සිදු කරති.

# ලංසු සඳහා ආරාධනයයි

## වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

## පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

IFB අංක : LK-ESCAMP-PMU-144720-CW-RFB

## නුවරඑළිය, ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ (SLFI) නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල නවාතැන හා ශ්‍රවණාගාර ගොඩනැගිල්ලේ අලුත්වැඩියාවන් (P6)

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජය වෙත ලෝක බැංකුව වෙතින් පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, මෙම ණය මුදලින් කොටසක්, ශ්‍රී ලංකාව, නුවරඑළිය ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් කිරීම පිණිස යොදාගැනීමට අදහස් කෙරේ.

2. පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයේ පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පහත වගුවේ දක්වා ඇති පරිදි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා නුවරඑළිය ශ්‍රී ලංකා වනවිද්‍යා ආයතනයේ යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් දැන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත් කාලය ආසන්න වශයෙන් දින 300 කි (මාස 10)

| ලංසු අංකය | ලංසු නාමය | කාර්යයන්හි ස්වභාවය | වැට් හා අහඹු වියදම් හැර ඉංජිනේරු ඇස්තමේන්තුව (රු. මිලියන වලින්) | ලංසු සුරක්ෂණය (රුපියල් වලින්) |
|---|---|---|---|---|
| LK-ESCAMP-PMU-144720-CW-RFB | නුවරඑළිය ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේ (SLFI) නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල නවාතැන් හා ශ්‍රවණාගාරයේ අලුත්වැඩියාවන් සංවර්ධනය කිරීම (P6) | චිත්‍ර සටහන්, පිරිවිතර පාරිසරික කළමනාකරණ සැලසුම් හා ප්‍රමාණ පත්‍රවල විස්තර කොට ඇති පරිදි යාන්ත්‍රික හා විදුලි වැඩ ඇතුළුව නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම, කනිෂ්ඨ කාර්ය මණ්ඩල නවාතැන හා ශ්‍රවණාගාර ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | 272 | 2,720,000.00 |

3. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
   - කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක අයදුම්කරු අසාධු ලේඛන ගත නොවූවකු විය යුතු අතර, පහත සඳහන් සුදුසුකම් නිර්ණායකයන් සපුරාලිය යුතුය.
   - ලංසුකරු ලංසු ඉදිරිපත් කරන අවස්ථාව වන විට ගොඩනැගිලි ඉදිකිරීම් විශේෂත්වයේ C3 හෝ ඉහළ ශ්‍රේණිය සඳහා වලංගු සීඩා CIDA (කලින් ICTAD ලෙස හැඳින්වූ) ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර, ලංසු ඉදිරිපත් කිරීම් සමග එම ලියාපදිංචිය සනාථ කිරීම සඳහා සාක්ෂියක් ඉදිරිපත් කළ යුතුය.
   - පසුගිය වසර පහ තුළ නිම කළ ඉදිකිරීම් කාර්යයන්හි වාර්ෂික වටිනාකමේ සාමාන්‍ය අඩු තරමින් රු. මිලියන 430 ක් වත් විය යුතුය.
   - ද්‍රවශීල වත්කම් සහ / හෝ ව්‍යාපෘති නිශ්චිත ණය පහසුකම් මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් වෙතොත් ඒවා හැර අවම අගය රු මිලියන 72ට නොඅඩු විය යුතුය.
   - අදාළ ලිපිලේඛනවල කොන්ත්‍රාත්තුව පිළිබඳ කොන්දේසි හා ලංසුකරුවන් සඳහා වන උපදෙස්වල නියම කොට දක්වා ඇති පරිදි ලංසුකරුවන් සතුව අවශ්‍ය මූල්‍යමය, තාක්ෂණික සහ පාරිසරික හා සමාජ, සෞඛ්‍ය හා ආරක්ෂණ කළමනාකරණ හැකියාවන් සතු බවට සහතික වන ලෙස ලංසුකරුවන්ට අවවාද කෙරේ.
   - පසුගිය වසර 5 ක කාලය තුළ සමාන ව්‍යාපෘති සාර්ථකව නිමා කර තිබිය යුතුය. ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.මූලික කොන්ත්‍රාත් කාලය තුළදීම සිය කාර්ය සාධනය කාලෝචිතව සම්පූර්ණ කිරීම පිළිබඳව ඇගැයීමට ලක් වූ කොන්ත්‍රාත්කරුවන්ද තක්සේරු කිරීම සඳහා ඔවුන්ගේ විස්තර ඉදිරිපත් කළ යුතුය.
   - ලෝක බැංකුවෙන් ලැබෙන අරමුදල් 2022 මැද භාගය වන විට සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ලබාගැනීමට අනිවාර්ය වන බැවින් ලංසුකරුවන් සිය ඉදිරිපත් කිරීම් සමග ඇගැයීම් කමිටුවට වඩාත් ප්‍රතිචාරාත්මක / සුදුසුකම ඉදිරිපත් කිරීම නිර්දේශ කිරීමට හැකිවන පරිදි, තාවකාලිකව කාර්ය වැඩ සටහන්, ශ්‍රම යෙදවුම මුදල් ප්‍රවාහය පිළිබඳ අනාවැකි, ද්‍රව්‍ය ලැබීම් යනාදිය වැනි විස්තර තම මිල ගණන් සමග ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන් දිරිමත් කෙරේ.
   - ප්‍රසම්පාදන කමිටුව විසින්, අදාළ කොටස්කරුවන්ගෙන් තොරතුරු විමසීම මගින් වඩාත්ම තරගකාරී හා වඩාත්ම කාර්යක්ෂම ලංසුකරු කවුරුන්දැයි සාක්ෂාත් කර ගැනීම සඳහා අවසාන ඇගැයීම් අදියරේදී අඩුම ලංසුකරුවන් තිදෙනා පිළිබඳව "වෙළඳ පිරික්සුමක්" පවත්වනු ඇත.

4. අභිලාෂී ලංසුකරුවන්ට 2021 අප්‍රේල් 19 දින සිට 2021 මැයි 07 දින තෙක්, බත්තරමුල්ල, රජමල්වත්ත පාර, නො 82, "සම්පත්පාය', පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අංශයෙන් කාර්යාල දිනයන්හි පෙ.ව.9.00 ත් ප.ව. 3.00 ත් අතර, වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත් එම ලිපිනයේදීම කාර්යාල වේලාවන් තුළ ලංසුකරණ ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලීමටත් පිළිවන. (දුරකථන අංක 011-2888426 / 011-2888427)

5. බත්තරමුල්ල, රජමල්වත්ත පාර, නො 82, "සම්පත්පාය"පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත වලංගු CIDA ලියාපදිංචි සහතිකයේ පිටපතක් සමග ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා එක් ලංසුවකට ආපසු නොගෙවන රු. 45,000.00 බැගින් ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021 අප්‍රේල් 19 දින සිට 2021 මැයි 07 දින දක්වා පෙ.ව. 9.00 ත් ප.ව 3.00 ත් අතර අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති ගණකාධිකාරී වෙත මුදලින් කළ යුතුය.

6. සම්පූර්ණ කළ ලංසු අනුපිටපතකින් යුතුව "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස ලකුණු කළ කවර දෙකක වෙන් වෙන්ව බහා මුද්‍රා තබා කොන්ත්‍රාත් අංකය හා කොන්ත්‍රාත්තුවේ නම වම් ඉහළ කෙළවරේ සඳහන් කළ තනි කවරයක ඇතුළු කොට 2021 මැයි 11 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තවද, බත්තරමුල්ල, නො 82, "සම්පත්පාය", පරිසරය පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැම්පත් කිරීමටද අවකාශය ඇත. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ඉහත කී ස්ථානයේදීම ලංසු භාරගැනීම අවසන් වූ වහාම, එම අවස්ථාවට සහභාගී වීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ.

7. වැඩ බිම චාරිකාව හා පරීක්ෂාකර බැලීම නුවරඑළිය මූන් ප්ලේන්ස් හි ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනයේදී අප්‍රේල් 29 වැනිදා පෙ.ව. 10.00 ට පැවැත්වෙනු ඇත. (දුරකථනය: 0522235340) පූර්ව ලංසු රැස්වීම බත්තරමුල්ල, සම්පත්පාය පරිශ්‍රයේදී, ESCAMP හි ව්‍යාපෘති කළමනාකාර ඒකකයේදී (PMU) 2021 අප්‍රේල් 30 දින පෙ.ව. 10.00 ට පැවැත්වේ.

8. ලංසු 2021 සැප්තැම්බර් 30 දින දක්වා වලංගු විය යුතුය.

9. සෑම ලංසුවක් සමගම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වාණිජ බැංකුවකින් නිකුත් කළ ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. ලංසු සුරක්ෂණයේ වටිනාකම ඉහත වගුවේ සඳහන් පරිදි හා ලංසුකරණ ලිපිලේඛන සමග අමුණා ඇති ආකෘතිය පරිදි, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ නමට යොමු කළ යුතුය. ලංසු සුරක්ෂණය 2021 ඔක්තෝබර් 31 දින දක්වා වලංගු විය යුතුය. ලංසු සුරක්ෂණය නොමැතිව එවන ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

10. ලංසුකරුවන් තම ලංසු සමග 1987 පොදු කොන්ත්‍රාත් පනතේ PCA-3 පෝරමය ඉදිරිපත් කළ යුතුය. (http://www.drc.gov.lk/)

11. ලංසුකරුවන් විසින් ලංසු පිළියෙල කිරීමේ හෝ ගෙනැවිත් භාරදීමෙහි ලා දරනු ලබන කිසිදු පිරිවැයකට වැඩ බිම චාරිකාවට අදාළ වියදම් ඇතුළුව සේව්‍යයා විසින් වග කියනු නොලැබේ.

12. ලැබෙන ඕනෑම ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, එහි තීරණය අවසාන තීරණය වනු ඇත.

**සභාපති, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය,**
**"සම්පත්පාය" නො. 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**
**දුරකථන අංක : 011-2888426/ 011-2888427**
**www.escamp.lk**
**දිනය : 2021 අප්‍රේල් 16**


1950 සිට
දිනපතා සහ සතිපතා පත්‍රවල
පළවූ හා පළනොව ඡායාරූපවල දළ
සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත.
ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය
නම් පුවත්පතේ නම, දිනය සහ
ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා
හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011)2 242 9491

LAKE HOUSE




පත්‍රය බාරේ පළවන
දැන්වීම් සඳහා එවන පිළිතුරු
සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි

ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ



BE BETTER INFORMED! News you can trust now free on your mobile phone.
Dinamina Daily News Thinakaran
AVAILABLE AT
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
LAKE HOUSE

# මහජන බැංකුව

## බේරා නොගත් උකස් භාණ්ඩ (ස්වර්ණාභරණ) වෙන්දේසියයි

මහජන බැංකුවේ ගාල්ල ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛා සහ සේවා මධ්‍යස්ථානයන්හි 2020.03.31 දින දක්වා උකස් කරන ලදුව, මෙතෙක් බේරා නොගත් උකස් භාණ්ඩ 2021.05.22 සහ 23 දිනයන්හිදී අපගේ ගාල්ල කොටුව ශාඛා පරිශ්‍රයේදී පෙ.ව. 9.00 ට ආරම්භ කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙමු.

| ශාඛා අංකය | ශාඛාව සහ උකස් මධ්‍යස්ථානය | බේරාගත හැකි අවසන් දිනය | වෙන්දේසි දිනය | වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය |
|---|---|---|---|---|
| 035 | අම්බලන්ගොඩ ශාඛාව | 2021.05.20 | 2021.05.22<br>2021.05.23 | ගාල්ල කොටුව ශාඛා පරිශ්‍රයේදී |
| 549 | අම්බලන්ගොඩ මහ වීදිය සේවා මධ්‍ය. | | | |
| 560 | වතුගෙදර සේවා මධ්‍යස්ථානය | | | |
| 154 | බලපිටිය ශාඛාව | | | |
| 889 | කොස්ගොඩ සේවා මධ්‍යස්ථානය | | | |
| 197 | ඌරගස්මංහන්දිය ශාඛාව | | | |
| 234 | බටපොළ ශාඛාව | | | |
| 937 | මීටියාගොඩ සේවා මධ්‍යස්ථානය | | | |
| 013 | ගාල්ල කොටුව ශාඛාව | | | |
| 420 | ගිංතොට සේවා මධ්‍යස්ථානය | | | |
| 520 | වංචාවල සේවා මධ්‍යස්ථානය | | | |
| 987 | පෙට්ටිගලවත්ත සේවා මධ්‍යස්ථානය | | | |
| 169 | ගාල්ල මහවීදිය ශාඛාව | | | |
| 587 | පින්නදූව සේවා මධ්‍යස්ථානය | | | |
| 404 | කලුවැල්ල සේවා මධ්‍යස්ථානය | | | |
| 188 | අහංගම ශාඛාව | | | |
| 329 | කොග්ගල ශාඛාව | | | |
| 136 | හික්කඩුව ශාඛාව | | | |
| 469 | රත්ගම සේවා මධ්‍යස්ථානය | | | |
| 561 | ගෝනාපීනුවල සේවා මධ්‍යස්ථානය | | | |
| 748 | කුමාරකන්ද සේවා මධ්‍යස්ථානය | | | |
| 087 | බද්දේගම | | | |
| 073 | ඇල්පිටිය ශාඛාව | | | |
| 441 | පිටිගල සේවා මධ්‍යස්ථානය | | | |
| 869 | කුරුඳුගහහැතැක්ම සේවා මධ්‍යස්ථානය | | | |
| 444 | කරන්දෙණිය සේවා මධ්‍යස්ථානය | | | |
| 131 | උඩුගම ශාඛාව | | | |
| 442 | නෙළුව සේවා මධ්‍යස්ථානය | | | |
| 343 | කරාපිටිය ශාඛාව | | | |
| 272 | තල්ගස්වල ශාඛාව | | | |
| 522 | නාගොඩ සේවා මධ්‍යස්ථානය | | | |
| 325 | වදුරඹ ශාඛාව | | | |
| 247 | ඉමදූව ශාඛාව | | | |
| 424 | යක්කලමුල්ල සේවා මධ්‍යස්ථානය | | | |
| 980 | බෝගහගොඩ සේවා මධ්‍යස්ථානය | | | |

මෙම වෙන්දේසිය නැවත දැනුම් දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම හෝ ඒකාබද්ධ කර පැවැත්වීම හෝ යන කවර කටයුත්තක් වුවද සිදු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

**ප්‍රාදේශීය කළමනාකරු**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය - ගාල්ල.**


මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating


### සංචාරක අමාත්‍යාංශය

# ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

### පේරාදෙණිය

## භූ දර්ශන සංවර්ධන සහායක පුහුණු පාඨමාලාව N.V.Q. - 4 මට්ටම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය

මගින් පවත්වනු ලබන ඉහත පාඨමාලාව සඳහා ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම්** : අ.පො.ස සා/පෙළ විෂයන් 06 (හයක්) එකවර සමත් වීම.

**වයස** : අවුරුදු 18 හා 35 අතර වීම.

**පාඨමාලා කාලය** : සම්පූර්ණ පාඨමාලා කාලය මාස 10.

පළමු මාස 04 - මල් වගා හා උද්‍යාන අලංකරණ විදුහල තුළදී න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව (පූර්ණ කාලීන)

: දෙවන මාස 06 - පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය තුළදී හෝ විෂය ක්ෂේත්‍රයට අදාළ ආයතනයකදී කාර්යස්ථ පුහුණුව (පූර්ණ කාලීන)

**මාධ්‍යය** : සිංහල

**අය කිරීම** : නොමිලේ

පාඨමාලාව අවසානයේ පැවැත්වෙන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවලින් පසුව සමත් වන ආධුනිකයින්ට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් NVQ-4 මට්ටමේ සහතිකයක් පිරිනමනු ලැබේ.

ඉහත සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පහතින් දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගත් අයදුම්පත පහත සඳහන් ලිපිනයට 2021-05-07 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුයි.

**සහකාර අධ්‍යක්ෂ**
**මල් වගා හා උද්‍යාන අලංකරණ විදුහල**
**රාජකීය උද්භිද උද්‍යානය,**
**පේරාදෙණිය**

වැඩි විස්තර සඳහා කාර්යාල වේලාව තුළ දී

මෙම දුරකථන අංකය ඇමතීමෙන් තොරතුරු ලබාගත හැකිය - 081-2385893

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

### ආදර්ශ අයදුම්පත්‍රය

**භූ දර්ශන සංවර්ධන සහායක පුහුණු පාඨමාලාව (NVQ-4 මට්ටම) සඳහා අයදුම්පත්‍රය - 2021**

1. නම : ............................................
2. ලිපිනය : ............................................
3. උපන් දිනය : ............................................
4. ජාතික හැඳුනුම්පත් අංකය : ............................................
5. වයස : ............................................
6. දුරකථන අංකය : ............................................
7. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා/පෙළ) : ............................................
8. වෙනත් අධ්‍යාපන සුදුසුකම් : ............................................

ඉහත සඳහන් කරුණු සත්‍ය බව ප්‍රකාශ කරමි.

**දිනය :** ................................   ............................................................

**අයදුම්කරුගේ අත්සන**

## දවසේ රාහු කාලය

උදේ 10.38 සිට 12.10 දක්වා රාත්‍රී 10.42 සිට 12.10 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යෙතිෂවේදී **අජිත් ධර්මසිරි**

## දින තත්ත්වය

මේෂ රවි 03 භාග වප් පුර විසේනිය තිථිය ලත් කිවි දින ඉර උදාව 06.02 ට ඉර බැසීම 06.19 ට රෙහෙණ නැකත රාත්‍රී 11.40 න් ගෙවී මුව සිරස නැකත උදාවේ. බක් පුර විසේනිය සවස 06.06 න් ගෙවී බක් පුර සැටවක තිථිය ලබයි. සෞභාග්‍ය යෝගය සවස 06.23 න් ගෙවී සෝභන යෝගය ලබයි. විෂ්ටි කරණය සවස 06.06 න් ගෙවී ශකුණ කරණය උදාවේ.

විෂ කලාව - දණහිස, අමෘත කලාව - කෙණ්ඩ

යෝගිනි - ගිනිකොන මරු සිටින දිසාව - ගිනිකොන

සුබ දිසාව - නැගෙනහිර

## 2021 අප්‍රේල් 16 සිකුරාදා හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**

06.02 - 07.02 දක්වා - සිකුරු හෝරාව
07.02 - 08.02 දක්වා - බුධ හෝරාව
08.02 - 09.02 දක්වා - සඳු හෝරාව
09.02 - 10.02 දක්වා - සෙනසුරු හෝරාව
10.02 - 11.02 දක්වා - ගුරු හෝරාව
11.02 - 12. 02 දක්වා - කුජ හෝරාව

**රාත්‍රී**

06.02 - 07.02 දක්වා - කුජ හෝරාව
07.02 - 08.02 දක්වා - රවි හෝරාව
08.02 - 09.02 දක්වා - සිකුරු හෝරාව
09.02 - 10.02 දක්වා - බුධ හෝරාව
10.02 - 11.02 දක්වා - සඳු හෝරාව
11.02 - 12. 02 දක්වා - සෙනසුරු හෝරාව

**සවස**

12.02 - 01.02 දක්වා - රවි හෝරාව
01.02 - 02.02 දක්වා - සිකුරු හෝරාව
02.02 - 03.02 දක්වා - බුධ හෝරාව
03.02 - 04.02 දක්වා - සඳු හෝරාව
04.02 - 05.02 දක්වා - සෙනසුරු හෝරාව
05.02 - 06.02 දක්වා - ගුරු හෝරාව

**අලුයම**

12.02 - 01.02 දක්වා - ගුරු හෝරාව
01.02 - 02.02 දක්වා - කුජ හෝරාව
02.02 - 03.02 දක්වා - රවි හෝරාව
03.02 - 04.02 දක්වා - සිකුරු හෝරාව
04.02- 05.02 දක්වා - බුධ හෝරාව
05.02 - 06.02 දක්වා - සඳු හෝරාව

**බබාට නමක්**

මෙදින අලුයම 03.21 දක්වා උත්‍රපල් නැකත යෙදී ඇති හෙයින් ටෙ, ටො, ප, පි අකුරු ද ඉන්පසු උදා වන හත නැකතට අනුව පු, ෂ, ණ අකුරු ද දිනට අනුව ච, ජ, ඡ අකුරු ද මුල් කොට බබාට නමක් දැමීම සුබයි.




## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - ධන හිමිකමක්

මේෂ ලග්නයට අනුව අද ඔබට ධනය ලැබීම් අතින් යහපත් දිනකි. චන්ද්‍රයා බලවත්ව 02හි යෙදීම මෙම ධන සම්පත් හිමි වීමට බලපානු ඇත. යම් සිත් රිදීමක් නිසා ප්‍රියන්ගෙන් වෙන්ව කාලය ගත කිරීමට සිදු වන නමුදු ඔබට අන්‍යයන්ගෙන් බොහෝ ඇප උපකාර ලැබෙනු ඇත. අවුරුදු සැමරීමට අනුව ඔබ ගත් සීතල පාන වර්ග නිසා උගුරේ සෙම ගතියක් මතු කෙරෙනු ඇත.

### වෘෂභ ලග්නය - යන එන තැන් පිළිගැනීමට

චන්ද්‍රයා ලග්නගතව සිටින වෘෂභ ලග්න හිමි ඔබට අද දින ඉතා සතුටුදායක දිනකි. විශේෂයෙන් ප්‍රියසම්භාෂණ ආදිය නිසා ද සිතේ සතුට නිසා සෙසු අය සමග සහයෝගයෙන් කටයුතු කිරීම නිසා ද ඔබව යන එන තැන පිළිගැනීමට ලක්වනු ඇත. හිසේ යම් යම් අපහසුතා දැනේ. සැර උෂ්ණ ආහාර පාන අවම කරන්න.

### මිථුන ලග්නය - පිටරට ගමන් යෙදේ

මිථුන ලග්නයට අනුව අද ඔබට බොහෝවිට සමීපතමයන්ගෙන් දුරස්ව යාමට සිදුවේ. පිටරට යාමට බලාපොරොත්තුවෙන් සිටි අයගේ එම බලාපොරොත්තු සපල වේ. ආර්ථික වශයෙන් වියදම් අධිකවීම ලැබීම් අවම වීම පෙන්වනු ඇත. තම ජීවිතයේ මතක සිටින කරුණක් යෙදේ. එය බොහෝවිට කනගාටුදායක ආරංචියක් විය හැකි. පාදයේ වළලුකරට අගුණයි. ප්‍රවේශම් වන්න.

### කටක ලග්නය - යහපත් ආයෝජනයක්

කටක ලග්නයට අනුව අද ඔබට ආර්ථික වශයෙන් සුබ වන්නේය. හදිසියේ ලැබෙන මුදලක් යහපත් ආයෝජනයකට යොමු කිරීමට වාසනාව ලැබේ. චන්ද්‍රයා 11 වැන්නේ හැසිරෙන අද දින බොහෝවිට තම මවු පාර්ශ්වයේ අය වෙතින් බොහෝ ඇප උපකාර ලැබේ. තම දින චර්යාවට තවත් එක් කාර්යය බහුල කටයුත්තක් එකතු වන දිනකි. යටි බඩ ආශ්‍රිත උවදුරු පෙන්වයි. තෙල් කෑම තවදුරටත් අවම කරන්න.

### සිංහ ලග්නය - රැකියාවේ යහපත

සිංහ ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. සිතේ සතුට අභිවෘද්ධිය උදා වේ. වැඩිහිටි පාර්ශ්වයෙන් ඇප උපකාර ලැබේ. තම නිවහනේ අලුත්වැඩියා කටයුත්තක් වෙනුවෙන් වෙහෙස මහන්සි වීම සිදු වේ. මිල මුදල් අත රැඳුන ද වියදම් අධිකයි. තම එදිනෙදා කටයුතු සකසුරුවම්ව කර ගෙන යාම සුබයි. අන් අය සමග තිබූ ගිවිසුම්වල ස්ථාවර බව රැකෙන දිනකි.

### කන්‍යා ලග්නය - පුණ්‍ය කටයුත්තක ප්‍රධානත්වය

කන්‍යා ලග්නයට අනුව අද ඔබට ඉතා පුණ්‍යවන්ත කටයුත්තකට අත ගැසීමට හැකි වේ. ගම්පියසේ සිදු කරන මහා දානමය පුණ්‍ය කර්මයක ප්‍රධානත්වය ගැනීමට ඔබට සිදු වෙයි. තම පියා මව ඒ තුළින් ඉතා ප්‍රසාදයට පත් වනු ඇත. නව ව්‍යාපාරවලට මග පෑදේ. ඒ සඳහා සුදුසු විශ්වාස කටයුතු පිරිස් සමාජයේ ඇසුරට පත්වනු ඇත.

### තුලා ලග්නය - බාහිර අතපෙවීම් නිසා යුගදිවි ගැටලු

තුලා ලග්නයට අනුව අද ඔබ ඉතා සුපරීක්ෂාකාරි විය යුතුයි. චන්ද්‍රයා 08 හි යෙදී තිබීම ඔබගේ යුගදිවියේ අවුල් මතු කරන තත්ත්වයකි. බාහිර පුද්ගලයින්ගේ අතපෙවීම් නිසා එබඳු සිත් තැවුල් ඇති වන නිසා සුපරීක්ෂාකාරි වන්න. පවුලට අලුතින් එකතු වන සාමාජික සාමාජිකාවන් වෙතින් විවිධ ආකාරයේ දෝශාරෝපණ අසන්නට ලැබෙනු ඇත.

### වෘශ්චික ලග්නය - යුගදිවියේ සතුට

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට ඉතා සුබදායි පණිවුඩ අසන්නට ලැබෙන දිනකි. යුගදිවියේ සතුට අභිවෘද්ධිය ඇති කෙරේ. තම ප්‍රේමය වෙනුවෙන් බොහෝ කැප කිරීම් කෙරේ. තම ගෘහ ජීවිතයේ කාර්යය බහුල වුව ද විනෝදචාරිකා හා නෑදෑයින් බැලීමට යාම වැනි කටයුතු වලදී සතුටුදායක ඇසුරු කිරීම්වලට හේතු වේ.

### ධනු ලග්නය - කරදරයකින් නිදහස

ධනු ලග්නයට අනුව අද ඔබට චන්ද්‍රයා 06 ට එතරම් සුබ නොවුණ ද කලක් පැවති කරදරයකින් අත්මිදීමට හැකිවේ. තමා රැගෙන තිබූ ණය මුදලකින් නිදහස් වීමට හැකිවේ. පිටරට ගමන් යෙදෙන අතර, පිටරටක ගොස් සිටි තම සමීපතමයකුගේ පැමිණීමක් සිදුවේ. ඒ නිසා තම නිවසේ උත්සවශ්‍රියක් උසුලන දිනකි.

### මකර ලග්නය - දරු සම්පත් උරුම වේ

මකර ලග්නයට අනුව අද ඔබට සුබයි. පවුලට නව සාමාජිකයන් එකතු වේ. දරුවන් අපේක්ෂාවෙන් සිටි අයගේ බලාපොරොත්තු සපල වේ. පෙරට වඩා තම ආදායම් උසස් වේ. නව වෙළෙඳ ව්‍යාපාරවලට යොමු වන දිනකි. ආයෝජනය කර තිබූ ව්‍යාපාරික කටයුත්තකින් ආදායම් ලැබෙන දිනකි. තමා ළඟ තිබූ සම්පත් අතර වාහනයක් හෝ නිවසක් පිළිබඳ තිබූ ගැටලු නිරාකරණය කර ගැනීමට හැකිය.

### කුම්භ ලග්නය - අන් අයගේ සහයෝගය

කුම්භ ලග්නයට අනුව අද ඔබට තම රැකියාවේ යහපත උදා වේ. ඒ අනුව කාර්යය බහුලව තිබූ වැඩ තව තව අයගේ සහයෝගයෙන් අවසන් කර ගැනීමට හැකි වේ. තමා මීට පෙර කර තිබූ යෝජනාවකට අනුව නව ආර්ථික ක්‍රමෝපායක් සඳහා වැඩිහිටි පාර්ශ්වයේ අනුමැතිය අනුග්‍රහය ලැබීම තුළ සතුටුදායක තත්ත්වයක් උදා වේ. ආර්ථික වාසි හා රැකියාගත උසස්වීම් පෙනෙන්නට තිබේ.

### මීන ලග්නය - උරුමයක පැවරුමක්

මීන ලග්නයට අනුව අද ඔබට තම දේපළක් හිමි වන ලකුණු මතු කෙරේ. පැවැති නඩුවක් තමාගේ යහපත පිණිස වෙනස් වේ. තමාට සිටි සතුරු පිරිසක් මිතුරු වනු ඇත. තමාගේ නිවසේ හෝ රැකියා ස්ථානයේ තමාට සිටි උදව්කරුවන්ගෙන් යහපත් සහයෝගයක් ලැබෙන දිනකි. පිය පාර්ශ්වයේ නොමඳ සහයෝගය නිසා තම දේපළවල උරුමය ලෙහෙසියෙන්ම තමාට පැවරෙනු ඇත.

# ජාතියට හුස්ම දෙන නැකත

## අද පෙරවරු 6.40ට නැකතට පැළයක් සිටුවීමට එක්වෙමු



**කලාවැව යටතේ පෝෂණය වන විශාල බිම් ප්‍රදේශය පුරා පවතින මහා වනය හෙළි පෙහෙළි කර එම මහා වනයේ පැවැති සියලු වටිනා ශාක විනාශ කරමින් දුර්ලභ සතුන් විශාල පිරිසකට මරණය හිමි කරමින් මහවැලි එච් කලාපය බිහි විය.**

අප රටේ වනගහනය අඩුවෙමින් පවතින බවට මේ දිනවල නොයෙකුත් අංශවලින් රජයට චෝදනා එල්ල වෙමින් තිබේ. වත්මන් රජය බලයට පත් වූ පසුව වනගහනය අඩු වෙමින් පවතින්නේයැයි සමහරුන් ප්‍රකාශ කළ ද එහි ඇත්තේ අර්ධ සත්‍යයකි. කැලෑ එළි කිරීම සෑම වසරකම පාහේ කිසියම් පිරිසක් විසින් සිදු කරනු ලබන ක්‍රියාවලියකි. රජය නීතිරීති ක්‍රියාත්මක කළ ද ඉන් රිංගා ගොස් ඇතැම් පිරිස් තුරුලතා විනාශ කරන්නේ එහි ඇති අගය නොදන්නාකමට වඩා ආත්මාර්ථකාමීත්වය නිසාය.

කරුණු සොයා බැලීමේ දී වැඩිම කැලෑ හෙළි පෙහෙළි කිරීම් සිදුව ඇත්තේ කඩිනම් මහවැලි සංවර්ධන වැඩපිළිවෙළ යටතේය. 1977 බලයට පත් වූ එක්සත් ජාතික පක්ෂ රජය විසින් ක්‍රියාත්මක කරන ලද කඩිනම් මහවැලි වැඩපිළිවෙළ යටතේ මහවැලි එච් කලාපයේ සිදු වූ සංවර්ධන වැඩපිළිවෙළ ගැන අද සිටින බොහෝ දෙනෙක් දන්නේ නැත.

කලාවැව යටතේ පෝෂණය වන විශාල බිම් ප්‍රදේශය පුරා පවතින මහා වනය හෙළි පෙහෙළි කර එම මහා වනයේ පැවැති සියලුම වටිනා ශාක විනාශ කරමින් දුර්ලභ සතුන් විශාල පිරිසකට මරණය හිමි කරමින් මහවැලි එච් කලාපය බිහි විය. ඇත්තටම මහවැලි කඩිනම් සංවර්ධන වැඩපිළිවෙළ මගින් සිදු වූ වන විනාශය නොවිය යුත්තක්යැයි මම අදහස් නොකරමි.

එහෙත් සංවර්ධන ව්‍යාපෘති රජයක් විසින් ක්‍රියාත්මක කරන්නේ මහජනතාවගේ සුබසිද්ධිය සඳහාය. එහිදී යම් යම් පාරිසරික හානි සිදුවීම කිසිසේත්ම වළක්වා ගත හැක්කක් නොවේ.

වාසනාවකට අද මෙන් එදා සමාජ මාධ්‍යය නොවීය. අද මෙන් එදාත් සමාජ මාධ්‍ය හා පුරවැසි මාධ්‍ය කලාව පැවැතියේ නම් වර්තමානයේ රටටම බත දෙන මහවැලි එච් කලාපයක් නැත.

නමුත් එදා දැවැන්ත වන විනාශයක් සිදු කරමින් ආරම්භ වූ මහවැලි එච් කලාපය අද රටට අවශ්‍ය බත සපයන ප්‍රධානම වගා කලාපයයි. රටේ වාර්ෂික වී අස්වැන්නෙන් වැඩිම ප්‍රතිශතයක් ලබා දෙන්නේ කඩිනම් මහවැලි සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ආරම්භ වූ මහවැලි එච් කලාපය හා වලවේ කලාපයයි.

ඒ නිසා සංවර්ධනය හා පරිසර සුරක්ෂිතතාව යනු සමානුපාතිකව පවත්වාගෙන යා හැකි කරුණු දෙයක් නොවේ. පරිසරය හා සංවර්ධනය සමානුපාතිකව පවත්වාගෙන යෑම තිරසාර සංවර්ධනය වන්නේය.

එහෙත් අපේ රටේ බොහෝ දෙනකු තවමත් පාරිසරික වටිනාකම සම්පත් හිගකම හා තිබෙන සොබාවික සම්පත් බෙදා හදාගෙන පරිහරණය කිරීම සම්බන්ධව අවබෝධ කර ගෙන නැත. අප කුඩා කාලයේ ගායනා කළ මෙන්ම තවමත් අපේ රටේ කුඩා දරුවන් ගයන කවියක් පහත දැක්වේ. පරම්පරා ගණනක් තිස්සේ අපේ රටේ සියලුම දෙනා හොඳින් දන්නා මේ කවිය සම්පත් බෙදා හදාගෙන ආත්මාර්ථයෙන් තොරව ජීවත්වීමේ පාඩම අපට කියා දෙයි.

**මේ ගසේ බොහෝ- පැණි දොඩම් තිබේ**
**පැහිලා ඉදිලා බිමට නැමිලා බර වෙලා අතු**
**නංගිටයි මටයි - ගෙඩි දෙකක් ඇතී**
**වැඩිය කඩන නරක ළමයි හෙම - නෙවෙයි අපී**

මේ කවියෙන් කියවෙන බරපතළ ගැඹුරු අර්ථය නම් සම්පත් කොතරම් තිබුණත් ඒවා තනිවම භුක්ති නොවිඳ අන් අයටත් ඉතිරි කළ යුතු බව නොවේද?.

එහෙත් අද අපේ රටේ ස්වාභාවික සම්පත් පරිහරණයේ දී අප කෙතරම් ආත්මාර්ථකාමීද යන්න හැම කෙනකුම සිතා බැලිය යුතුය.

ගහකොළ, සතා සීපාවා, ඇළ දොළ, ගංගා සාගර ආදී සියලුම දෑ ස්වාභාවික සම්පත් ය. සොබා දහම විසින් ඒවා ලොවට දායාද කර තිබෙන්නේ තනි භුක්තියට නොව හැමටම සමානව භුක්ති විඳීම සඳහාය. සොබා දහමේ අපුරුම නිර්මාණය යනු ශාක ප්‍රජාවන්ය. ගසුත් හරියට මිනිස්සු වගේයැයි කියමනක් අසා තිබේ.

ඇතැම් ගස් පරාර්ථකාමී ය. එමෙන්ම ඇතැම් ශාක අතිශයින්ම ආත්මාර්ථකාමීය. අනුන් නසා හෝ තමන්ගේ පණ නළ බේරා ගැනීමට ඇතැම් ශාක උත්සුක ය.

එහෙත් මේ ආත්මාර්ථකාමී හා පරාර්ථකාමී සියලු වෘක්ෂයෝ සත්ත්ව සන්හතියේ පැවැත්ම උදෙසා වන වැදගත්ම කාර්යභාරය කරති; සතුන්ට අහිතකර කාබන් ඩයොක්සයිඩ් විෂ වායුව තමන් උරා ගනිමින් ජීවයේ පැවැත්මට තුඩු දෙන ඔක්සිජන් නිපදවති; එමෙන්ම තමා තුළ තමන්ම නිපදවා ගන්නා ආහාර උපයෝගී කර ගනිමින් අන් අයට රසවත් ආහාර නිපදවා දෙති.

එමෙන්ම ජීවයේ සමස්ත පැවැත්මට උපකාරී වන්නා වූ පිරිසුදු ජලය මහපොළවේ ගබඩා කරමින් ජීවය පවත්වාගෙන යෑමට උපකාරී වෙති.

පරිසර අමාත්‍යාංශය විසින් පළමුවරට මෙරට ශාකගහනය ඉහළ නැංවීමට අරඹන ලද රුක් රෝපණ වැඩ සටහන හුස්ම දෙනතුරු ජාතික රුක් රෝපණ වැඩ සටහනයි. මේ වැඩසටහනේ මූලික අරමුණ වුයේ රජයේ මුදල් ශත පහක් හෝ වැය නොකර අන් සියලු දෙනා පරිසර සංරක්ෂණයට යොමු කරවා ගැනීමයි.

ඒ අනුව පෞද්ගලික අංශයේ සියලු සහාය ලබා ගනිමින් හුස්ම දෙන තුරු රුක් රෝපණ වැඩසටහන ආරම්භ විය. මෙහි සමාරම්භක වැඩසටහන පසුගිය පෙබරවාරි මස 20 වැනිදින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහභාගිත්වයෙන් බත්තරමුල්ල ආරක්ෂක මූලස්ථාන පිවිසුමේ ආරම්භ විය.

හුස්ම දෙන තුරු ජාතික රුක් රෝපණ වැඩසටහනින් අපේක්ෂා කරනුයේ මේ රටේ ඉදිරි වසර හතරහමාර තුළ මෙරට රුක් ගහනයට තවත් වෘක්ෂයන් ලක්ෂ 20ක් අලුතින් එක් කිරීමයි. එම උදාර අරමුණ පෙරදැරිව ඇරඹි හුස්ම දෙන තුරු මාස හතරක කාල සීමාවක් තුළ පැළ 10.7000ක් රෝපණය කිරීමට හැකි විය.




ඒ අනුව යමින් මෙවර සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයේ දී ජාතික අවුරුදු නැකැත් සීට්ටුවට අලුතින් එක් වූ නැකත වුයේ ජාතික රුක් රෝපණ නැකතයි.

අප්‍රේල් මස 16 වැනි දින එනම් අද පෙරවරු 6.40ට යෙදෙන සුබ මොහොතින් නැගෙනහිර දිසාව බලා පැළයක් රෝපණය කිරීම මැනවි යැයි ජාතික නැකැත් සීට්ටුවේ දැක්වේ.

අපේ රටේ ජනතාව වසර 2500කටත් එහා ගිය ශක්තිමත් සංස්කෘතියක අයිතිකාරයෝය. එම දීර්ඝ කාලය තුළ සතත අභ්‍යාසය හා පරිකල්පනය මෙන්ම භාවිතාවෙන් ලත් දැනුම හේතුවෙන් එම දැනුම පාරම්පරිකව පවත්වාගෙන ඒමට ජනතාව කටයුතු කළෝය.

එම පාරම්පරික සාම්ප්‍රදායික දැනුම දෙස බලන විට අතීතයේ දී මෙරට මිනිස්සු ගොවිතැන් බත් කළේ ගහක් කොළයක් රෝපණය කළේද නැකතට අනුවය. ඇතැම් සාර්ථක නැකැත්වල දී එකට හැටක් පැහෙනවායැයි ගැමියෝ පවසන්නේ අල්ලක් වපුරා මල්ලක් ගෙට ගන්නට තරම් ඇතැම් නැකැත් ප්‍රබල බව ඔවුන් අත්දැකීමෙන් දැන සිටි නිසාය.

බුදුන්වහන්සේ දේශනා කළ පරිදි වෘක්ෂලතා යනු අපූර්ව ජීවි කොටසකි. තමන් නසා දැමීමට එන මිනිසාට පවා සෙවණ සදමින් ඔහුට ප්‍රණීත පලතුරු ලබා දෙන වෘක්ෂලතා රැක ගැනීම සෑම කෙනෙකුගේම වගකීමකි.

අප තුරුලතා වැඩිපුර රෝපණය කළ යුත්තේ ඇයි දැයි සිතා බැලිය යුතුය. සාමාන්‍යයෙන් මිනිසකුට දිනකට අවශ්‍ය ඔක්සිජන් ප්‍රමාණය ලීටර් 550ක් වේ. බර අනුව ගතහොත් දිනකට කිලෝ ග්‍රෑම් 2.3ක ඔක්සිජන් එක් පුද්ගලයකුට අවශ්‍යය වේ. එක් මිනිසකුට අවශ්‍ය ඔක්සිජන් නිපදවීමට ගස් 10ක් අවශ්‍යය වේ. එහෙත් දිනකට ඔක්සිජන් ලීටර් 550ක් ආශ්වාස කරන මිනිස්සු පසුව අසන්නේ ඔක්සිජන් කන්නද කියාය.

එමෙන්ම දිනකට ඔක්සිජන් ලීටර් 550ක් ආශ්වාස කරන මිනිස්සු අඩු තරමින් තමන් පරිසරයට ඇති ණය ගෙවා දැමීමට ජීවිත කාලයටම එක් ගසක්වත් රෝපණය කරන්නේ නැත. ගස් සමග ජීවත්වීම කලාවකි. වෘක්ෂලතාවෝ අපට පිරිසුදු වාතය ආහාරපාන දෙනවා මෙන්ම අපට ආදරය කරති. අපෙන් ආදරය රැකවරණය අපේක්ෂා කරති. එහෙත් අපේ රටේ වර්තමානයේ ගසකට ආදරයෙන් කතා කරන මිනිස්සු සිටින්නේ කීයෙන් කී දෙනාදැයි සිතිය යුතුය.

මිනිසුන්ට ආදරය කිරීමට වෙලාවක් නැති මිනිස්සු ගස්වලට ආදරය කරන්නේ කෙසේදැයි සමහරු විමසිය හැකිය. පරිපාලන සේවාවේ අමාත්‍යාංශයක ලේකම් ධුරයක් දැරූ මගේ හිතවත් නිලධාරියකු සමග එක් පසු වරුවක මම ඔහුගේ නිවසට ගියෙමි. ගේට්ටුවෙන් ඇතුළු වූ ඔහු පළමුව ගියේ තම නිවෙස ඉදිරිපිට ඇති අඹ ගස ළඟටය. එහි ගොස් අඹ ගස දෙස බලා කීපවරක් අඹ ගසේ කඳ අතගා එම අඹ ගස් සිඹබේය.

පසුව මම ඔහුගෙන් ඒ ගැන විමසීමි. ඔහු මට දුන් පිළිතුර වුයේ මම උදේ නිවෙසින් බැහැරව යන විට ගෙදර ප්‍රශ්න මම අඹ ගහට බාර දෙනවා. ආපසු සවසට ආපසු කාර්යාලයේ ප්‍රශ්නත් මම අඹ ගහට බාර දෙනවා. මම ගෙදර ප්‍රශ්න කාර්යාලයට අරගෙන යන්නෙත් නෑ. කාර්යාලයේ ප්‍රශ්න මම ගෙදරට ගේන්නෙත් නෑ. මේ අඹ ගහ අවුරුද්දට දෙපාරක් මගෙන් ගත් ප්‍රශ්න රසවත් අඹ ගෙඩි විදියට මට ආපහු දෙනවා. ඒ නිසා මම මේ ගසට ආදරය කරනවා."

ගස්වලට කතා කරන්න හැකි නම් ඔවුන් කෙතරම් විසිතුරු දේ අපිට කියාවිද යැයි ඇතැම් විට ඔබ මොහොතකටවත් නොසිතන්නට ඇත. නමුත් අප කරන සියල්ල දෙස මේ වෘක්ෂලතාවෝ බලා සිටිති. යම් කිසිවකු ගහක් කපන්නේ නම් සැබවින්ම ඔහු සිදුකරන්නේ පර පණ නැසීමකි. හෙතෙම මිනීමරුවෙකි. දඬුවම් ලැබිය යුත්තෙකි.

තුරුලතා නොසලකා හළ ලෝකයේ ඇතැම් රටවල්වල ජනතාවට අද කාර්මීකරණය මෙන්ම අසීමාන්තික නාගරීකරණය හේතුවෙන් වායු ගෝලය අපිරිසුදු වීම නිසා පිරිසුදු වාතය ටිකක් හෝ නොමැතිව ඔක්සිජන් ටැංකි පිටේ බැඳගෙන යෑමට සිදුව තිබේ.

එහෙත් අපේ රටේ තවමත් වායුගෝලීය දූෂණය දෙස බැලීමේ දී ලෝකයේ හොඳම වායුගෝලය ඇති රටක් වශයෙන් අපට සතුටු විය හැකිය. එහෙත් මේ තත්ත්වය පවත්වා ගැනීම වූ කලි අප මුහුණ දෙන දැවැන්තම අභියෝගයයි. ඒ සඳහා අප කළ යුත්තේ වැඩිපුර කාබන්ඩයොක්සයිඩ් අවශෝෂණය කර ගනිමින් සත්ත්ව ප්‍රජාවට හුස්ම දෙනතුරු ප්‍රජාව ඉහළ නැංවීමය.

ඒ අනුව මෙවර අලුත් අවුරුද්දට නැකතට පැළයක් රෝපණය කිරීමට පරිසර ඇමැති මහින්ද අමරවීර මහතාගේ සංකල්පයක් පරිදි මේ වන විටත් අවශ්‍ය සියලු කටයුතු යොදා තිබේ.

මෙවර අලුත් අවුරුදු උත්සවයේ දී අප්‍රේල් මස 16 එනම් අද පෙරවරු 6.40ට යෙදෙන සුබ නැකත ජාතියට හුස්ම දෙන ජාතික නැකතයි. එදිනට නැකැත් වේලාවට නැගෙනහිර දිසාව බලා ඔබට පැළයක් රෝපණය කළ හැකියි. අපේ රටේ පවුල් ලක්ෂ 53ක් සිටිති. ඉන් අඩුම තරමින් පවුල් ලක්ෂ 30ක් වත් එකම මොහොතේ මේ පැළ රෝපණයට එක් වුව හොත් එය එකම දිනෙක එකම මොහොතක වැඩිම පිරිසක් පැළ රෝපණය කළ රටක් වශයෙන් අපේ රට ඉතිහාසගත වනු ඇත.

ඒ කෙසේ වෙතත් මේ මාහැඟි අවස්ථාවට දායකත්වය දුන් පුරවැසියකු සේ ඔබට සතුටු විය හැකිය.

ඒ නිසා ජාතියට හුස්ම දෙන මේ මහා නැකතේ දී ඔබේ ගෙවත්තේ ද කුමක් හෝ පැළයක් රෝපණය කරමින් හුස්ම දෙනතුරු රැක ගැනීමට දායක වීම ඔබ ඉටු කරන සමාජීය වගකීමකි.

**ධර්ම වන්නිනායක**

# SDB - SAPP - IFAD එක්ව කිරි ගොවි ව්‍යවසායකයෝ සවිබල ගන්වති



SDB බැංකුව ව්‍යවසායකත්වය සංවර්ධනයේ නියැළී සිටින වැදගත් ආයතනයන් කිහිපයක් වන SAPP (කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන), IFAD (කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අන්තර්ජාතික අරමුදල්), සහ MILCO ආයතනය සමඟ එක්ව දියර කිරි කර්මාන්තයෙහි නිරත යොවුන් ව්‍යවසායකයන් වෙනුවෙන් ණය අරමුදල් ප්‍රදානය කිරීමේ උත්සවයක් පසුගියදා පොළොන්නරුව අරලගංවිලදී පැවත්විණි.

මේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා සහභාගි වූ අතර, සෙසු ගෞරවනීය ආරාධිත අමුත්තන් වශයෙන් SDB බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී තිලක් පියදිගම මහතා, SAPP ව්‍යාපෘති අධ්‍යක්ෂ - යසන්තා මාපටුන මිය, MILCO සමාගමේ සභාපති ලසන්ත වික්‍රමසිංහ මහතා ඇතුළු පිරිසක් සහභාගි වූහ. SAPP සහ IFAD විසින් ගෙන යන මේ ව්‍යසායකයන් සවිබල ගන්වන වැඩසටහනේ අරමුදල් සපයන්නා වශයෙන් SDB බැංකුව විසින් අනුමත කර තිබූ ණය ආධාර කිහිපයක් මේ අවස්ථාවේදී නිල වශයෙන් ප්‍රදානය කෙරිණි.




# DFCC කාඩ් පත් හිමියන්ට 60%ක් දක්වා ඉතුරුම් වට්ටම්

DFCC බැංකුව මෙවර අලුත් අවුරුදු සමය වෙනුවෙන් දිවයින පුරා වෙළෙඳසල් 300 කට අධික සංඛ්‍යාවක් සමඟ අත්වැල් බැඳ ගෙන සිය කාඩ් පත් හිමියන්ට 60% ක් දක්වා ඉතුරුම් වට්ටම් පිරිනැමීමට පියවර ගෙන තිබේ. වෙළෙඳසල්වලින් එදිනෙදා භාණ්ඩ හා ඉලෙක්ට්‍රොනික භාණ්ඩ මිලදී ගැනීමේදී මෙන්ම, විද්‍යුත්-වාණිජ (E-commerce) වෙබ් අඩවිවලින් මිලදී ගැනීම් කිරීමේදී ද තම ගනුදෙනුකරුවන්ට සුවිශේෂ වාසි අත් කර දීම සඳහා DFCC බැංකුව මේ වැඩසටහන හඳුන්වා දී තිබේ.

මේ ඉතුරුම්වලට අමතරව, වසර පුරා කරන සෑම මිල දී ගැනීමක් සඳහාම 1% ක CashBack දීමනාවක් දෙන අතර, එම මුදල් කාඩ්පත් හිමියාගේ DFCC බැංකු ගිණුම වෙත බැර වේ. මේ සුවිශේෂ දීමනාව අවුරුදු සමයේ තමන් සහ තම ආදරණීයයන් වෙනුවෙන් මිල දී ගැනීම් කරන ගනුදෙනුකරුවන්ට ලැබෙන සුවිශේෂ වාසියක් ලෙස හැඳින්විය හැකිය. මීට අමතරව, කාඩ්පත් සඳහා වන ණය සහ ශේෂයන් හුවමාරු කිරීමේ සේවාවන්වලදී අඩුම පිරිසැකසුම් ගාස්තුවක් අය කරනු ලබන්නේද DFCC බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වීමද තවත් එක් විශේෂත්වයකි.

# මල්ලිකා හේමචන්ද්‍ර වෙතින් නව අභරණ මාදිලි රැසක්



දිවයිනේ ප්‍රමුඛතම ස්වර්ණාභරණ සන්නාමයක් වන මල්ලිකා හේමචන්ද්‍ර ජුවලර්ස් සිංහල අලුත් අවුරුදු සමය සමරමින් පාරිභෝගිකයාගේ අවශ්‍යතා සපුරාලීමට නව ස්වර්ණාභරණ මාදිලි රැසක් එළි දක්වා ඇත.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පසුගිය වසරේදී අපි තරමක් නිහඬව සිංහල අලුත් අවුරුද්ද සැමරුවෙමු. එබැවින් මල්ලිකා හේමචන්ද්‍ර ජුවලර්ස් මේ උත්සව සමය සැමරීමට මිනිසුන් දිරිමත් කිරීමේ අභිලාෂයෙන් 'හොඳම නැකතට හොඳම ස්වර්ණාභරණ' යන තේමාවෙන් නවතම ප්‍රවර්ධන වැඩසටහන ඉදිරිපත් කර ඇත. මෙහිදී සාම්ප්‍රදායික පෙතිමාල සහ ලියවැල් මෝස්තර මූලික කොට ගනිමින් තවත් මෝස්තර රාශියක් සහ දියමන්ති එකතුවක් එළි දක්වා ඇත.

# AMW නියෝජිත ප්‍රදර්ශනාගාරයක් ගම්පහට



AMW පෞද්ගලික සමාගම (Associated Motor Ways Private Limited) ගම්පහ ප්‍රදේශයේ සිය නවතම ප්‍රදර්ශනාගාරය විවෘත කිරීමට පසුගියදා කටයුතු කළේය. Glitz Park පුද්. සමාගම සමඟ එක්වී මිරිස්වත්ත ප්‍රදේශයේ මේ නව ප්‍රදර්ශනාගාරය විවෘත කර තිබේ. මේ ඔස්සේ දැන් ගම්පහ ප්‍රදේශයේ ජනතාවට AMW සමාගමේ සේවා වඩාත් පහසුවෙන් අත්විඳිය හැකිය. නව ප්‍රදර්ශනාගාරයෙන් ගම්පහ ජනතාවට සියලු වර්ග හා මාදිලිවලට අයත් වාහන වඩාත් පහසුවෙන් හා විශ්වාසයෙන් යුතුව මිලදී ගැනීමට, විකිණීමට හා හුවමාරු කිරීමට අවස්ථාව සැලසේ. පාවිච්චි කළ වාහන සඳහා වසර 3ක වගකීමක් හිමිවීම, වාහන සඳහා හොඳම මිලක් ලැබීම, පැය 24ක් තුළ මුදල් ගත හැකි වීම සහ පැය කිහිපයක් තුළ හුවමාරුව කළ හැකි වීම වැනි සුවිශේෂී ප්‍රතිලාභ රාශියක් මෙමඟින් පාරිභෝගිකයන් වෙත හිමි වනු ඇත.

AMW රථවාහන සඳහා අලෙවිය, සේවාවන් හා අමතර කොටස් සපයන 3S මධ්‍යස්ථානයක් (Sales, Services and Spares) ලෙස ක්‍රියාත්මක වන ගම්පහ නව ප්‍රදර්ශනාගාරය තුළදී අනෙකුත් සියලු වර්ගවල වාහන විකිණීමට හා මිලදී ගැනීමටද අවස්ථාව සලසා දී තිබේ.

Glitz Park සමාගම 2005 වසරේ සිටම AMW සමඟ අත්වැල් බැඳගෙන සිටින අතර, ගම්පහ දිස්ත්‍රික්කයේ විශාලම නියෝජිත ආයතනය ලෙස සැලකේ. ගුණාත්මක සේවාව සම්බන්ධයෙන් වසර ගණනාවක් පුරා විහිදෙන කීර්තියක් එම සමාගම සතුය.


# ප්‍රිමියර් පැකේජින් ඉන්ටර්නැෂනල් ලෝකඩ සම්මාන ලබයි



තේ බෑග් ටැග් සහ කවර මුද්‍රණයෙහි ප්‍රමුඛයකු වන සී/ස ප්‍රිමියර් පැකේජින් ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) සමාගම 28 වැනි වාර්ෂික NCE අපනයන සම්මාන උලෙළේදී අපනයන සැපයුම් අංශයේ මධ්‍යම පරිමාණ කාණ්ඩයේ ලෝකඩ සම්මානය දිනා ගත්තේය. ජාතික අපනයන මණ්ඩලය සංවිධාන කළ සම්මාන උලෙළ පසුගියදා කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේදී උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි. "මේ ජයග්‍රහණය ප්‍රිමියර් පැකේජිං සමාගමේ කෙටි ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් වශයෙන් හැඳින්විය හැකියි. සම්මාන දිනා ගැනීමට නන් අයුරින් දායක වූ කාර්ය මණ්ඩලයේ හෘදයාංගම කැප වීම වෙනුවෙන් මාගේ කෘතඥතාව පුද කරනවා." ප්‍රිමියර් පැකේජින් ඉන්ටර්නැෂනල් සමාගමේ සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ ජයන්ත කරුණාරත්න මහතා පැවසීය.

ඉම්පීරියල් ටීස් සමූහයේ ශාඛා සමාගමක් ලෙස 2012දී ඇරඹි ප්‍රිමියර් පැකේජින් ඉන්ටර්නැෂනල් ප්‍රමුඛ පෙළේ තේ බෑග් නිෂ්පාදන හා අපනයන සමාගම්වලට තේ බෑග්, ටැග් සහ කවර මුද්‍රණය කරයි. ප්‍රිමියර් පැකේජින් ඉන්ටර්නැෂනල් සමාගමට අයත් නවීන අධි තාක්ෂණික යන්ත්‍ර සපිරි ප්‍රධාන මුද්‍රණාලය කැලණියෙහි පිහිටා ඇති අතර කඩදාසියේ දෙපසම ෆ්ලෙක්සෝ මුද්‍රණය, පාර ජම්බූල වාර්නිෂ්කරණය ඇතුළු නවතම මුද්‍රණ හැකියාවන් රැසක් එය සතුය. රීවයින්ඩින්, ඔන්ලයින්/ඕෆ්ලයින් ස්ලිටින්, ජම්බෝ ජේපර් ස්ලිටින් යන පහසුකම්ද එහි ඇත. එමෙන්ම සේවාදායක අවශ්‍යතා අනුව දිවයිනේ දැනට භාවිත වන ඕනෑම තේ බෑග් නිෂ්පාදන යන්ත්‍රයකට ගැළපෙන පරිදි වර්ණ රැසකින් තේ බෑග් ටැග් හා කවර මුද්‍රණය කිරීම සමාගමේ සුවිශේෂත්වයකි. පාරිභෝගික විශ්වාසය අඛණ්ඩව රැක ගනිමින් උසස් තත්ත්වයේ සේවාවක් පවත්වා ගැනීමට ඇප කැප වූ ප්‍රිමියර් පැකේජින් ඉන්ටර්නැෂනල් ISO 22000:2018 තත්ත්ව සහතිකය දිනා ඇති අතර මුද්‍රණ ශිල්පයේ විසි වසරකට වැඩි අත්දැකීම් ලත් 25කට අධික පලපුරුදු කාර්ය මණ්ඩලය, අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය සකසා ගැනීමේ සිට බෙදා හැරීම් සේවාව දක්වා ආයතනයේ සියලු කටයුතු කිරීමට ඇති හැකියාව හා සේවක මහතුන්ගේ කැප වීම සමාගමට අමතර ශක්තියකි.

# බිග් බෑඩ් වුල්ෆ් ඔන්ලයින් පොත් ප්‍රදර්ශනය නැවතත්




වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් අතරට පැමිණෙන ඔවුන්ගේ ප්‍රියතම වෘකයා වන බිග් බෑඩ් වුල්ෆ් දෙවැනි වරටත් ඔන්ලයින් පොත් ප්‍රදර්ශනයක් ලෙසින් ඔවුන්ගේ පස්වැනි ලංකාගමනය සටහන් කරමින් ශ්‍රී ලාංකීය පොත් ලෝලීන් වෙත පැමිණීමට නියමිතය. බිග් බෑඩ් වුල්ෆ් ශ්‍රී ලංකාවට පැමිණීමට ඉතා සුළු කාලයක් පවතින අතර මෙවර ඔවුන්ගේ පොත් ලෝලීන්ට නැවුම් අත්දැකීමක් ගෙන ඒමට ඔවුන් සැදී පැහැදී සිටී. මැයි 5 වැනිදා සිට 12 වැනිදා දක්වා පොත් ප්‍රදර්ශනය පැවැත්වීමට නියමිත අතර, මෙවරද අති උත්කර්ෂවත් අන්දමින් සහනදායී මිලට පොත් මිලදී ගැනීමේ හැකියාව පොත් ලෝලීන්ට දීමට නියමිතය.

පුරා වසර දෙකක් පුරාවටම පොත් ප්‍රදර්ශනය ඔන්ලයින් ආකාරයෙන් පැවැත්වීමට හේතුව වූයේ ලංකාවාසී පොත් ලෝලීන්ට ආරක්ෂිතව සහ සුවපහසු අන්දමින් පොත් ප්‍රදර්ශනය රසවිඳීමට ඉඩ සැලසීමත්, ඒ අතරම සංචාරක නීති සහ සීමා තවමත් කොවිඩ් තත්ත්වයට පෙර පැවති ආකාරයට සකස් වී නොමැති වීමත්ය. එසේම ගිය වසරේ පැවති පොත් ප්‍රදර්ශනයෙන් අවධාරණය වූ කරුණක් වූයේ ලංකාවාසී පොත් ලෝලීන් බිග් බෑඩ් වුල්ෆ්ව ඔන්ලයින් ස්වරූපයෙන් මුණ ගැසීමට වඩාත් කැමැත්තක් දක්වන බවයි. ගිය වර පැවති පොත් ප්‍රදර්ශනයෙන් ලද අත්දැකීම්වලින් මෙවර ප්‍රදර්ශනය ඊට සාපේක්ෂව සියලු අංශයන්ගේ වැඩි දියුණු කිරීම් සහ වෙනස්කම් සහිතව නැවුම් ආකාරයකින් පැවැත්වීමට කටයුතු සලසා ඇත.

# Eco Tablet සන්නාම තානාපති ඩිලන්ත මාලගමුව



වාහනවල එන්ජිමේ ක්‍රියාකාරීත්වය ඉහළ නංවන ඉන්ධන දහනය කාර්යක්ෂම කරන ලොව ප්‍රකට නිෂ්පාදනයක් වන Eco Tablet සන්නාම තානාපති වශයෙන් ජනප්‍රිය මෝටර් රථ ධාවන ශූර ඩිලන්ත මාලගමුව පත් කරන ලදි. අන්තර්ජාතිකව ජය ගත් කීර්තිමත් ධාවන ශූරයකු වන ඩිලන්ත මාලගමුව මහතාට Eco Tablet පිළිබඳ ඇති ඉහළ විශ්වාසය මේ එකඟතාවට හේතු විය. "මම ජීවිතයේ සෑම වෙලාවකම ප්‍රමිතියෙන් ඉහළ දේවල් පාවිච්චි කරන කෙනෙක්. තරගයකදී හොඳ වාහන, හොඳ ටයර්, හොඳ ඉංජිනේරුවන් අවශ්‍ය වෙනවා. ඒ වගේ ඉහළ කාර්යක්ෂමතාවකින් ඉන්ධන දහනයත් ඉතා වැදගත්. මට මෑතකදී Eco Tablet ගැන දැන ගන්න ලැබුණා. ඉතිං මම මගේ ලැම්බෝගිනි රථයටම එය යොදා පරික්ෂා කළා. ඉන්පසුව වැසි ඩයිනෝ එකේ දාලා එහි ප්‍රමිතිය පරික්ෂා කළා. සැබැවින්ම එය අගනා නිෂ්පාදනයක්." ඩිලන්ත මාලගමුව මහතා පැවසීය.

Eco Tablet වෙළෙඳපොළට නිකුත් කරන්නේ සී/ස සිලෝන් ග්‍රීන් ප්‍රොඩියුස් සමාගමයි. Eco Tablet නැනෝ තාක්ෂණය ඇසුරින් කාබනික ද්‍රව්‍ය පමණක් යොදා නිපදවයි. මෙය ඉන්ධන සමඟ මුසු කළ යුතු අතර පෙට්‍රල් වාහන සඳහා Eco Racing නමින්ද, ඩීසල් වාහන සඳහා Eco Diesel නමින්ද ගත හැකිය. මධ්‍යම පරිසර අධිකාරිය ECO Tablets පරිසර හිතකාමී නිෂ්පාදනයක් ලෙස සහතික කර ඇති අතර ECO Tablets භාවිතය එන්ජිමේ ආයු කාලය දෙගුණයකින් වැඩි වීමට සහ ස්පාර්ක් ප්ලග්, දහන කුටීර හා ඉන්ධන ටැංකිය පිරිසුදු වීමට හේතු වේ. Eco Tablets භාවිතයෙන් 20%ක් 50%ක් අතර ඉන්ධන ඉතිරියක් සිදු වේ. Eco Racing ඔක්ටේන් අගය 5ත් 10ත් අතර වැඩි කරයි. Eco Diesel සීටේන් අගය 2ත් 5ත් අතර වැඩි කරයි. එසේම කාබන් මොනොක්සයිඩ් පිටවීම 100%ක් සහ සල්ෆර් ඩයොක්සයිඩ් පිටවීම 99%ක් අඩු කරයි. ප්‍රවීණ මෝටර් රථ ඉංජිනේරුවන් රැසක් අගය කර ඇති Eco Tablets සිලෝන් ග්‍රීන් ප්‍රෝඩියුස් සමාගමේ පරිසර හිතකාමී නිෂ්පාදනයකි.

# බිටුලින්ක් ඉමල්ෂන් සම්මාන ද්විත්වයක් දිනයි



මෙරට මහා මාර්ග ඉදිකිරීම්වල මූලිකම අමුද්‍රව්‍යයක් වන තාර හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සැපයීමෙහි දැවැන්තයා වන සී/ස බිටුලින්ක් ඉමල්ෂන් පෞද්ගලික සමාගම CNCI Achiever Awards 2020 සම්මාන උලෙළේදී අගනා සම්මාන දෙකක් දිනා ගනිමින් සිය විශිෂ්ටත්වය යළිත් තහවුරු කළේය. නිෂ්පාදන අංශයේ මහා පරිමාණ කාණ්ඩයෙන් තරග කළ බිටුලින්ක් ඉමල්ෂන් ජාතික මට්ටමේ කුසලතා සම්මානයකින් හා පළාත් මට්ටමේ රිදී සම්මානයකින් පිදුම් ලැබීය. ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය සංවිධාන කළ සම්මාන උලෙළ කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ ගලධාරි හෝටලයේදී පසුගියදා උත්කර්ෂවත් ලෙසින් පැවැත්විණි.

"මේ සාඩම්බර ජයග්‍රහණය අපේ ගමන් මගේ සුවිශේෂ සන්ධිස්ථානයක් සටහන් කරනවා. මේ සාඩම්බර ඓතිහාසික මොහොත අප වෙත උදා කර දීමට වෙහෙස නොබලා කැප වූ බිටුලින්ක් ඉමල්ෂන් කළමනාකාරීත්වයේ සියලු දෙනා ඇතුළු කාර්ය මණ්ඩලයට මගේ කෘතඥතාව පුද කරනවා. සැබෑ ශ්‍රී ලාංකීය සමාගමක් වශයෙන් මං මාවත් තැනීමේදී හා අනෙකුත් ඉදි කිරීම්වලදී යොදා ගැනෙන තාර හා ඒ ආශ්‍රිත නිෂ්පාදන උසස් ගුණාත්මකභාවයක් සහිතව නිපදවීමට අප නිරන්තරයෙන්ම ඇප කැප වනවා." සමාගමේ සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ මහේෂ් විජේරත්න මහතා පැවසීය. සංවර්ධන ක්ෂේත්‍රයේ අවශ්‍යතා සැපිරීමේ අරමුණින් 2006දී ඇරඹි බිටුලින්ක් ඉමල්ෂන් සමාගම මං මාවත් තැනීමේදී යොදා ගන්නා තාර හා ඒ ආශ්‍රිත නිෂ්පාදන රාශියක් නිෂ්පාදනය කර අලෙවි කරයි. වෙළෙඳපොළ අවශ්‍යතා ඉක්මවා යන දෛනික නිෂ්පාදන ධාරිතාවක් සමාගම සතුය. බ්‍රිතාන්‍යයෙන් ආනයනිත අධි තාක්ෂණික උපකරණ හා අමෙරිකාව, එක්සත් රාජධානිය, ස්වීඩනය හා ස්පාඤ්ඤය යන රටවලින් ගත් විශේෂඥ දැනුම ඇසුරෙන් තාර හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කරන බිටුලින්ක් ඉමල්ෂන් සමාගමට ISO 9001:2015 සහ ISO 14001: 2015 තත්ත්ව සහතික හිමි වී ඇත.

# Softlogic IT වෙත සම්මාන දෙකක්



ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම තොරතුරු තාක්ෂණ විසඳුම් සම්පාදකයකු වන සොෆ්ට්ලොජික් ඉන්ෆෝමේෂන් ටෙක්නොලජීස් (Softlogic Information Technologies) විසින් පසුගියදා අවසන් වූ ආසියානු නැඟී එන වෙළෙඳපොළ සඳහා වූ Dell හවුල්කාරීත්ව ව්‍යාපාර සමුළුවේදී සුවිශේෂී සම්මාන ද්විත්වයක් ජයග්‍රහණය කරනු ලැබීය. මේ සම්මාන උලෙළ මාර්ගගත ආකාරයට පසුගියදා පැවැත්වුණු අතර, එහිදී සොෆ්ට්ලොජික් IT විසින් Dell පාරිභෝගික විසඳුම් සඳහා හොඳම හවුල්කරුවාට හිමි සම්මානය සහ දත්ත මධ්‍යස්ථානය සහ ගණනය කිරීම් (Data Center and Compute) සඳහා හොඳම හවුල්කරුවාට හිමි සම්මානය ජයග්‍රහණය කරන ලදි.

මේ ජයග්‍රහණය තුළින් සොෆ්ට්ලොජික් IT විසින් දේශීය වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කර ඇති Mouse සිට Cloud දක්වා වූ අද්විතීය තාක්ෂණික විසඳුම් සම්පාදකයා ලෙස වෙළෙඳපොළ තුළ සිය ආධිපත්‍ය සහ අඛණ්ඩ පාරිභෝගික විශ්වාසය නැවතත් තහවුරු කිරීමට සමත් විය.

දශක දෙකකට වැඩි කාලයක සිට Dell ශ්‍රී ලංකා සඳහා වූ එකම ටයිටේනියම් මට්ටමේ හවුල්කරු ලෙස සොෆ්ට්ලොජික් විසින් දේශීය තොරතුරු තාක්ෂණ අවශ්‍යතා මැනවින් හඳුනා ගනිමින් වෙනස්වන වෙළෙඳපොළ අවශ්‍යතා රැසක් සඳහා විවිධ තාක්ෂණික විසඳුම් ඉදිරිපත් කරමින් සිටියි. සොෆ්ට්ලොජික් IT සිය Dell නිෂ්පාදන සම්බන්ධයෙන් දිවයින පුරා පාරිභෝගික විශ්වාසය සුරකමින් ඉතා විශ්වාසදායක සේවා ගිවිසුම් සහ අලෙවියෙන් පසු විශිෂ්ට සේවාව, වගකීම් කාලය ඇතුළු විවිධ සේවා රැසක් සපයමින් තරගකාරී වෙළෙඳපොළේ ඉදිරියෙන්ම සිටින ආයතනයක්ද වේ.

Dell හවුල්කාරීත්ව ව්‍යාපාර සමුළුව වාර්ෂිකව පැවැත්වෙන අතර, එහිදී Dellහි ඉහළ කාර්ය සාධනයට මුල් වූ හවුල්කරුවන් ඇගයීමට ලක් කරයි.

2021 අප්‍රේල් 16 සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.